BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# 2011

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# 2011

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

BOI

SRI LANKA

# පටුන


**සභාපතිතුමාගේ පණිවුඩය** 4

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම** 6

- පරමාර්ථ හා කාර්ය භාරය 6
- දැක්ම සහ මෙහෙවර 7
- අධ්‍යක්ෂ මණ්ඩලය 8
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 9

**සමාලෝචනය** 10

- ප්‍රධාන සිදුවීම් සහ සුවිශේෂී අවස්ථා 10
- ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය 11
- ප්‍රවර්ධන දූත මෙහෙවර 13
- ආයෝජන කාර්ය සාධනය 17

**දෙපාර්තමේන්තු කාර්ය සාධනය** 20

- අධ්‍යක්ෂ ජෙනරාල් ලේකම් කාර්යාලය 20
- ආයෝජන ප්‍රවර්ධනය 20
- ආයෝජන සේවා 26
- නෛතික සහය 28
- යටිතල පහසුකම් සංවර්ධනය හා ප්‍රාදේශීය කලාප මෙහෙයුම් 28
- පරිසර කළමනාකරණය 29
- ඉංජිනේරු අනුමැතීන් හා විශේෂ ව්‍යාපෘති 30
- කාර්මික සබඳතා 32
- මාධ්‍ය සහ ප්‍රචාරණය 33
- පරිපාලනය 34
- මානව සම්පත් කළමනාකරණය 34
- පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශනය 39
- තොරතුරු තාක්ෂණය 39
- අභ්‍යන්තර විගණනය 40

**මූල්‍ය සමාලෝචනය** 41

- මෙහෙයුම් ආදායම 42
- මෙහෙයුම් වියදම 42
- ප්‍රාග්ධන වියදම 43
- 2011 දෙසැ 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 44
- 2011 දෙසැ. 31 දින අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 45
- 2011 දෙසැ. 31 දින අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 46
- මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් 47

**විගණන වාර්තා** 53

- විගණකාධිපතිවරයාගේ වාර්තාව 55
- විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සඳහන් නිරීක්ෂණයන් පිළිබඳ අදහස් දැක්වීම 79
- විගණන කමිටු වාර්තාව 98

**පරිශිෂ්ඨයන්** 99

- කාර්ය සාධනයේ සුවිශේෂී අවස්ථා 100
- ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘතීන් පිළිබඳ සාරාංශය 103
- ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘතීන් පිළිබඳ සාරාංශය 104

**ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය** 105

# සභාපතිතුමාගේ පණිවුඩය



2011 වසර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ඉතිහාසයේ එක් වැදගත් සන්ධිස්ථානයක් සටහන් කරනුයේ, එම වර්ෂය තුළදී ඇමරිකානු ඩොලර් බිලියන එකකට අධික ප්‍රමාණයක සෘජු විදේශ ආයෝජනයන් මෙරටට ගලා ආ හෙයිනි. මෙම ආයෝජන ප්‍රමාණය 2010 වසරේ ලැබුණු ආයෝජන ප්‍රමාණය සමග සංසන්දනාත්මකව බැලීමේ දී 107% ක වර්ධනයක් පිළිබිඹු කරන අතර, ආයෝජනයන් සඳහා ගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව කෙරෙහි විදේශ රාජ්‍යයන් තබා ඇති විශ්වාසය ද පිළිබිඹු කරයි.

සෘජු විදේශීය ආයෝජනයන් වශයෙන් ලැබුණු ඉහත සඳහන් ආයෝජනයන් ගෙන් විශාල ප්‍රමාණයක් ආසියානු රාජ්‍යයන් විසින් සපයනු ලැබීය. එම රාජ්‍යයයන්, ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජනයන් සපයන රටවල් අතර ප්‍රමුඛත්වයක් උසුලයි.

මෙසේ විශාල ප්‍රමාණයෙන් සෘජු ආයෝජනයන් ලබාදීමට බොහෝ කරුණු හේතු සාධක වූ අතර, ඒ සඳහා ආයෝජන මණ්ඩලයේ ප්‍රයත්නයන්ද, අනිකුත් සම්බන්ධිත රාජ්‍ය ආයතනවල ප්‍රයත්නයන්ද, විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ ප්‍රයත්නයන් හා කැපවීම ද, හේතු සාධක විය.

මෙසේ ආයෝජනය කරන ලද ප්‍රධාන ක්ෂේත්‍රයන් වූයේ ඇ.ඩො. මිලියන 322 ක් ආයෝජනය කරනු ලැබූ නිෂ්පාදන ක්ෂේත්‍රයත්, (මෙම ක්ෂේත්‍රයෙහි 2010 වසරේදී ඇ. ඩො. මිලියන 160 ක් පමණ ආයෝජනය කරන ලදී.) ඇ.ඩො. මිලියන 726 ක් ආයෝජනය කරනු ලැබූ සේවා සහ යටිතල පහසුකම් ක්ෂේත්‍රයත්, යන ක්ෂේත්‍රයන්ය. (2010 වසරේ මෙම ක්ෂේත්‍රයේ ඇ. ඩො. මිලියන 350 ක් ආයෝජනය කරනු ලැබ තිබුණි)

ඉහත දක්වන ලද ආයෝජන ප්‍රමාණයන් මගින් 2011 වසරේදී ලබාගන්නා ලද සෘජු විදේශ ආයෝජනවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන අතර, 2011 වර්ෂය විශේෂයෙන් ම වැදගත් වනුයේ එය සෘජු විදේශීය ආයෝජන සම්බන්ධයෙන් තවත් විශ්වාසනීය අංශයන් කීපයක් හඳුනා ගැනීමට හැකිවූ මෙන්ම, එම අංශයන් ප්‍රවර්ධනය කිරීමට හැකිවූ වර්ෂයක් නිසාය.

ඉහත කී ක්ෂේත්‍රයන් රටේ ජාතික සංවර්ධන අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට හේතු වූ අතර, කෘෂිකර්මය සහ කෘෂි පිරිසැකසුම් කර්මාන්ත, නිෂ්පාදන කර්මාන්ත, සංචාරක, අධ්‍යාපන සහ නිපුණතා සංවර්ධන, තොරතුරු තාක්ෂණ, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශවයන්ගෙන් ලබාගැනීම සහ යටිතල පහසුකම් යන ක්ෂේත්‍රයන් ඒ අතර විය.

ශ්‍රී ලංකාවේ ආර්ථික සම්බන්ධතා ශක්තිමත් කිරීම අරමුණු කොට ගෙන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආසියානු මිත්‍ර රටවල් සමග ද්වි පාර්ශවීය ප්‍රවර්ධන සහ ආරක්ෂක ගිවිසුම්වලට එළඹීමට ක්‍රියා කරනු ලබයි. ශ්‍රී ලංකාව ආයෝජනයන් සඳහා වඩා යහපත් දේශයක් බවට පත් කිරීම මෙම ක්‍රියාදාමයේ පරමාර්ථය වන්නේ ය.

සංසන්දනාත්මකව අවධානය යොමු කිරීමේ දී, ශ්‍රී ලංකාව සතු ආයෝජන හිතකර පරිසරය, ස්වාධීන ආයෝජන ප්‍රතිපත්ති, කේන්ද්‍රීය පිහිටීම, ප්‍රමාණවත් යටිතල පහසුකම්, ඵලදායී ශ්‍රම බලකාය, ශක්තිමත් මෙන්ම ගැලපෙන බැංකු සහ රක්ෂණ ආයතන පද්ධතිය, ආයෝජන ආකර්ෂණය කර ගැනීමේ දී ශ්‍රී ලංකාවට වැදගත් වන සාධකයන් වෙති.

ශ්‍රී ලංකාවේ පිහිටීම, එනම් ප්‍රධාන නැව් මාර්ග සංධිගත වී ඇති ස්ථානයක පිහිටීම ආයෝජනයන් ආකර්ශණය කර ගැනීමේ දී වාසියට හරවා ගත හැකි කරුණකි. ඒ නිසා ශ්‍රී ලංකාව පිහිටි කලාපය තුළ එය ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්වීමට හැකිවන අයුරින් ආයෝජන ඉවහල් කර ගත යුතු ය. යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ආයෝජන යෙදවීම මෙහිදී අවශ්‍ය වන අතර, එම ආයෝජන රටේ මහාමාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම, වරායවල් සහ දේශීය සහ ජාත්‍යන්තර ගුවන් තොටුපලවල් පිහිටුවීම හා වැඩි දියුණු කිරීම ආදිය සඳහා යෙදවිය යුතු ය.

ශ්‍රී ලංකාව ප්‍රගතිය කරා යන, වාණිජ්‍ය ව්‍යාපාර ඇරඹීමට හිතකර රටක් ලෙස ප්‍රත්‍යක්ෂ කිරීම වැදගත් වේ. 2011 දී ශ්‍රී ලංකාව ජගත් තරගකාරී දර්ශකයෙන් 62 වන ස්ථානයේ සිට 52 වන ස්ථානය දක්වා උසස් විය. ඍජු විදේශ ආයෝජන වැඩි වැඩියෙන් ලබාගැනීමට අවශ්‍ය නම්, සැබැවින්ම මෙරට ආයෝජන සඳහා හිතකර දේශයක් බවට පත් කිරීම අවශ්‍ය වන හෙයින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි සහ අනිකුත් අදාල නියෝජිත ආයතනවලට අවශ්‍ය ප්‍රතිසංස්කරණය සිදුකොට පහසුකම් සැලසීමේ කාර්ය වැඩි දියුණු කළ යුතු ය.

ඇත්ත වශයෙන්ම දැනට ශ්‍රී ලංකාවේ සිටින ආයෝජකයන් නව ආයෝජනයන් රටට ගෙන්වා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගත හැකි හොඳම තානාපතීන් ලෙස සැලකිය හැකිය. ඒ නිසා ඔවුන්ව රට තුළ ක්‍රියාත්මක වන නීතිමය රාමුව යටතේ මැනවින් රැක ගැනීම තහවුරු කළ යුතුය. දැනටමත් මෙරට තුළ ආයෝජනයන් යොදවා ඇති ආයෝජකයින් තවදුරටත් ඔවුන්ගේ ව්‍යාපාර රට තුළ ව්‍යාප්ත කිරීම, ශ්‍රී ලංකාව ආයෝජනයන් සඳහා යහපත් ගමනාන්තයක් බවට පරිවර්තනයවී ඇති බවට පෙන්වන හොඳම සාක්ෂියකි.

ආයෝජනයන් අනුමත කිරීමේ ක්‍රියාවලියෙහි නිරත අනිකුත් රාජ්‍ය ආයතනයන් වන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා අනිකුත් බලධාරී ආයතන සතු සේවා එකම වහලක් යටට ගෙන ඒම (One-Stop-Shop Meetings) ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ගත් පියවර, 2011 වර්ෂයේ දී තරමක් දුරට සාර්ථක වී ඇති හෙයින් එහි සම්බන්ධීකරණ කටයුතු වඩා ඵලදායී අයුරින් ඉටු කිරීමට සමත් වී ඇත.

2010 මැයි මාසයේ සිට 2011 ජූනි මාසය දක්වා සභාපති / අධ්‍යක්ෂ ජනරාල් ලෙස ද, 2011 ජූලි සිට 2012 අප්‍රේල් දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයකු ලෙස ද, කටයුතු කළ ජේ. ඩී. බණ්ඩාරනායක මහතා විසින්, සිය සේවා කාලය තුළ මෙම සංවිධානය ඵලදායී මාවතක මෙහෙයවීම පිළිබඳව එතුමාට මෙම අවස්ථාවේදී ස්තුති වන්ත වෙමි. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන ඒෂන ද සිල්වා මහතා, සංජීව වික්‍රමනායක මහතා සහ අනුර ජයසිංහ යන මහත්වරුන් විසින් ලබාදෙන ලද සහයෝගයන්, ඉටුකළ මෙහෙයන් සම්බන්ධයෙන්ද, ව්‍යාපාර සංවර්ධන අමාත්‍යංශය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගුව යන ආයතන වලින් ආයෝජන මණ්ඩල නිරීක්ෂකයන් ලෙස සේවය කළ මහත්ම මහත්මීන්ට ද, අදාල ක්ෂේත්‍රයන්හි ලා ඔවුන් ඉටුකළ මෙහෙය හා ලබාදුන් සහයෝගය ද, වෙනුවෙන් ස්තුති කිරීමට කැමැත්තෙමි.

මාගේ පණිවුඩයේ ද, අවසානය වශයෙන් කිවයුත්තේ ඇ.ඩො. බිලියන එකකටත් වැඩි ඍජු විදේශීය ආයෝජන ලබාගැනීම මගින් ශ්‍රී ලංකාව ඇගේ පුරවැසියන් සඳහා ඉහළ වර්ධනයක් ද සෞභාග්‍යයක් ද උදා කරවන නව මාවතක් වෙත පිවිස සිටින බවයි. කරුණු මෙසේ හෙයින්, රටේ ආර්ථික සංවර්ධනය වේගවත් කරනු සඳහා, ඉහළ පරිමාණයෙන් ඍජු විදේශීය ආයෝජන ලබා ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ඇත.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මහ කොළඹ ආර්ථික කොමිසම යනුවෙන් නම් කොට, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස ශ්‍රී ලංකාවේ නම් කරන ලද ප්‍රදේශයන් තුළ කාර්මික සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා, සම්බන්ධීකරණ කටයුතු හා අවශ්‍ය පහසුකම් ඉටු කෙරෙන ප්‍රධාන රාජ්‍ය ආයතනය ලෙස, පනතක් මගින් 1978 දී ස්ථාපනය කරන ලදී. සංවර්ධනයේ මූලික ආදර්ශය වූයේ රජය විසින් සහන හා අනිකුත් පහසුකම් සලසා දෙනු ලැබූ නිශ්චිත ප්‍රදේශයන්හි අපනයන ප්‍රවර්ධන කලාප සැලසුම් ලකුණු කිරීමයි. ආරම්භයේ දී, කටුනායක හා බියගම යන ප්‍රදේශ වල එවැනි කලාප පිහිට වූ අතර, අනතුරුව වෙනත් ප්‍රදේශයන්හි එවැනි කලාප ප්‍රගතිය අනුව පිහිටවනු ලැබූ අතර, දැනට පිහිටුවා ඇති මුළු සංඛ්‍යාව 12 කි.

1992 වර්ෂයේදී, රටේ සම්පූර්ණ ප්‍රදේශයම ආවරණ වන අයුරින් මෙම මහ කොළඹ ආර්ථික කොමිසම පාර්ලිමේන්තුවෙහි සම්මත වූ පනතක් මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යැයි නම් කොට වෙනස් කරනු ලැබීය. එම පිහිටුවීමට පෙර මෙම ආයතනයේ බලධාරීත්වය, ඒ වන විට පිහිටුවා තිබූ කටුනායක, බියගම හා කොග්ගල යන පිරි සැකසුම් කලාප තුළ ලකුණු කර තිබුණු ප්‍රදේශ වලට පමණක් සීමා විය.

එතැන් සිට මුලින්ම කාර්මික අපනයන නිෂ්පාදන සඳහා, විදේශ හා දේශීය ආයෝජන යෙදවීම ප්‍රවර්ධනය කිරීමත්, සම්බන්ධීකරණය කිරීමත්, පහසුකරණය කිරීමත්, යන කටයුතු සඳහා වගකිවයුතු මූලික ආයතන තත්ත්වයෙහි සිට එහි වර්තමාන කාර්යභාරය, සේවා සහ යටිතල පහසුකම් අංශයන්හි ද ආයෝජන ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය හා පහසුකරණය යන කාර්යයන් දක්වා පරිණාමය වී තිබේ.

## අපේ පරමාර්ථ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ප්‍රමුඛ පරමාර්ථයන් අතර, මුළු රට පුරා ආර්ථික සංවර්ධනය ඇති කරලීම හා ශක්තිමත් කිරීම, දේශීය ආයෝජන හා සෘජු විදේශීය ආයෝජන දිරිමත් කිරීම, ප්‍රවර්ධනය විදේශ විනිමය ඉපැයීම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම හා අපනයන ඉපැයීම් වර්ධනය නව තාක්‍ෂණයන් ප්‍රවර්ධනය කිරීම හා ඒවා යොදා ගැනීම, නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම සහ ආයෝජනය ප්‍රවර්ධන කලාප පිහිටුවීම යන කාර්‍යයන් වන අතර, විශේෂයෙන්ම ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල සහභාගීත්වය ලබා ගනු ඇත.

## අපේ කාර්ය භාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට උපකාරී වෙමින් ආයෝජන ඉලක්ක සැපයීම සහ ආයෝජනයන් ආකර්ශණය කර ගැනීම සහ ජාතික වර්ධන ඉලක්ක වෙත ළඟා වීම සඳහා උදව් වෙමින් ලැබෙන සෘජු විදේශීය ආයෝජන මට්ටම් ප්‍රගතිගාමීව ඉහළ නැංවීම අපේ කාර්ය භාරය වන්නේ ය.

ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදන, යටිතල පහසුකම්, සංචාරක කර්මාන්තය, කෘෂිකර්මය, තොරතුරු තාක්‍ෂණය ආශ්‍රිත සේවා හෝ වෙනත් තෝරා ගත් අංශ හෝ යන අංශවල ආයෝජනයන් කිරීමට බලාපොරොත්තු වන ආයෝජකයන් සඳහා මුලින්ම ඔවුන් විසින් ඇමතිය යුතු ස්ථානය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ක්‍රියා කරයි. ඒ සඳහා ව්‍යාපෘති අයදුම්පත ඉදිරිපත් කිරීමට කලින් තොරතුරු හා උපදෙස් සපයනු අතර, අවශ්‍ය අවස්ථාවලදී ආයෝජන මණ්ඩලය විසින් අනිකුත් ආයතනයන් විසින් ලබාදෙන අනුමැතීන් සම්බන්ධීකරණය කිරීමේ කටයුතු සිදුකරනු ලැබේ.

එක් එක් අංශයක් වෙනුවෙන් ලැබුණු ආයෝජන අයදුම්පත් සඳහා දිරි ගැන්වීම් මත දෙනු ලබන සහන අනුමත කිරීම් සහ අමුද්‍රව්‍ය සහ අනිකුත් සංරචකයන් මත ලබාදෙන බදු සහනයන් ද, විදේශිකයන් විසින් ඇරිය යුතු තනතුරු සඳහා වීසා නිකුත් කිරීම පිණිස ආගමන බලධාරීන් වෙත නිර්දේශ කිරීම ද, යන කරුණු සඳහා එම ඉල්ලුම්පත් ආයෝජන මණ්ඩලය විසින් ඇගයීමකට ලක්කරනු ලැබේ.

ව්‍යාපෘතියක ආරම්භයේ සිට එය ක්‍රියාත්මක කිරීම දක්වා ඒ සඳහා ආනයන හෝ අපනයන පිළිබඳ කටයුතු වලට සහභාගී වෙමින්, එම කටයුතු පහසුකරණය කරමින්, එම ව්‍යාපෘතීන් සම්බන්ධ මෙහෙයුම් සාර්ථක අයුරින් ඉටු කිරීමට, ප්‍රාග්ධන භාණ්ඩයන් සහ අමුද්‍රව්‍යය ආනයනය කිරීම සහ නිමිභාණ්ඩ අපනයනය කිරීම සඳහා රේගු නිෂ්කාශනයන් ලබාදීම ද, යන ව්‍යාපෘතියට සම්බන්ධ ක්‍රියාවලි චක්‍රය පුරාම ආයෝජන මණ්ඩලය ආයෝජකයන්ට උපකාර කරනු ලැබේ.

ආයෝජන ප්‍රවර්ධන කලාපවල යටිතල පහසුකම් සැපයීම මගින්, ආයෝජකයන් වෙත ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා සුදුසු භූමි භාගයක් ලබාදීම අරමුණු කොට, ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන ප්‍රවර්ධන කලාප ඉදිකිරීම සඳහා මුදල් යොදවනු ලැබේ. එමගින් ආයෝජකයන්ට සිය ආයෝජන සියල්ල කඩිනමින් යෙදවීමට සහ /හෝ අපනයන ඉපැයීම් කඩිනමින් ලබාගැනීම සඳහා පහසුකසම් සැලසේ.

# දැක්ම


ආර්ථික සමෘද්ධිය තුලින් ශ්‍රී ලාංකීක සියළු
ජනතාවගේ සුභ සාධනය සහතික කිරීම



# මෙහෙවර

රජයේ මුදල් හා පිස්කල් ප්‍රතිපත්තීන්ට ගැළපෙන පරිදි,
ඉලක්කගත අංශයන්හි දේශීය හා විදේශීය ආයෝජනයන්
අත්පත් කර ගැනීම තුළින් ජාතික සංවර්ධනය ළඟා කර ගැනීම

# අධ්‍යක්‍ෂ මණ්ඩලය



එම්. එම්. සී. ෆර්ඩිනැන්ඩෝ මහතා- සභාපති/අධ්‍යක්‍ෂ ජනරාල්



ජේ. ඩී. බණ්ඩාරනායක මහතා - සාමාජික



ඊශන ද සිල්වා මහතා - සාමාජික



සංජීව වික්‍රමනායක මහතා - සාමාජික



අනුර ජයසිංහ මහතා - සාමාජික

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

| | | |
|---|---|---|
| එම්. එම්. සී. ෆර්ඩිනැන්ඩෝ මහතා | - | සභාපති/අධ්‍යක්ෂ ජනරාල් |
| ඒ. එම්. සී. කුලසේකර මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| ආචාර්ය අයි. එන්. සමරප්පුලි මහතා | - | විධායක අධ්‍යක්ෂ (පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන) |
| ආර්. එම්. කරුණාරත්න මහතා | - | විධායක අධ්‍යක්ෂ (මෙහෙයුම්) |
| ශිවාන් ද සිල්වා මහතා | - | විධායක අධ්‍යක්ෂ (ප්‍රවර්ධන හා මහා පරිමාණ ව්‍යාපෘති) |
| සී. පී. මතායස් මිය | - | විධායක අධ්‍යක්ෂ (මූල්‍ය සහ රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ඒකකයේ ප්‍රධානි) |
| ඩී. පී. ආරියසිංහ මහතා | - | විධායක අධ්‍යක්ෂ (ආයෝජන ප්‍රවර්ධන) |
| එස්. බී. එෆ්. ද සිල්වා මහතා | - | විධායක අධ්‍යක්ෂ (තාක්ෂණික සේවා) |
| ඩබ්. ඒ. එච්. ආර්. ප්‍රනාන්දු මහතා | - | විධායක අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති) |
| පී. කේ. වල්ගම මිය | - | විධායක අධ්‍යක්ෂ (නීති) |
| වයි. ජී. රාජපක්ෂ මිය | - | වැ.බ. විධායක අධ්‍යක්ෂ (ආයෝජන) |
| කේ. දහනායක මහතා | - | වැ.බ. විධායක අධ්‍යක්ෂ (පිරිස් හා පරිපාලන) |

# ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂවරු

| | | |
|---|---|---|
| කේ. පි. වී. ඩී. ප්‍රනාන්දු මහතා | - | අධ්‍යක්ෂ (මහා පරිමාණ ව්‍යාපෘති ඒකකය) |
| පී. ජේ. පනාපිටිය මහතා | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති) |
| යූ. සිරිගම්පොළ මහතා | - | අධ්‍යක්ෂ (කලාප) කටුනායක අපනයන සැකසුම් කලාපය |
| ඩී. එස්. සමරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (මාධ්‍ය) |
| එන්. වීරසේකර මිය | - | අධ්‍යක්ෂ (ආයෝජන සේවා) |
| සී. පී. මලල්ගොඩ මිය | - | අධ්‍යක්ෂ (පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන) |
| එච්. එම්. ජයසුන්දර මහතා | - | අධ්‍යක්ෂ (මධ්‍යම ප්‍රාදේශීය කාර්යාලය) |
| යූ. ජේ. වීරසිංහ මහතා | - | අධ්‍යක්ෂ (වයඹ ප්‍රාදේශීය කාර්යාලය) |
| එම්. ඒ. එස්. පෙරේරා මිය | - | අධ්‍යක්ෂ (පරිසර) |
| එම්. කේ ගරුසිංහ මහතා | - | අධ්‍යක්ෂ (නව කලාප) |
| ආර්. එම්. වීරකෝන් මිය | - | අධ්‍යක්ෂ (ලේකම් කාර්යාලය) |
| එන්. ද සිල්වා මෙනෙවිය | - | අධ්‍යක්ෂ (ආංශීය සමූහය 2 අධ්‍යාපනික අංශය) |
| ඩී. එම්. ආර්. ලියනගේ මිය | - | අධ්‍යක්ෂ (පරිපාලන) |
| ජේ. පී. සී. ජයලත් මහතා | - | අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) |
| එස්. පි. ද එස්. මුතුකුමාරණ මෙනෙවිය | - | අධ්‍යක්ෂ (මුදල්) |
| ඒ. කේ. ජයසිංහ මහතා | - | අධ්‍යක්ෂ (සීතාවක අපනයන සැකසුම් කලාපය) |
| එම්. එස්. සී. සමරකෝන් මිය | - | අධ්‍යක්ෂ (නීති - රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර ඒකකය) |
| ඩබ්ලිව්. ඒ. එෆ්. ජයසිරි මහතා | - | අධ්‍යක්ෂ (කාර්මික සම්බන්ධතා) |
| එම්. කේ. ඩී. ලෝරන්ස් මහතා | - | අධ්‍යක්ෂ (කලාප) බියගම අපනයන සැකසුම් කලාපය |
| ජේ. ගුණසේකර මහතා | - | වැ.බ. අධ්‍යක්ෂ (කොග්ගල අපනයන සැකසුම් කලාපය) |
| බී. ඒ. පෙරේරා මහතා | - | වැ.බ. අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ සහ ක්‍රමෝපායන සැලසුම්) |

# සමාලෝචනය

## ප්‍රධාන සිදුවීම් සහ සුවිශේෂ අවස්ථා

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, එහි ඉතිහාසයේ ප්‍රථම වරට ඇ. ඩො. බිලියන එකකටත් වැඩි සෘජු විදේශීය ආයෝජන ලබා ගත්තේ 2011 වර්ෂයේ දීය. එයින් 43%ක යටිතල පහසුකම් අංශයෙන්ද, 30%ක් භාණ්ඩ නිෂ්පාදන අංශයෙන් ද, 25% ක් සේවා සැපයීම් අංශයෙන් ද, 2%ක් කෘෂිකාර්මික අංශයෙන්ද, ලෙසිනි.

- 2011 වසර්ෂයේ දී ආයෝජන මණ්ඩල ව්‍යවසායන් විසින් උත්පාදනය කරනු ලැබූ අපනයනයන්ගේ අගය ඇ.ඩො. මිලියන 6386 ක් වූ අතර, එය 2010 වසර හා සැසඳීමේ දී 22% ක වර්ධනයක් විය. 2011 වසරේදී ශ්‍රී ලංකාව සිදුකළ සමස්ත අපනයන ප්‍රමාණයෙන් වැඩි කොටසකින් එය සමන්විත වේ.

- ලෝක ආර්ථික සංසදය සහ ලෝක බැංකුව විසින් පලකරනු ලැබූ 2012 ව්‍යාපාර පහසුවෙන් සිදුකරදීම පිළිබඳ වාර්තාවේ සඳහන් ආකාරයට ගෝලීය තරගකාරීත්වය දර්ශකයේ ශ්‍රී ලංකාව 98 වැනි ස්ථානයේ සිට 89 වැනි ස්ථානය දක්වා ස්ථාන නවයකින් (9) ඉහළ ගොස් ඇත. මෙම ජයග්‍රහණයන් උදාකර ගත්තේ තෝරාගත් දර්ශකයන් කිහිපයක් ආශ්‍රිතව ව්‍යවසායකයන් සඳහා වඩා යහපත් පරිසරයක් ගොඩනැගීම සඳහා ක්‍රමවේදයන් විධිමත් කළ හෙයිනි.

- එක වහලක් යට සියළු විසඳුම් ලබාදීමේ රැස්වීම් (One-Stop Shop-Meetings) මාසිකව පැවැත්වූ අතර, එමගින් රේඛීය අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වඩා සමීපව ක්‍රියාකරමින් සිය ව්‍යාපෘති ඇරඹීම සහ මෙහෙයවීම පිළිබඳව ව්‍යවසායකයින් මුහුණ පෑ බාධක ඉවත් කිරීමට සමත් විය.

- කෙයාන් ලංකා පුද්ගලික සමාගම විසින් ශ්‍රී ලංකාවේ සිදුකරන ලද ඛනිජ තෙල් ගවේෂණ කටයුතු සම්බන්ධ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති, දකුණු බහාලුම් පර්යන්තය සංවර්ධනය කරණු සඳහා සී/ස කලම්බු ඉන්ටර් නැෂනල් කන්ටේනර් ටර්මිනල් සමාගම විසින් සිදු කරන ලද සංවර්ධන කටයුතු සහ විවිධ කාර්ය මධ්‍යස්ථානයක් ලෙස සුඛෝපභෝගී හෝටලයක් ඉදිකිරීමට ෂැන්ග්‍රිලා හෝටල් ලංකා සමාගම සතු ව්‍යාපෘතිය සඳහා උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ රටේ භූමි දර්ශකය වෙනස් කරන ව්‍යාපෘති ඇරඹීමත්, එමගින් ශ්‍රී ලංකාවට ආර්ථික සහ සමාජීය ප්‍රතිලාභ සැලසීමෙත් අනුමැතිය ලබා දුනි.

- මාස් ලංකා සම්මාන පිරිනැමීමේ උත්සවයේ දී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ඒ. එම්. සී. කුලසේකර මහතා විසින් වාණිජ සහ කර්මාන්ත සංවර්ධනය සඳහා ඉටුකරන ලද සේවය වෙනුවෙන් ද, රට තුළ ආයෝජන ප්‍රවර්ධනයේ දී සහ පහසුකරණය කිරීමේ සේවාවන්හිදී ඔහු විසින් ලබාදෙන ලද සහයෝගය පිළිබඳව ද ගරු අග්‍රාමාත්‍ය දි. මු. ජයරත්න මැතිතුමාගේ පැසසුමට භාජනය විය.

# ශ්‍රී ලංකාවේ ආයෝජන ස්වරූපය

- ප්‍රථම වතාවට ඇ.ඩො. බිලියන එකකට අධික ආයෝජන ප්‍රමාණයක් 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාව වෙත ආකර්ශනය කරගනු ලැබීය. එය 2010 වර්ෂයේ දී ආකර්ෂණය කරගනු ලැබූ. ඇ. ඩො. මිලියන 516ට සාපේක්ෂව 107% ක වර්ධනයක් විය.

*2011 වර්ෂයේ දී සෘජු විදේශීය ආයෝජනය ඇ. ඩො. බිලියන එක ඉක්මවිය.*

- නිෂ්පාදන අංශයෙහි යොදවනු ලැබූ ආයෝජන ප්‍රමාණය 2011 වර්ෂයේදී ඇ. ඩො. මිලියන 322 ක් වූ අතර, එය 2010 දී එම අංශයේ යොදවනු ලැබූ ආයෝජන ප්‍රමාණය වන ඇ.ඩො. මිලියන 160ට සාපේක්ෂව 101% වර්ධනයකි.

- 2011 වර්ෂයේදී, සේවා/යටිතල පහසුකම් අංශයන්හි යොදවනු ලැබූ ආයෝජන ප්‍රමාණය ඇ. ඩො. මිලියන 726 ක් වූ අතර, එය 2010 වර්ෂයේදී එම අංශයන් වෙත යොදවනු ලැබූ ආයෝජනය වූ ඇ. ඩො. මිලියන 350ට සාපේක්ෂව 107% වර්ධනයක් විය.

- අනාගත සෘජු විදේශීය ආයෝජන ඉලක්කයන් සපුරා ගනු සඳහා ද ජාතික සංවර්ධන පරමාර්ථ උදාකර ගැනීම සඳහා ද, රජයේ ප්‍රතිපත්තීන් අනුව යමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ප්‍රමුඛ අංශයන් හඳුනාගනු ලැබ ඇත. සමහර නිශ්චිත අංශයන් කෙරෙහි, ආයෝජනයන්ට සුදුසු කලාපයක් ලෙස ශ්‍රී ලංකාව දිගටම පවත්වාගෙන යෑම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පියවර කීපයක් අනුගමය කරනු ලැබීය. කෘෂිකර්ම, කෘෂි කාර්මික පිරිසැකසුම්, නිෂ්පාදන, සංචාරක, තොරතුරු තාක්‍ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර අංශයන්ගෙන් ලබාගැනීම, අධ්‍යාපනය, නිපුණතා සංවර්ධන සහ යටිතල පහසුකම් යන අංශ එසේ හඳුනාගනු ලැබූ අංශයන් වේ.

*ජාතික පරමාර්ථ සහ ප්‍රමුඛ අංශ*

- විශාල ප්‍රමාණයේ නව වෙළෙඳපොල හඳුනා ගැනීම සහ අමුද්‍රව්‍ය සැපයුම් වෙත අවතීර්ණ වීම අරමුණු කොටගෙන විදේශයන්හි ව්‍යාපාර කටයුතු ඇරඹීම සඳහා වැඩි ප්‍රවණතාවක් ශ්‍රී ලාංකීක සමාගම් අතර ඇති වෙමින් පවතී. කලාපීය සහ ගෝලීය වශයෙන් සැපයුම් ක්‍රියාදාමයන්හි ශ්‍රී ලංකා සමාගම් විශාල අයුරින් ඒකාබද්ධ වීම සහ එම තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන යෑම මෙමගින් අපේක්ෂා කරනු ලැබේ. මේ අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විදේශයන්හි ආයෝජන ප්‍රවර්ධනය කළ යුත්තේ ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පැහැදිළි ප්‍රතිපත්තියක අවශ්‍යතාව පැන නැගී ඇත.

*විදේශයන්හි ආයෝජනය කිරීම*

- ශ්‍රී ලංකාව ආසියානු කලාපීය රාජ්‍යයන් අතර ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්‍ෂණ, ද්වීපාර්ශවීය ගිවිසුම් වලට එළඹීම සඳහා සිය සාකච්ඡා දිගටම පවත්වාගෙන යනු ලැබීය.

*ද්වී පාර්ශවීය ආයෝජන සහ ආරක්‍ෂණ ගිවිසුම්*

- ශ්‍රී ලංකාව සතු ආයෝජන හිතකර පරිසරය ද, නිදහස් ආයෝජන ප්‍රතිපත්තීන් ද, මධ්‍යගත පිහිටීම ද, ප්‍රමාණවත් යටිතල පහසුකම් ද ඵලදායී ශ්‍රම හමුදාව ද, ශක්තිමත් පහසු කාර්යක්‍ෂම බැංකු සහ රක්‍ෂණ සමාගම් පද්ධතිය ද නිසා සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමේ හැකියාව ශ්‍රී ලංකාව සතුව පවතී.

*ශ්‍රී ලංකාව තරගකාරී ආයෝජන ගමනාන්තයකි*

- මංමාවත්. නාවික, ගුවන්තොටුපොළ සහ සංනිවේදන පහසුකම් වැනි අංශ අඛණ්ඩව වර්ධනය කර පවත්වාගෙන යමින් ශ්‍රී ලංකා රජය විසින් සැපයුනු කඩිනම් ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාව ආයෝජන හිතකර කලාපයක් බවට පත් කිරීමට සමත්වී තිබේ.

*කඩිනම් ක්‍රියාමාර්ග*

- එයට අමතරව, දේශීය ආයෝජන ක්‍රියාකාරීව වර්ධනය කිරීම සහ ව්‍යාපාරික සම්බන්ධතා දියුණු කිරීම වෙනුවෙන් යෙදවෙන දූත මණ්ඩල ගමන් සඳහා පෞද්ගලික අංශය වෙත ආරාධනා කරමින් රජය අඛණ්ඩ ක්‍රියාදාමයක නිරත විය.

*ගෝලීය තරගකාරීත්ව ස්ථානගත දර්ශකයේ ස්ථාන 10 ක් ඉහළට යෑම*

- ලෝක ආර්ථික සංසදය විසින් (2011-2012) සම්පාදිත ව්‍යාපාර තරගකාරිත්ව දර්ශකය අනුව, ශ්‍රී ලංකාව 62 වැනි ස්ථානයේ සිට 52 වැනි ස්ථානය දිනා ගැනීම (රටවල් 142 ක සහභාගීත්වයෙන්) ස්ථාන 10ක් ඉක්මවීම, ලබාගත් මහඟු ජයග්‍රහණයක් විය. (2009 වර්ෂයේ දී ස්ථානගත කිරීම් වාර්ථා අනුව) ශ්‍රී ලංකාව 79 ස්ථානයේ සිට ස්ථාන 27 ක් පසුකරමින් 52 වැනි ස්ථානය දක්වා 2011 වන විට ඉහල නැග තිබුණි.

- ඉහත තරගකාරීත්වය මැනීම සඳහා රටක පවතින ආයතන පද්ධතිය ද, ඵලදායීතාවය ගෙන එන ප්‍රතිපත්ති සහ සාධකයන් යනුවෙන් අර්ථ නිරූපණය වෙයි. ආයෝජනයෙන් ලැබෙන ලාභ රටක වර්ධනයේ ශක්‍යතාව පෙන්නුම් කරයි.

*ව්‍යාපාර ඇරඹීමේ ස්ථානගත කිරීම් වලින් 89 වැනි ස්ථානයට උසස් කරන ලද්දේය.*

- 2011 වසරේදී ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන විසින් කරනු ලැබූ ඇගයීමකට අනුව, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ දර්ශකය අනුව ශ්‍රේණිගත කිරීමකදී, ශ්‍රී ලංකාව රටවල් 183 ක් අතරින් 89 වැනි ස්ථානය දිනාගත්තේය. ඉදිකිරීම් අවසරයන් ලබාදීම ආයෝජකයින් ආරක්‍ෂා කිරීම සහ දේශ සීමා අතර වෙළඳාම සහ විශේෂ අංශයන්හි විශාල වර්ධනයක් උදා කර ගන්නා ලදී. දේපළ ලියාපදිංචි කිරීම, ණය ලබා ව්‍යාපාරයක් ඇරඹීම වැනි වැඩි දුරටත් දියුණු කළහැකි ක්ෂේත්‍රයන් තවත් තිබේ.

*ප්‍රති ආයෝජනයන්*

- ශ්‍රී ලංකාවෙහි ක්‍රියාත්මක වන විදේශීය සමාගම් ශ්‍රී ලංකාව කෙරෙහි විශ්වාසය තහවුරු කර ගැනීම පැහැදිලි වන්නේ එම සමාගම් විසින්, ශ්‍රී ලංකාව ඔවුන්ගේ ආයෝජන සඳහා යහපත් ගමනාන්තයක් සේ සලකා සිය සමාගම් ව්‍යාප්ත කිරිමත්, වෙනත් අංශයන් ආවරණය වන සේ ඒවා විවිධාංගීකරණය කිරීමත් මගින් ප්‍රති ආයෝජනයන් අඛණ්ඩව යෙදවීම තුළිනි.

*වඩා හොඳ සම්බන්ධීකරණයක්*

- ශ්‍රී ලංකා ආර්ථිකය සඳහා සෘජු විදේශීය ආයෝජනයන්ට නිසි වැදගත්කම දෙන අතරම, ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛතාවය හිමිවූයේ අනිකුත් රේඛීය අමාත්‍යාංශයන් සමග ද, පෞද්ගලික අංශය සමග ද, සමීපව ක්‍රියා කරමින් මෙරට තුළ ව්‍යාපාර තරගකාරීත්වය සම්බන්ධයෙන් හිතකර පරිසරයක් ගොඩනැගීමත්, එසේ ගොඩනැගීමෙන් ශ්‍රී ලංකාව තුළ පවත්නා ව්‍යාපාරික හිතකාමී පරිසරය තවදුරටත් වර්ධනය කිරීමත් සඳහා ය.

*විවිධ සේවා එක වහළක් යටට ගෙන ඒම (One-Stop-Shop)*

- සංචාරක අංශයේ ආයෝජන ප්‍රවර්ධනය අරමුණු කොට සියළු විසඳුම් එක වහලක් යටතට ගෙන ඒම (One-Stop-Shop) යන සංකල්පය හඳුන්වා දෙනු ලැබීය. එම මධ්‍යස්ථානය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරි පරිශ්‍රයේ පිහිටුවා ඇති අතර, ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව, වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, පළාත් සහ ප්‍රාදේශීය අධිකාරීන් හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතන වල සහභාගීත්වයෙන් එම මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙයි.

- වාණිජ මෙහෙයුම් ඇරඹීමට ඇති ව්‍යාපෘතීන් සහ දැනටමත් වාණිජ මෙහෙයුම් අරඹා ඇති ව්‍යාපෘතීන් වශයෙන් වෙනස් තලයන් දෙකකට අයත් ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් ද, මෙම සියළු විසඳුම් එක වහලක් යටතට ගෙන ඒමේ සංකල්පය යළි හඳුන්වා දීම මගින් එම ව්‍යාපෘති තල දෙකෙහිම පවතින ගැටළු නිරාකරණය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කාර්යක්‍ෂමව සිදුකරයි.

# ප්‍රවර්ධන දූත මෙහෙවර

සමාලෝචිත වර්ෂය තුළදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, මෙරටට පැමිණි දූත මණ්ඩල 11 ක් පිළිගැනීම සහ පහසුකම් සැපයීම යන කාර්යයන්ට ද, මෙරටින් විදේශයන් වෙත යවන ලද දූත මණ්ඩල 3 කට ද, සහභාගී විය.

දේශීය වාණිජ මණ්ඩල සහ වෙළඳ සංගම් අතර මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ ප්‍රධාන වාණිජ දූත මණ්ඩල අතර හඳුනාගත් ප්‍රධාන අංශ තුළ සහසම්බන්ධතාව නගාලීම සඳහා ය.

### මෙරටට පැමිණි දූත මණ්ඩල

| රාජ්‍යයන් | වැඩසටහන |
|---|---|
| තායිලන්තය | ශ්‍රී ලංකාවේ දේශීය ඉදිකිරීම් සමාගම් සහ ශ්‍රී ලංකා ඉදිකිරීමේ කර්මාන්ත මණ්ඩලයේ සහභාගීත්වයෙන් යුතුව, තායි වාණිජ සංවිධානයේ (Thai Trade Organiation) සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මෙරටට පැමිණි සාමාජිකයින් 40 ගෙන් යුත් දූත මණ්ඩලය අතර සාකච්ඡාවක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දී පවත්වනු ලැබීය. ශ්‍රී ලංකා සහ තායිලන්ත වාස්තු විද්‍යාඥ සහ ඉංජිනේරු සමාගම් සමග අවබෝධතා ගිවිසුම් දෙකකට එළඹීමට ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සලසන ලදී. |
| සිංගප්පූරුව | සිංගප්පූරුවේ Banyan Tree Group වෙතින් පැමිණි දූත පිරිසක් සංචාරක කර්මාන්තයේ ඇති ආයෝජන අවස්ථා පිළිබඳව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපති සමග සාකච්ඡා පැවැත්වූ අතර, ආයෝජනය සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර සහ දකුණු පෙදෙස්වල සංචාරය කරන ලදී.<br><br>ශ්‍රී ලංකාවේ සිංගප්පූරු මහ කොමසාරිස් අතිගරු චේ වැයි චුං මහතා ප්‍රමුඛ සිංගප්පූරු වාණිජ සහ ආයෝජන සාමාජිකයින් 15 දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයක් සඳහා ශ්‍රී ලංකා රජය මගින් තොරතුරු තාක්ෂණය, අධ්‍යාපනය, සෞඛ්‍යාරක්ෂාව සහ ධීවර කර්මාන්තය වැනි ක්ෂේත්‍රයන් සඳහා පිරිනමනු ලබන දිරිගැන්වීම් සහ පහසුකම් පිළිබඳව ආයෝජන මණ්ඩලය විසින් දේශනයක් ඉදිරිපත් කරනු ලැබීය.<br><br>සිංගප්පූරු වාණිජ සම්මේලනය (Singapore Business Federation) සහ සිංගප්පූරු ඉන්දියා වාණිජ සහ කර්මාන්ත මණ්ඩලයේ (Singapore-India Chamber of Commerce and Industry) ප්‍රධානත්වයෙන් පැමිණි 15 දෙනෙකුගෙන් යුත් සිංගප්පූරු වාණිජ සහ ආයෝජන දූත මඬුල්ලක් වෙත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය "ශ්‍රී ලංකා රජය මගින් විදේශීය ආයෝජකයින්ට දෙනු ලබන දිරි ගැන්වීම් සහ පහසුකම්" යන තේමාව යටතේ දේශනයක් පවත්වනු ලැබීය. |
| මැලේසියා | මැලේසියානු නිෂ්පාදකයින්ගේ සම්මේලනයේ (Federation of Malaysian Manufactures) සාමාජිකයින් 7 දෙනෙකුගෙන් යුත් දූත කණ්ඩායමක් සඳහා දැනුවත් කිරීමේ දේශනයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදුකරනු ලැබීය.<br><br>මැලේසියා ශ්‍රී ලංකා සංවිධානයේ (Federation of Malaysian Sri Lanka Organization (FOMSO) නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණි වාර දෙකකදීම "විශ්වාසනීය අංශයන්හි ආයෝජන අවස්ථා" යන මැයෙන් දේශනා ඉදිරිපත් කරනු ලැබීය. |
| වියට්නාමය | වියට්නාමයේ ජනාධිපති අතිගරු ට්‍රොං ටැන් සැං මැතිතුමා සමග පැමිණි වියට්නාම ව්‍යාපාරික දූත කණ්ඩායමක් ආයෝජන මණ්ඩලය විසින් පිළිගන්නා ලදී. මෙම චාරිකාවේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ වියට්නාමීය විදේශීය ආයෝජන නියෝජිතායතනය අතර ආයෝජන ප්‍රවර්ධන සහයෝගීතාවය පිළිබඳ ද්විපාර්ශවික අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. |
| ඉන්දියාව | කේරල රාජ්‍යයෙන් පැමිණි සී. අයි. අයි. (CII) සාමාජිකයින් 29 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් සඳහා ආයෝජන අවස්ථා පිළිබඳ දේශනයක් පවත්වනු ලැබීය. |

| රාජ්‍යයන් | වැඩසටහන |
| --- | --- |
| කටාර් රාජ්‍යය | ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කිරීමේ හැකියාව ගවේෂණය කරනු සඳහා පැමිණි කටාර් ආයෝජන අධිකාරියට (Qatar Investment Authority) අයත් දූත පිරිසක් පිළිගනු ලැබූ අතර, එම දූත පිරිස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග අවබෝධතා ගිවිසුමක් ද අත්සන් කරනු ලැබීය. |
| චීනය | චෙංලිකුයි මහතාගේ නායකත්වයෙන් යුතුව ෂැංහැයිහි සී. පී. පී. සී (CPPC) ආයතනයෙන් පැමිණි සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයකට පහසුකම් සලසා දෙනු ලැබීය.<br><br>China Tianjin Textile Group (Holdings) Co. Ltd. වෙතින් පැමිණි 5 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක්, ශ්‍රී ලංකාව තුළ රෙදි විවීමේ යන්ත්‍රාගාරයක් පිහිටුවීමට, වසා දමා ඇති කර්මාන්ත ශාලාවක් පවරාගනු සඳහා මත්තේගම පිහිටි කාබුල් ලේස් පුද්ගලික සමාගම සහ හොරණ පර්ත් වතුයාය ගවේෂණය කිරීමට, මත්තේගම සහ හොරණ වෙත චාරිකා කරන ලදී<br><br>ජාත්‍යන්තර ආර්ථික හුවමාරු පිළිබඳ චීන මධ්‍යස්ථානයේ (China Centre for International Economic Exchange (CCIE) සාමාජිකයින් 24 දෙනෙකුගෙන් යුත් දූත පිරිස පිළිගන්නා ලද අතර, එම දූත පිරිස බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමාගේ ඇරයුමින් ලංකාවට පැමිණියේ ය. එම දූත මෙහෙවරෙහි පරමාර්ථය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි නව ප්‍රතිපත්තිමය රෙගුලාසි සහ ආයෝජන අවස්ථා ගැන කරුණු සොයා බැලීමයි.<br><br>කොළඹ නුවර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා පවතින ශක්‍යතාව ගවේෂණය කරනු සඳහා පැමිණි China Shangdong International Economic & Technical Corporation Group Ltd හි 6 දෙනෙකුගෙන් යුත් සාමාජික දූත මණ්ඩලයකට පහසුකම් සැපයූ අතර, එම දූත මණ්ඩලය මාර්ග සංවර්ධන අධිකාරිය සමග සාකච්ඡා පවත්වන ලදී.<br><br>විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම සඳහා සුදුසු ස්ථාන හඳුනාගැනීම අරමුණුකොට, නිහාල් අලුවිහාරේ මහතා කැටුව පැමිණි Chengdu Municipal Bureau of Commerce ආයතනයෙන් පැමිණි සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත දූත මණ්ඩලයක් වෙත පහසුකම් සපයා දෙනු ලැබීය.<br><br>ඛනිජ තෙල් පිරිපහදුව සඳහා චීනයේ ඇති ප්‍රමුඛ සමාගම් අතරින් තෙවැනි ස්ථානය දරන සී. ඕ. ඕ. ඊ. සී. ජාත්‍යන්තර ඉංජිනේරු සමාගමේ (COOEC International Engineering Co.) විධායක නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිතැනගේ නායකත්වයෙන් මෙරටට පැමිණි සාමාජිකයින් 5 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය. ඔවුන්ගේ අරමුණු වූයේ රථවාහන නිෂ්පාදනයෙහි ආයෝජන අවස්ථා සාකච්ඡා කිරීමත්, යටිතල පහසුකම් අංශ සහ තෙල් පිරිපහදුකරණ ගවේෂණ කාර්යයන් පිළිබඳ සොයා බැලීමයි. මෙම දූත පිරිස කොළඹ පිහිටි ෂිංහුවා නිවුස් ඒජන්සියේ කාර්යාලය මගින් සංවිධානය කරනු ලැබීය.<br><br>Guangxi Investment Group Co. Ltd. හි ශ්‍රී ලංකා නේවාසික දූත මණ්ඩලයෙන් සාමාජිකයින් 6 දෙනෙකුගෙන් යුත් පිරිසක් සඳහා ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සලසා දෙනු ලැබීය. මෙම දූත පිරිසට China Development Bank Corporation හි සාමාජිකයන්ද ඇතුළත් විය.<br><br>පුත්තලමේ ගල් අඟුරු බලශක්ති යන්ත්‍රාගාරයේ මෙහෙයුම් සහ නඩත්තු සිදුකරන සමාගම වන CHD Power Plant Operation Co. Ltd. හි සාමාජිකයින් 6 දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයක්. සංචාරක කර්මාන්තය, පතල් කර්මාන්තය, සහ කෘෂිකර්ම යන අංශ වල ආයෝජන අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීමට පැමිණියහ.<br><br>බීජින්හි Dynamic Power Technology Corporation වෙතින්, පවත්නා ආයෝජන අවස්ථා ගවේෂණය පිණිස පැමිණි සාමාජිකයින් 6 දෙනෙකුගෙන් යුත් දූත පිරිසක් වෙත පහසුකම් සලසනු ලැබීය.<br><br>සන්නිවේදන සේවා මගින් ප්‍රතිපත්ති අධ්‍යයනය කොට අවබෝධ කරගෙන, භාණ්ඩ ඇසිරීම සඳහා පාවිච්චි කරනු ලබන ඇලුමිනියම් ෆොයිල් නිෂ්පාදනය සඳහා චීනයේ හෙනෑන් ප්‍රාන්තයේ Henan Yippee Industry Co. Ltd. හි දූත පිරිසක් ආයෝජන මණ්ඩලය වෙත පැමිණියේ ය.<br><br>සන්නිවේදන මාර්ග ඔස්සේ ප්‍රතිපත්ති අධ්‍යයනයකින් පසු, හිසකෙස් සඳහා නිෂ්පාදන භාණ්ඩ ව්‍යාපෘතියක් ඇරඹීමට ශ්‍රී ලංකාවට පැමිණි. චීනයේ ගුවන් ඩොක් ප්‍රදේශයේ ෆොන්හි Yongefeng Hair Products Co. Ltd හි සාමාජිකයන් 4 දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය. |

| රාජ්‍යයන් | වැඩසටහන |
| --- | --- |
| | පවත්නා ආයෝජන අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා, ජාත්‍යන්තර වෙළඳාම වර්ධන චීන මණ්ඩලයේ (සී. සී. පී. අයි. ටී.) ෂැන්හයි උපමණ්ඩලය වෙතින් පැමිණි දූත මණ්ඩලයක් හමුවිය. |
| හොංකොං | ශ්‍රී ලංකාව තුළ පේෂකර්ම යන්ත්‍රාගාරයක් පිහිටුවීම අරමුණු කොට Courttaulds Thread Co. හි නිලධාරීන්ද සමග ලංකාවට පැමිණි Mansum Garments Textiles Group Ltd. වෙතින් පැමිණි සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය. |
| ජපානය | Sam International Co. Ltd. වෙතින් පැමිණි සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් හමුවී සාකච්ඡා කරන ලද්දේය.<br><br>J R T Japan Co Ltd. නරිටාංෂි, කවකාමි සමාගමෙන්, ඉන්සියුලර් තහඩු නිෂ්පාදනය සඳහා යන්ත්‍රාගාරයක් පිහිටුවීමට ඇති පහසුකම් ගවේෂණය සඳහා පැමිණි සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය.<br><br>යටිතල පහසුකම් අංශයෙහි පවත්නා ආයෝජන අවස්ථා අධ්‍යයනය කර කරුණු සොයා බැලීම සඳහා Mitsui & Co. Ltd. වෙතින් පැමිණි සාමාජියින් 7 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය.<br><br>බලශක්ති තෙල් සහ ගෑස් පිළිබඳව ගවේෂණ චාරිකාවක යෙදුණු නගෝයා ප්‍රදේශයේ Inter Progress Inc. වෙතින් පැමිණි සාමාජිකයින් සිව් දෙනෙකුගෙන් යුතු දූත පිරිසක් ද, Mitsubishi: UFJ bank වෙතින් පැමිණි සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුතු දූත පිරිසක්ද, ජපානයේ Marubeni Co. වෙතින් පැමිණි සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුතු දූත මන්ඩලයක් සමග ද, ශ්‍රී ලංකාවේ පවත්නා ආයෝජන පරිසරය පිළිබඳව සාකච්ඡා කිරීමට JICA ආයතනයෙන් පැමිණි සාමාජිකයින් තිදෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් සමග ද, සාකච්ඡා පවත්වන ලදී. |
| යුරෝපය | ශ්‍රී ලංකාවේ පිහිටි යුරෝපීය වාණිජ මණ්ඩලයේ සහයෙන්, නවදිල්ලි නුවර පිහිටා ඇති Austria Trade Commission මගින් සංවිධානය කළ, සාමාජිකයින් 6 දෙනෙකුගෙන් යුතු ඕස්ට්‍රියානු ව්‍යාපාරික දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය.<br><br>ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රංශ තානාපති කාර්යාලය විසින් සංවිධානය කරන ලද, දකුණු ආසියාවේ පිහිටා ඇති ප්‍රංශ සමාගම්වල නියෝජිතයින් 10 දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරික දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය.<br><br>ශ්‍රී ලංකාවේ පිහිටි යුරෝපීය වාණිජ මණ්ඩලය (ECCISL) විසින් සංවිධානය කල, චෙක් ජනරජයේ කර්මාන්ත සහ වෙළඳ ඇමතිවරයාගේ නායකත්වයෙන් හා සාමාජිකයින් 30 දෙනෙකුගෙන් යුත් දූත මණ්ඩලයක් පිළිගනු ලැබීය.<br><br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග පෙර කරන ලද සාකච්ඡා වල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ සිය ආයෝජනයන් පිළිබඳ කටයුතු නිමකිරීමට ලංකාවට පැමිණි ඉතාලියේ INCANTO Fashion Group (Alpha Retail Group, Hong-Kong) හි දූත මණ්ඩලයක් හමුවී සාකච්ඡා පවත්වන ලද්දේ ය. |
| කොරියා | Woori Investment & Securities Asia සමාගමෙන් කරුණු සොයා බැලීම සඳහා පැමිණි සාමාජිකයින් 3 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක්, හෝටල් ව්‍යාපෘතියක් සඳහා AN Eui Hwan වෙතින් පැමිණි සාමාජිකයන් 4 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් ද, බේස්බොල් නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා Skylin Sports සමාගමෙන් පැමිණි සාමාජිකවන් 4 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක්ද, නිවාස ව්‍යාපෘතියක් සඳහා පැමිණි Kab Soo Jee & Associates Inc. වෙතින් පැමිණි සාමාජිකයින් 3 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක්ද, මධ්‍යම පාන්තිකයන් සඳහා නිවාස ඒකක වලින් යුතු නිවාස සංකීර්ණයක් සඳහා Metro Alpha Co. Ltd. වෙතින් පැමිණි සාමාජිකයන් 3 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක්ද, තනිපීලි දුම්රිය (Monorail) ව්‍යාපෘතියක් සඳහා සාකච්ඡා කිරීමට Garam Spac Consortium වෙතින් පැමිණි සාමාජිකයින් 10 දෙනෙකුගෙන් යුතු දූත මණ්ඩලයක් ද, Under Served Housing ව්‍යාපෘතියක් සඳහා Boo Yong Co Ltd. වෙතින් පැමිණි 4 දෙනකුගෙන් යුත් සාමාජික දූත මණ්ඩලයක් ද, KOTRA වෙතින් පැමිණි 3 දෙනකුගෙන් යුත් සාමාජික දූත මණ්ඩලයක් ද, සමග රැස්වීම් පවත්වනු ලැබීය. |

## විදේශීය දූත මෙහෙවර

| රට | වැඩසටහන |
| --- | --- |
| සිංගප්පූරු | සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය,සිංගප්පූරු ජාත්‍යන්තර ව්‍යවසාය ආයතනය සමග සහයෝගීත්වයෙන් සංවිධානය කරනු ලැබූ ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණයකදී "ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා" යන මැයෙන් දේශනයක් පවත්වන ලදී.<br><br>එහිදී එක් එක් ආයෝජකයා වෙනුවෙන් වෙන වෙනම ව්‍යාපාර රැස්වීම් පවත්වනු ලැබීය. |
| ජපානය | ජපානයේ ටෝකියෝ නුවර Japan Sri Lanka Business Corporation Committee යන ආයතය විසින් සංවිධානය කළ ආයෝජන සමුළුවකට සහභාගී විය. UNIDO හි සහය ලබා ආයෝජකයන් එකිනෙකා සමග රැස්වීම් පවත්වනු ලැබීය. |
| කොරියාව | කොරියාවේ සියෝල් නුවර Korean Chamber of Commerce ආයතනය විසින් සංවිධානය කළ ආයෝජක සමුළුවකට සහභාගී විය.<br><br>විභව්‍ය ආයෝජකයින් සඳහා එක් එක් ආයෝජකයා සමග සාකච්ඡා කොරියාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේත් Kotra ආයතනයේත් සහය ලබා පවත්වනු ලැබීය. |

# ආයෝජන කාර්යසාධනය

## සමාලෝචනයක්


2011 වර්ෂයේ දී මෙරටට ගලා ආ සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,066ක් වන ඉහළම වාර්තාගත අගය වූ අතර, එම ප්‍රමාණය 2010 වර්ෂයේ දී ගලා ආ ප්‍රමාණය වූ ඇ.ඩො. මිලියන 516 ප්‍රමාණය සමග සංසන්දනාත්මකව සලකා බැලීමේ දී දෙගුණයකින් පමණ වැඩිවීමකි. 2011 වසරේදී අනුමත කළ ව්‍යාපෘතීන් සංඛ්‍යාව 157 ක් විය. මෙමගින් අපේක්ෂිත ආයෝජනය ඇ.ඩො. මිලියන 4,503ක් (රු. මිලියන 497,866) වූ අතර, එය 2010 වසරේදී අනුමත ව්‍යාපෘතීන් සඳහා ඇස්තමේන්තු කළ මුළු ආයෝජනයන් මෙන් 121% ක වර්ධනයකි. 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති 161 ක් සඳහා ගිවිසුම් වලට එළඹී අතර, ඒවායෙහි මුළු අගය ඇ.ඩො. මිලියන 3,359 ක් විය. (රු. මිලියන 371,383). එම ඇස්තමේන්තුගත ආයෝජන ප්‍රමාණය 2010 සමග සංසන්දනාත්මකව බැලීමේ දී 170%ක වැඩිවීමකි. ව්‍යාපෘති 66ක ක්‍රියාවලිය ආරම්භ කළ ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් අය පැහැදුණු මුළු ආයෝජන අගය ඇ.ඩො. මිලියන 1,002 ක් (රු. මිලියන 110,755 ක්) වූ අතර. සිය ව්‍යාපාරික මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් අය පැහැදි මුළු ආයෝජන ප්‍රමාණය ඇ.ඩො මිලියන 135 ක් (රු. මිලියන 14,905)ක් විය.

| කාර්ය සාධනය - 2011 | ව්‍යාපෘති සංඛ්‍යාව | ආයෝජනය (ඇ.ඩො. මිලියන) |
|---|---|---|
| අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | 157 | 4,503 (ඇස්තමේන්තු කළ) |
| ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 161 | 3,359 (ඇස්තමේන්තු කළ) |
| ක්‍රියාවලිය ඇරඹූ ව්‍යාපෘති සංඛ්‍යාව | 66 | 1,002 (ඇස්තමේන්තු කළ) |
| වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 73 | 135 (ලැබුණු මුදල) |


## 2011 වසරේදී ආකර්ෂණය කරගනු ලැබූ සෘජු විදේශීය ආයෝජන

2011 වසරේදී ලැබුණු සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය මෙතෙක් වාර්තා වූ වැඩිම සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණය වන අතර, එය ඇ.ඩො. මිලියන 1,066 ක් විය. 2011 දී මෙසේ ලැබුණු මුළු සෘජු විදේශීය ආයෝජන ප්‍රමාණයෙන් වැඩිම ප්‍රමාණය ඇ.ඩො. මිලියන 322(30%)ක්, නිෂ්පාදන කර්මාන්ත අංශය වෙනුවෙන් ලැබුණි. දෙවැනි විශාලතම ප්‍රමාණය වූ ඇ.ඩො.මිලියන 216ක ප්‍රමාණය (20%) හෝටල් සහ ආපනශාලා අංශය වෙනුවෙන් ලැබුණි. එමෙන්ම ඇ.ඩො. මිලියන 197 ක (18%) ප්‍රමාණය දුරකථන හා දුරකථන සන්නිවේදන අංශය වෙනුවෙන් ලැබිණි. ඛනිජ තෙල් ආශ්‍රිත ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 109 ක් (10%)ක් ද, නිවාස සාප්පු / කාර්යාල සංකීර්ණ අංශය සඳහා ඇ.ඩො. මිලියන 91.5 (9%)ක් ද, පේෂකර්ම සහ ඇගලුම් අංශය සඳහා 9% ඇ.ඩො. මිලියන 95 ක්, වශයෙන් විය.

## සෘජු විදේශීය ආයෝජනවල අංශගත සංයුතිය - 2011



## සෘජු විදේශීය ආයෝජන ගලා ආ ප්‍රධාන ප්‍රභවයන්




ඇ.ඩො. මි. 253 ක් සමග 2011 දී සෘජු විදේශීය ආයෝජන වල විශාලම ප්‍රභවය වූයේ මුරුසි දිවයිනයි. පිළිවෙළින් ඉන්දියාව (ඇ.ඩො. මි. 147); හොංකොං රාජ්‍ය (ඇ.ඩො. මි. 139); මැලේසියාව (ඇ.ඩො. මි. 89.5); බ්‍රිතාන්‍ය වර්ජිනියා දූපත් (53.5); සිංග්පූරුව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය (ඇ.ඩො.මි. 53); එංගලන්තය (ඇ.ඩො.මි. 52); නෙදර්ලන්තය (ඇ.ඩො.මි.51); ජපානය (ඇ.ඩො.මි. 27); ලක්සම්බර්ග් (ඇ.ඩො.මි. 25.6) සහ ස්විස්ටර්ලන්තය (ඇ.ඩො.මි. 21) වශයෙන් සෘජු විදේශීය ආයෝජන සැපයීය. 2011 වර්ෂයේ දී ලැබුණු සමස්ත සෘජු ආයෝජන ප්‍රමාණයෙන් 90.5% ක්ම ඉහත සඳහන් රාජ්‍යයන් 12 විසින් සපයනු ලැබීය.


## ලබාගත් ආයෝජන(සමුච්චිත)

2011 වසර අවසාන වන විට ශ්‍රී ලංකාවට ලැබී තිබුණු සමුච්චිත ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 9,339 වූ අතර. එය ඊට පෙර වර්ෂයේ ලැබුණු සමුච්චිත ආයෝජන ප්‍රමාණය සමග සැසඳීමේ දී 23% වර්ධනයක් පෙන්වීය. මෙයින් විදේශීය සංරකය 64% (ඇ. ඩො. මිලියන 5,948) වූ අතර ඉතිරි 36% (ඇ. ඩො. මිලියන 3,391) දේශීය පෞද්ගලික ආයෝජන විය. ලැබුණු සමුච්චිත ආයෝජන ප්‍රමාණයෙන් 71%ක් යටිතල පහසුකම් සහ සේවා අංශයන්ගෙන් වූ අතර ඉතිරි 29% ඇඟලුම් කර්මාන්තය ඇතුළුව නිෂ්පාදන අංශයෙන් ලැබුණි.

## 2011 වර්ෂයේදී සිය වාණිජ මෙහෙයුම අරඹන ලද ව්‍යාපෘති

2011 වර්ෂයේදී ව්‍යාපෘති 73 ක් සිය වාණිජ මෙහෙයුම් ආරම්භ කළ අතර, එයින් 70 ක් නව ව්‍යාපෘති වූ අතර, 3 ක් පවතින ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම් විය. 2011 වර්ෂයේදී සිය වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘතින්ගෙන් ලද සම්පූර්ණ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො.මිලියන 135 ක් වූ අතර එසේ ලැබුණු මුළු ආයෝජන ප්‍රමාණයෙන් 54%ක් (ඇ.ඩො. මිලියන 73 ක්) විදේශ මූලාශ්‍රයන්ගෙන් ලැබුණි.


## ලබාගත් ආයෝජන ආංශීය වශයෙන් බෙදීගිය අයුරු



2011 වර්ෂයේදී වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති සඳහා ලැබුණු සමුච්චිත ආයෝජන ප්‍රමාණයෙන් 51% ක් වූ ඉහළ ප්‍රතිශතයක් නිෂ්පාදන අංශයන් ගෙන් (ඇඟලුම් පේෂකර්ම ඇතුළුව) ලැබුණු අතර, හෝටල් අංශයෙන් 27%ක් ද, බලශක්ති අංශයෙන් 17% ක් ද ලැබුණි.

## රැකියා උත්පාදනය

2011 වසරේදී සිය වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති විසින් නව රැකියා අවස්ථා 6,555 ක් උත්පාදනය කරන ලදී. එසේ උත්පාදනය කළ සම්පූර්ණ රැකියා අවස්ථා සංඛ්‍යාවෙන් 35% (2,300) ඇඟලුම් සහ රෙදිපිළි අංශයේ ද, තවත් 35% එනම්(2,322) හෝටල් අංශයෙන්ද, උත්පාදනය කරන ලදී. නිෂ්පාදිත කර්මාන්ත අංශය (ඇඟලුම් සහ රෙදිපිළි හැර) රැකියා අවස්ථා 21%ක් (1,399) වර්ෂය තුළ උත්පාදනය කර තිබුණි.



# දෙපාර්තමේන්තු ප්‍රගති සමාලෝචනය

## අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලයයි.

වර්ෂ 2011 දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සභාපති/අධ්‍යක්ෂ ජනරාල්තුමා විසින් ගන්නා ලද ක්‍රියා මාර්ග මගින් අන්තර් රාජ්‍ය සංවිධාන අතර සබඳතා තවදුරටත් වර්ධනය විය. ඒ අනුව එක වහලක් යට සියළු විසඳුම් ලබාදීමේ රැස්වීම් (One-Stop-Shop Meetings) පවත්වා, ආයෝජකයින්ට සිය ව්‍යාපාර සඳහා අවශ්‍ය සියළු අනුමැතීන් කඩිනමින් ලබාදීමට, රේඛීය අමාත්‍යංශ හා නියෝජිත ආයතන අතර කටයුතු කරන ලදී.

නව ව්‍යාපෘති ආශ්‍රිතව පැන නැගුණු ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මෙයාකාරයේ රැස්වීම් 4 ක්, 2011 අගෝස්තු මස සිට පවත්වනු ලැබීය. එම රැස්වීම් අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර. එහිදී ගන්නා ලද තීරණ පිළිබඳව පසුවිපරම් කටයුතු ද සිදුකරනු ලැබීය. ව්‍යාපෘතීන් 23කට අදාලව ඉඩම් බදු ගැනීම් කඩිනම් කිරීම, සංවර්ධන අවසරපත් නිකුත් කිරීම, පාරිසරික නිෂ්කාශන සහ ගොඩනැගිලි යෝග්‍යතා සහතික නිකුත් කිරීම ආදී කරුණු පිළිබඳව එම රැස්වීම්වලදී සාකච්ඡා කරන ලදුව, අදාල වර්ෂය තුළදී පැවැත්වුනු රැස්වීම් 4 මගින් ගැටළු 12 කට කඩිනම් විසඳුම් ලබාදෙන ලදී.

ද්වි-මාසිකව පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කැඳවීමත්, එම රැස්වීම් වාර්තා සැකසීම සහ අධ්‍යක්ෂ මණ්ඩල අතර බෙදා හැරීමත් ආයෝජන මණ්ඩල තීරණ අදාල දෙපාර්තමේන්තු වෙත දැන්වීමත්, ලේකම් කාර්යාලය විසින් සිදුකරනු ලැබේ. 2011 වසර තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 21 ක් සහ විශේෂ රැස්වීම් 3 ක් පවත්වනු ලැබීය. කළමනාකරණ සහ ප්‍රතිපත්ති ගැටළු සාකච්ඡා කිරීම සඳහා, ද්වි-මාසිකව කළමනාකරණ කමිටු රැස්වීම් කැඳවීම ද, ඒවා හා සම්බන්ධ ලියකියවිලි සකස් කිරීම ද, එම රැස්වීම් වලදී ගන්නා ලද තීරණයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදු කිරීම ද, ලේකම් කාර්යාලයේ වගකීම් යටතට වැටේ. 2011 වසර තුළ කළමනාකරණ කමිටු රැස්වීම් පහක් පවත්වනු ලැබීය.

ආයෝජන මණ්ඩලය, බාහිර ආයතනය, පෞද්ගලික අංශයේ ආයතන තුළ සිදු කෙරෙන විවිධ කාර්යයන්ට අයත් කරුණු සමායෝජනය කිරීමෙන් සභාපති/අධ්‍යක්ෂ ජෙනරාල් තුමාට සහය වීම, මෙම දෙපාර්තමේතුව සතු තවත් කාර්යභාරයකි. වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීම සඳහා අදාල දෙපාර්තමේන්තු වෙතින් තොරතුරු කැඳවීමත්, ඒවා එක්රැස් කිරීමත්, ලේකම් කාර්යාලයට අයත් කාර්යයකි.

අභ්‍යන්තර දෙපාර්තමේන්තු වලින් තොරතුරු ලබාගෙන, පාර්ලිමේන්තු ප්‍රශ්න. පාර්ලිමේන්තු උපදේශක කමිටු ප්‍රශ්න සහ අනිකුත් බාහිර ආයතන වලින් නැගෙන ප්‍රශ්න සහ විමසීම් වලට කාලීනව පිළිතුරු සැපයීම ද, ලේකම් කාර්යාලය සතු කාර්යයකි. ලැබෙන ලියකියවිලි සහ පවත්වන රැස්වීම් පිළිබඳ ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් සම්බන්ධීකරණ ඒකකය ලෙස ද ලේකම් කාර්යාලය කටයුතු කරයි. කැබිනට් සංදේශ, ප්‍රතිපත්ති ප්‍රකාශන, වාර්තා කෙටුම්පත් කිරීම ද, ආයෝජකයින්ට ව්‍යාපෘති සම්බන්ධ බාධක නිරවුල් කර දීම ද ලේකම් කාර්යාලය සතු කාර්යයන්ට අදාලය.

## ආයෝජන ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිය කාර්යයන් ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා 2011 වර්ෂයේදී අනුගමනය කරනු ලැබූ ක්‍රියාදාමය මත ප්‍රධාන දෙපාර්තමේන්තු තුනක්, එනම් ආයෝජන ප්‍රවර්ධන, ආයෝජන ඇගයීම් සහ මෙහෙයුම් යන දෙපර්තමේන්තු ඒකාබද්ධ කරන ලදී. ආයෝජන මණ්ඩලය විසින් සැපයෙන පහසුකරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ද, ආයෝජකයන් වෙත සැපයෙන සේවාවන්හි ගුණාත්මක බව වර්ධනය කරනු සඳහා ද, ඉහත කී දෙපාර්තමේන්තු ඒකාබද්ධ කර පුළුල් ආංශීය සමූහයන් තුනකට වෙන්කරන ලදී.

එම ආංශීය සමූහ තුනට පිළිවෙලින් උප-අංශ 3ක් ලෙස නම් කර, ආංශීය සමූහය 1 යටතට සංචාරක කර්මාන්ත සහ විනෝදාත්මක සේවා, කෘෂිකර්මය සහ තොරතුරු තාක්‍ෂණය/දැනුම් සේවා යන විෂයයන් ද, ආංශීය සමූහය 2 යටතට යටිතල පහසුකම්. පොදු පහසුකම් සහ වරාය, අධ්‍යාපන සහ ව්‍යාපෘති ද ආංශීය සමූහ 3 සඳහා ඇඟළුම්, නිෂ්පාදන කර්මාන්ත, කලාපීය වැඩසටහන් සහ සේවා අපනයනය ආදී කාර්යයන් ද, පවරනු ලැබීය.

මෙසේ ආංශීය වශයෙන් මූලික අවධානය යොමු කරන ලද්දේ අදාල ආංශීය කණ්ඩායම් මාර්ගයෙන් ආයෝජනයන්ට අවශ්‍ය සියළු පහසුකම් සැලසීමයි. එනම් විමසුම් / අයදුම් කිරීම් යන පියවරේ සිට ව්‍යාපෘතියක මුළු ජීවන කාලය පුරාම පහසුකම් සැපයීමයි. සිය අංශය හා සම්බන්ධ අමාත්‍යංශ සමග ක්‍රියා කරමින් එම කණ්ඩායම් විසින් ආයෝජන ප්‍රමුඛතා හඳුනාගැනීමද, ආයෝජන අවස්ථා කාර්යක්‍ෂම ලෙස වර්ධනය කිරීමද, සිදු කරයි. යම්

ආයෝජකයෙකු යම් අංශයක ආයෝජනය කිරීමට තීරණය කල පසු මෙම කණ්ඩායම් සිය අංශයෙහි ආයෝජනය කරන ආයෝජකයින්ගේ සම්බන්ධීකාරක කළමනාකරුවන් ලෙස සේවය සපයති. ව්‍යාපෘති ඇගයීමේ සිට එය ක්‍රියාත්මක කිරීම දක්වා ද, පශ්චාත් ආයෝජන ආරක්‍ෂක කටයුතු ද ඉටුකරලීමෙන් ආංශීය කණ්ඩයම් සහ ආයෝජකයින් අතර ගැඹුරු සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමටද, එමගින් ආංශීය කටයුතු කෙරෙහි ප්‍රබල දියුණුවක් ලබාගැනීමට ද කටයුතු කරයි.

## ආංශීය කණ්ඩායම 1

සමාලෝචිත වර්ෂය තුළදී ආංශීය සමූහ 1 සිය විෂය ක්ෂේත්‍රය යටතේ වැටෙන ආයෝජන අවස්ථා ගවේෂණය කිරීම සඳහා මෙරටට පැමිණි ප්‍රධාන සමාගම් / කණ්ඩායම් සඳහා පහසුකම් සපයා දෙනු ලැබීය.

මෙම කණඩායම් අතර, සිංගප්පූරුවෙන් පැමිනි Banyan Tee Group කණ්ඩායමද, චීනයෙන් පැමිණි Avick International (CATIC) ස්විට්සර්ලන්තයෙන් පැමිණි Accord Hotel Group, ඕස්ට්‍රේලියාවෙන් පැමිණි Rydges Hotels / Resorts, ඕමානයෙන්/ඉන්දියාවෙන් පැමිණි M-far Hotels and Resorts සමාගම, හෙංකොං වෙතින් පැමිණි Bank of America Merrryl Lynch, කටාර් රාජ්‍යයෙන් පැමිණි Qatari Diar Investment සමාගම, තායිලන්තයෙන් පැමිණි Leguna Resort and Hotels, දකුණු අප්‍රිකාවෙන් පැමිණි Sun International (Sun City Group), බාලි/ඉන්දුනීසියාවෙන් පැමිණි T Panorama Development Utama, ඉන්දියාවෙන් පැමිණි ITC Group, මලයාසියාවෙන් පැමිණි Malysia - Maccau Enterprises Center සහ සංචාරක කර්මාන්ත අංශයෙන් පැමිණි අනික් කණ්ඩායම් ද ඒ අතර විය.

ඒ අතර කන්තලේ සීනි නිෂ්පාදන ව්‍යාපෘතිය ලබාගැනීම සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ඉන්දියාවෙන් Wijenagar Sugar (Pvt) සමාගමින් පැමිණි කණ්ඩායමද, කෘෂිකාර්මික අංශයෙන් ද, තොරතුරු තාක්‍ෂණය / දැනුම් සේවා අංශය සඳහා හම්බන්තොට ප්‍රදේශය අධි තාක්‍ෂණික නගරයක් සංවර්ධනය කිරීමේ අවස්ථා ගවේෂණය කිරීම සඳහා සිංගප්පුරුවෙන් පැමිණි Excell Group ද, ඉහත කී ආංශීය සමූහ 1 යටතට ගැනේ.

### උපාය මාර්ගිය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වැටෙන ව්‍යාපෘති හැර අනෙක් ව්‍යාපෘති සඳහා ලැබුණු ව්‍යාපෘති අයදුම්පත් පිළිබඳ විස්තර (2011 ජනවාරි සිට දෙසැ දක්වා)

| විස්තරය | සංචාරක ව්‍යාපාර | කෘෂිකර්මය | තොරතුරු තාක්‍ෂණ දැනුම් සේවා | එකතුව |
|---|---|---|---|---|
| ලැබුණු නව අයදුම්පත් සංඛ්‍යාව | 35 | 05 | 04 | 44 |
| ව්‍යාප්ත කිරීම් සහිතව පිරිනමනු ලැබූ ව්‍යාපෘති අනුමැතීන් සංඛ්‍යාව | 26 | 02 | 02 | 30 |
| අත්සන් කරනු ලැබූ ගිවිසුම් සංඛ්‍යාව | 18 | 05 | 03 | 26 |
| මෙහෙයුම් ආරම්භ කරනු ලැබූ ව්‍යාපෘති සංඛ්‍යාව | 17 | 06 | 06 | 29 |



අනිලාන - පාසිකුඩා

## සාකච්ඡාවන්ට භාජනය වූ / අනුමැතිය දෙන ලද ප්‍රධාන ව්‍යාපෘති

2008 අංක 14 දරණ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) යටතේ බදු සහ වෙනත් අය කිරීම් වලින් බොහෝ දුරට නිදහස් කරනු ලැබූ ව්‍යාපෘති සඳහා සහන ලබාදීම අනුමත කිරීම සහ සාකච්ඡා මෙහෙයවීම සම්බන්ධ කාර්යයන්හි ආංශීය කණ්ඩායම් 1 ක්‍රියාශීලීව සම්බන්ධ විය.

මේ අනුව Sangri-la Hotels Lanka Ltd. උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති තත්ත්වය, එකී පනත යටතේ පිරිනමනු ලදුව, කොළඹ ගාලු මුවදොර පිටිය අභියස හෝටල් සංකීරණයක්, සුඛෝපභෝගී නිවාස පද්ධතියක් ද, සාප්පු සංකීර්ණයක්ද සහිත මිශ්‍ර ව්‍යාපෘතියක් සඳහා අනුමැතිය ලබා දෙනු ලැබීය. එම ආයෝජනයේ වටිනාකම ඇ.ඩො. මිලියන 408 කි.

ඒ අයුරින්ම Sangri-la Investment Lanka (Pvt) Ltd. සමාගම විසින් ඇ. ඩො. මිලියන 120 ක ආයෝජනයකින් යුතුව ඉහළ තත්ත්වයෙන් යුතු නිවාස පද්ධතියක්ද, සාප්පු සංකීර්ණයක් ද, ගොල්ෆ් පිටියක් ද හම්බන්තොට ඉදිකරනු ලැබේ.

සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය අපේක්ෂා කරමින් ඇ. ඩො. මිලියන 90 සිට 355 දක්වා ආයෝජනය කරන, චීනයෙන් සහ ඉන්දියාවෙන් ලැබුණු ප්‍රධාන ආයෝජන යෝජනා 4 ක් සඳහා ද, තොරතුරු තාක්ෂණ / දැනුම් සේවා අංශයට අයත් අධිතාක්ෂණ නගරයක් හම්බන්තොට පිහිටුවීම සඳහා සිංගප්පූරු සමාගමකින් ලද ආයෝජන යෝජනාවක් සඳහා ද, උපායමාර්ගික සංවර්ධන පනත යටතේ සමාලෝචිත වර්ෂය තුළ දී පහසුකම් සලසනු ලැබීය.

තවත් ප්‍රධාන ව්‍යාපාති යෝජනා 6 ක් එනම්. සීනි කර්මාන්ත ශාලාවක් සහ පැළ තවානක් ද, කිරි ගොවිපලක් ද, කුකුල් ගොවිපල 2ක් සහ කෘෂිකාර්මික බීම වර්ග නිපදවීමේ ව්‍යාපෘතියක් සහිතව ඇ.ඩො. මිලියන 3.8 ක් ඇ. ඩො. මිලියන 110 ත් අතර ආයෝජනය වන ව්‍යාපෘති යෝජනා දෙකක් ද, කෘෂිකර්මය / කිරි නිෂ්පාදනය / කුකුළු පාලන අංශය යටතේ පහසුකම් ලබාදෙනු ලැබූ ව්‍යාපෘති යෝජනා වේ.

## අනිකුත් ආයෝජන ප්‍රවර්ධන කටයුතු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නව වෙබ් අඩවිය නැවත ඇරඹීම – www.investsrilanka.com

2011 වසරේ දී ආංශීය වශයෙන් අවධානය යොමු කරවන ප්‍රවේශයක ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු ක්‍රියාත්මක කරන ලදී. නිවැරදි ආයෝජන ලබා ගැනීම සඳහා රට කෙරෙහි ධනාත්මක හා ක්‍රියාශීලි ප්‍රතිරූපයක් ඇති කිරීම අරමුණු කොට ආයෝජන මණ්ඩල වෙබ් අඩවිය නැවත සකස් කිරීමට ද තීරණය කරන ලදී.

මෙම කාර්යය, එනම් වෙබ් අඩවියේ ව්‍යුහය/අඩවි සිතියම හා අන්තර්ගතය නැවත සැලසුම් කිරීම සඳහා ආංශික කණ්ඩායම 1 වෙතින් තෝරාගත් පිරිසකට භාරදෙනු ලැබීය. එහි පරමාර්ථය වූයේ අවශ්‍ය මූලික තොරතුරු අනාගත ආයෝජකයන් වෙත ලබාදීමට වෙබ් අඩවිය වඩා සංවේදීව ආයෝජක හිතකර ලෙස සැකසීමය. පෙර තිබූ වෙබ් අඩවියේ අවශ්‍ය සුදුසු අංගයන් තවදුරටත් රඳවා ගනිමින් සංවර්ධනය කල නව වෙබ් අඩවිය, අයර්ලන්තයේ, තුර්කියේ, මැලේසියාවේ හා තායිලන්තයේ ආදී රටවල භාවිත කරන, වඩාම දියුණු IPA තාක්ෂණයට අයත් අංගයන්ගෙන් සමන්විත ය.

අංශ කණ්ඩායම 1 හි දෙපාර්තමේන්තු ප්‍රධානියා, තොරතුරු තාක්ෂණය / ව්‍යාපාර ක්‍රියාවලි බාහිර පාර්ශවයන්ගෙන් ලබාගැනීම පිළිබඳ තරගකාරී අධ්‍යනයේ ක්‍රියාකාරී සාමාජිකයකු ලෙස “ශ්‍රී ලංකා දකුණු ආසියා රටවල බටහිර ගුණාත්මක ප්‍රමිතීන් සැපයීමට ඇති හැකියාව” යන මැයින් වූ අධ්‍යයනයකට සහභාගී විය. එම වැඩසටහන ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද අතර, එහි වාර්තාව 2012 දී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

භාණ්ඩාගාර ලේකම්ගේ සහභාගීත්වයෙන් යුතුව පැවැත්වුණු සංචාරක පර්ෂද රැස්වීම්වලට සංචාරක අංශ කණ්ඩායමේ ඉහල නිලධාරීහු නිතිපතා සහභාගී වූහ.

තවද, ක්‍රියාත්මක වෙමින් පවතින සංචාරක ව්‍යාපෘතීන් වේගවත් මාර්ගයකට අවතීර්ණ කිරීමේ අදහසින් යුතුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙහි පැවැත්වුණු “සියලු විසඳුම් එක වහලක් යට” ක්‍රියාදාමයේ මාසික රැස්වීම් වලට කණ්ඩායම් සාමාජිකයෝ සහභාගී වූහ.

## ආංශීය කණ්ඩායම 2

මෙම ආංශීය කණ්ඩායම, එම කණ්ඩායමට අදාල අංශයන් ගණයෙහිලා ගැනෙන ව්‍යාපෘතීන්හි ආයෝජන කිරීමේ අපේක්ෂාවෙන් මෙරටට පැමිණි ප්‍රධාන සමාගම් / කණ්ඩායම් වලට පහසුකම් සැපයීම සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කරනු ලැබීය.

ඉහත කී ආයෝජන අපේක්ෂාවෙන් මෙරටට පැමිණි කණ්ඩායම් අතර ජපානයේ Mitsui & Co. Ltd, ඉන්දියාවේ South City Project (කල්කටා) සමාගම, IVRCL Asociate and Holdings Company හා Infinty Infortec Park Company, තායිලන්තයේ Suplai Public Company, මලයාසියාවේ Sunway City Berhard හා Malaysia Petroleum Resource Corporation, දකුණු කොරියාවේ Keangnam Entrprise Ltd, Boo Yooung Co (Undeserved Resettlement Construction) හා Samsung C & T Corporation, සිංගප්පූරුවේ Global Orion Pre Ltd. ඕස්ට්‍රේලියාවේ Crown Limited හොංකොං හි Dragon Asia Fertilizer Limited චීනයේ China Shandong Int'l Economic & Technical Cor, Group Ltd. යන ආයතනවල දූත පිරිස් යටිතල පහසුකම් අංශයෙහි ආයෝජනය සඳහා උනන්දුවක් දැක්වීය.

එමෙන්ම මලයාසියාවේ R & A Telecommunication, SDN BHD හා Oziland Services බෙල්ජියම් සමාගමක් වන Green Pulse, චීනයේ CG Solar, Weihai China Gloass Solar Col Ltd. ඉන්දියාවේ Samsung C & T India හා Bhilwara Energy Ltd, ආදී සමාගම් වල දූත කණ්ඩායම් ප්‍රජා පහසුකම් සහ වරාය අංශයේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ Laureate International Universities සහ බ්‍රිතාන්‍යයේ UK Universities of Central Lancashire, Hertfordshire, Staffordshire, Ulster යන විශ්වවිද්‍යාල අධිකාරීන් අධ්‍යාපන අංශයේ ද ආයෝජන අපේක්ෂාවෙන් මෙරටට පැමිණියහ.

## උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ වැටෙන ව්‍යාපෘති හැර 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබුණු ව්‍යාපෘති ඉල්ලුම්පත් පිළිබඳ සවිස්තර තොරතුරු

| විස්තරය | යටිතල පහසුකම් | වරාය හා ප්‍රජා පහසුකම් | අධ්‍යාපන | 16 වැනි වගන්තිය | එකතුව |
|---|---|---|---|---|---|
| ලැබුණු නව ඉල්ලුම් පත්‍ර | 30 | 11 | 04 | 28 | 73 |
| ව්‍යාප්ත කිරීම් සහිතව ලබාදුන් ව්‍යාපෘති අනුමැතීන් සංඛ්‍යාව | 27 | 11 | 03 | 15 | 56 |
| අත්සන් කරනු ලැබූ ගිවිසුම් | 22 | 20 | 01 | අදාල නැත | 43 |
| මෙහෙයුම් අරඹන ලද ව්‍යාපෘති | 0 | 04 | 0 | 10 | 14 |



කර්න් ලංකා (පුද්) සමාගම

## සාකච්ඡාවන්ට භාජනය කළ / අනුමත කළ මහා පරිමාණ ව්‍යාපෘති

2008 අංක 14 දරණ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) ප්‍රකාරව අනුමත කළ මහා පරිමාණ ව්‍යාපෘතීන් සඳහා වඩා විශාල බදු සහන ලබා ගැනීමට සහ අනිකුත් අයකිරීම් වලින් නිදහස් කිරීම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මෙන්ම එම සහනයන්ට අනුමැතිය ලබාගැනීමට මෙම ආංශීය කණ්ඩායම 2 ක්‍රියාකාරීව සහභාගී විය.

ඇ. ඩො. මිලියන 500 ක ආයෝජනයකින් වැඩ නිමකොට, ක්‍රියාත්මක කර, ආපසු භාරදීමේ (Build, Operate and Transfer - BOT) පදනම යටතේ කොළඹ වරාය පුළුල් කිරීමේ වැඩ සටහන අනුව කොළඹ වරායේ දකුණු බහාලුම් පර්යන්තය සංවර්ධනය කිරීම සඳහා Colombo International Container Terminals Ltd (CICT) ඉහත කී පනත යටතේ අනුමැතිය ප්‍රධානය කරන ලදී.

එමෙන්ම, ඇ.ඩො. බිලියන 1.5 ක ආයෝජනයකින් යුතු තරුපහේ හෝටල් 4ක් ප්‍රදර්ශන සහ සංස්කෘතික මධ්‍යස්ථානයක්, සාප්පු සංකීර්ණ 2ක්, ජාත්‍යන්තර වෙළෙඳ පොළක්, විනෝද ක්‍රීඩා කලාප, ආපන ශාලා, සෞඛ්‍ය මධ්‍යස්ථාන සහ අනිකුත් අදාළ ක්‍රියාකාරකම් ද ඇතුළුව විශාල ඒකාබද්ධ සංචාරක පුරවරයක්, සියළු යටිතල පහසුකම් සහිතව කටාන ප්‍රදේශයෙහි ඉදිකිරීමට Asian Resorts and Consortium සමාගම ගෙන ආ යෝජනාවක්, ඉහත පනත යටතේ අනුමත කිරීමට සාකච්ඡා පවත්වන ලදී.

Mitchell Consortium සමාගම විසින් ත්‍රිකුණාමලයෙහි ඇ. ඩො. මිලියන 700 ක වියදමින් ඉදිකිරීමට යෝජිත විශාල කර්මාන්ත පුරවරයක් පළමු වැනි අධියර සඳහා එනම් කෝක් යන්ත්‍රාගාරයක්, යකඩ උණු කිරීමේ යන්ත්‍රාගාරයක්, දේශ සීමා හරහා ප්‍රවාහනය කිරීමට අමුද්‍රව්‍ය සැකසීමේ යන්ත්‍රාගාරයක්, කාබන් සහ බලශක්තිය පිළිබඳව පර්යේෂණයක්ද ඇතුළුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සාම්පූර්හි ඉදිකිරීම සඳහා එම සමාගමට උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති තත්ත්වය පිරිනැමීමට පහසුකම් සලස්වනු ලැබීය.

යටිතකල පහසුකම් අංශය අයත් Sithe Global Power Ventures LLC වෙතින් ලැබුනු තවත් විශාල ව්‍යාපෘති යේජනා දෙකක්, එනම් LGN Receiving Facilities ලබා ගැනීම සඳහා එහි සංවර්ධනය මුදල් යෙදවීම, ගොඩනැගීම, අයිතිය, Uploading ටර්මිනලයින් ක්‍රියාත්මක කිරීම, ගබඩා කිරීම, නැවත ගෑස් පිරවීම යන පහසුකම් සහ පයිප්ප පද්ධතියක් ද සහිතව මෙගා වොට් 520 ක ධාරිතාවයෙන් යුතු LNG ඉන්ධන වලින් ක්‍රියාකරන විදුලි බලාගාරයක් ආසන්න වශයෙන් ඇ. ඩො. බිලියන 1 ක ආයෝජනයෙන් යුතුව හම්බන්තොට පිහිටුවීමට යෝජනා වී ඇත. ඒ සඳහා රේඛීය ආයතන සමග ශක්‍යතා අධ්‍යයනයක් සිදුවෙමින් පවතී. තව ද අධ්‍යාපන අංශයට අයිති යෝජනාවක් එනම් මධ්‍යම ලැන්ක්ෂයර් විශ්ව විද්‍යාලයේ ශාඛාවක් ඇ. ඩො. මිලියන 40 වියදමින් ලංකාවේ පිහිටුවීම ද යෝජිත ය. එම යෝජනා සමාලෝචිත වර්ෂය තුලදී පහසුකරණය කරනු ලැබීය .

## ආංශීය කණ්ඩායම 3

සිය විෂය ක්ෂේත්‍රය යටතට වැටෙන ආයෝජනයන් සඳහා ඇති ඉඩකඩ ගවේෂණය කරනු සඳහා ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රධාන සමාගම් හා කණ්ඩායම් වලට පහසුකම් සැපයීම, මෙම අංශය විසින් සමාලෝචිත වර්ෂය තුළදී සිදුකරනු ලැබීය.

Brandix Apparels Ltd, Mas Active (Pvt) Ltd, Fergasm Garment Ind. Ltd., Timex Garments Ltd, Omegaline (Pvt) Ltd. හා Unichela (Pvt) Ltd යන සමාගම් විසින් උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වන "නැගෙනහිර නවෝදය" හා "උතුරු වසන්තය" යන වැඩසටහන් යටතේ සිය ඇඟළුම් ව්‍යාපෘති වල ප්‍රධාන ව්‍යාපෘත කිරීම්, පහසුකරණය කිරීම හා එම කාර්යන් විය. එම ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 42 ක් ආයෝජනය කෙරුණු අතර ඒවායින් උත්පාදනය කළ රැකියා නියුක්තිය 3500 ක් විය.

මෙම ආංශීය කණ්ඩායම විසින් කලාපිය වැඩසටහන් හා සේවා අපනයනය කිරීමේ අංශය යටතට ගැනෙන, එනම් ව්‍යාපාර 300යේ වැඩසටහන යටතේ උතුරු හා නැගෙනහිර පළාත් සඳහා කඩිනම් සංවර්ධන වැඩසටහන හා කලාපීය සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් අපනයන මූලික සේවා යන වැඩසටහන් සඳහා පහසුකම් සපයන ලදී.

මෙම ආංශීය කණ්ඩායම විසින් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රීමා සිලෝන් සමාගමේ ඇ.ඩො. මිලියන 30 ක් වැයවෙතැයි අපේක්ෂා කෙරෙන ධාරිතා ව්‍යාප්තිය සහ ඇ. ඩො. මිලියන 35 කට වඩා වැඩිවේ යැයි අපේක්ෂිත හෝල්සිම් ලංකා (පුද්) සමාගමෙහි ධාරිතා ව්‍යාප්තිය හා ඇ.ඩො. මිලියන 15 කට වඩා වැඩිවෙතැයි අපේක්ෂිත ඇන්සල් ලංකා සමාගමෙහි ධාරිතා ව්‍යාප්තිය යන ව්‍යාපෘතීන් සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

## ආංශීය කණ්ඩායම 3 සමස්ත කාර්යසාධනය

## අංශය ක්‍රියාත්මකවීමේ අවස්ථා (නව ව්‍යාපෘති)

| තත්ත්වයන් | ඇඟළුම් | කලාපීය සේවා අපනයන | නිෂ්පාදන | ආංශීය එකතුව | සම්පූර්ණ ව්‍යාපෘති සංඛ්‍යාව | එක් එක් අංශයට හිමි ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| අනුමැතිය අපේක්ෂිත | 02 | 02 | 22 | 26 | 83 | 31% |
| අනුමත කල එහෙත් ගිවිසුම් වලට එළඹ නැති | 07 | 09 | 13 | 29 | 112 | 26% |
| ක්‍රියාත්මක කිරීමට ඇති | 11 | 55 | 30 | 96 | 224 | 43% |
| වාණිජ මෙහෙයුම් අපේක්ෂාවෙන් | 07 | 53 | 21 | 81 | 249 | 33% |
| වාණිජ මෙහෙයුම් වල යෙදෙන | 333 | 189 | 377 | 899 | 1583 | 57% |
| එකතුව | 360 * | 308 | 463 | 1131 | 2251 | 50%** |

* ඇඟළුම්හල් 200 වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති 152 ක් ඇතුළත් වී නොමැති

** දැනට ක්‍රියාත්මක වන මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් ව්‍යාපෘති 1,583 ක් ඉහත සඳහන් අංශ 3 යටතේ වැටෙයි. එම සංඛ්‍යාව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ එන ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 57% කි.



Colombo International Container Terminals Ltd.

## උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පණත යටතේ සාකච්ඡා පවත්වනු ලැබූ / අනුමත කරනු ලැබූ ප්‍රධාන ව්‍යාපෘති

2008 අංක 14 දරණ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පණත (සංශෝධිත) යටතේ වැටෙන ප්‍රධාන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම සහ සහන ලබාදීමේ කටයුතු වල ආංශීය කණ්ඩායම් 3 කාර්යශීලීව නිරත විය. ඒ අනුව එම ව්‍යාපෘති සඳහා බදු සහ අනිකුත් අයකිරීම් වලින් විශාල පරිමාණයේ සහන ලබා දෙන ලදී.

ඒ අනුව ලංකා වානේ සංස්ථාව වෙත උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති තත්ත්වයන් ප්‍රධානය කරනු ලදුව අතුරුගිරියෙහි යන්ත්‍රාගාරය 5 ක් පිහිටුවීමට අනුමැතිය ලබා දෙන ලදී. අපේක්ෂිත ආයෝජනය ඇ. ඩො. මිලියන 80 කි.

## ආයෝජන සේවා

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව අනුමැතිය ලබා දී ඇති ව්‍යවසායන්ගේ ආනයන / අපනයන සඳහා අවසර පත්‍ර ලබාදීමේ වගකීම ආයෝජන සේවා දෙපාර්තමේන්තු සතුවන අතර, ආයෝජකයන්ට අදාල වන පහත සඳහන් කාර්යයන් ඉටු කිරීම එහි වගකීම වන්නේ ය.


- ★ ආනයන/අපනයන භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම
- ★ උප කොන්ත්‍රාත්තු, මාරු කිරීම්, ප්‍රති-ආනයනය/ප්‍රති-අපනයනය නියාමනය කිරීම.
- ★ යුරෝපා හවුලේ රටවලට ඇගලුම් අපනයනය කිරීමේ දී, ප්‍රභවස්ථාන සහතිකය (Cirtificate of Origin) නිකුත් කිරීම.
- ★ ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල ආනයන සහ අපනයන පිළිබඳ සංඛ්‍යාන දත්තයන් පිළියෙළ කිරීම.
- ★ ආනයන සහ අපනයනයන් සඳහා රජය පනවා ඇති අයබදු එකතු කිරීම.
- ★ ප්‍රවාසික (Expatriate) වීසා නිකුත් කිරීම සඳහා නිර්දේශ කිරීම (කලාප ව්‍යවසායන් සම්බන්ධයෙන්)

ආයෝජන මණ්ඩල නිලධාරීන් විසින් ආනයන හා අපනයන රේගු ප්‍රකාශන (CUSDECS) අනුමත කරණු ලබන ලේඛනගත කිරීමේ මධ්‍යස්ථාන 5 ක්, කොළඹ, කටුනායක, බියගම, කොග්ගල සහ පල්ලේකැලේ වශයෙන් මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. එමෙන්ම, ආයෝජන මණ්ඩල ව්‍යාපාර වලින් ආනයන සහ අපනයන කෙරෙන භාණ්ඩ භෞතිකව පරීක්ෂා කිරීම සඳහා සත්‍යෝක්ෂණ මධ්‍යස්ථාන 12 ක් ආයෝජන මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබේ.

තව ද, 2011 වර්ෂය සඳහා අපේක්ෂිත අපනයන ඉපැයුම් ප්‍රමාණය ඇ. ඩො. මිලියන 5,800 ක් විය. නමුත් ලැබුණු සත්‍ය අපනයන වටිනාකම ඇ. ඩො. මිලියන 6,386 ක් විය. ඒ අනුව එය ඉලක්කගත අපනයන අගයට වඩා 10% ක වැඩිවීමකි.

## රේගු ප්‍රකාශන


**පිරිසැකසූ රේගු ප්‍රකාශන සංඛ්‍යාව**




| | 2010 | 2011 | වෙනස | වැඩිවීම (%) |
|---|---|---|---|---|
| ආනයන | 160114 | 167163 | 7049 | 4.22 |
| අපනයන | 275934 | 289187 | 13253 | 4.58 |

## ආනයන අපනයන අගයන් (රු. මිලියන වලින්)


ආනයන අපනයන අගයන් (රු. මිලියන වලින්)




| | 2010 | 2011 | වෙනස | වර්ධනය % |
|---|---|---|---|---|
| ආනයන | 379,833.00 | 486,495.00 | 106,662.00 | 21.92 |
| අපනයන | 569,305.00 | 711,558.00 | 142,253.00 | 19.99 |

## මෙහෙයවූ බහලුම් ප්‍රමාණය (ආනයන සහ අපනයන)

මෙහෙයවූ බහලුම් ප්‍රමාණය
(ආනයන සහ අපනයන)




| | 2010 | 2011 | වෙනස | වර්ධනය (%) |
|---|---|---|---|---|
| ආනයන | 58829 | 69533 | 10704 | 15.39 |
| අපනයන | 75678 | 90826 | 15148 | 16.68 |

## නෛතික සහාය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නීති දෙපාර්තමේන්තුව ආයෝජන මණ්ඩලය සහ ආයෝජකයන් වෙත වෘත්තීය මට්ටමෙන් නීති උපදෙස් / සේවා ලබාදීමේ වගකීම දරයි. එම අංශයෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ ආයෝජන ආශ්‍රිත නෛතික සේවා ලබාදීම සහ ආයෝජන මණ්ඩලයේ නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ ව්‍යාපෘති සම්බන්ධයෙන් ආයෝජන ගිවිසුම්වලට එළඹීමට පහසුකම් සැලැස්වීම ය. නීති දෙපාර්තමේන්තුව සිය කාර්යභාරය අනුව යමින්, ආයෝජන මණ්ඩලයට විරුද්ධව ගොනු කෙරුණු නීති කෘත්‍යන්හි දී හා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් එහි නීතිමය හිමිකම ආරක්ෂා කරලීම සඳහා නඩු පැවරීම් වලදී ආයෝජන මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටියි.

ආයෝජන නීතිමය සේවා සඳහා පහසුකම් සැපයීම උපදේශාත්මක ස්වරූපයක් උසුලන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්ති සහ උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ව්‍යාපෘතීන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින නීති යොදාගත යුතු ආකාරය පිළිබඳ දැනුවත් කිරිමත්, ශ්‍රී ලංකාව තුළ ඇරඹීමට අවසර ලැබූ ව්‍යාපෘති සම්බන්ධයෙන් සමාගම් ව්‍යවස්ථා සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු ඉටු කිරීමත්, ඒවා අනුමත කිරීමත් නීති දෙපාර්තමේන්තු කාර්යයන්ට අයත් වේ.

සමාලෝචිත වර්ෂය තුළදී, ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශ්‍රී ලංකාව තුළ නව ව්‍යාපාරික සංවිධාන 125ක් පිහිටුවීම සඳහා ගිවිසුම් සම්පාදනය කළේය. එම ගිවිසුම් අතර 2008 අංක 14 දරණ උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ සම්පාදනය කළ ගිවිසුම් 5 ක්ද විය. එම ගිවිසුම් 5 නම් වශයෙන් පහත දැක්වේ.

* ශැන්ග්‍රිලා ඉන්වෙස්ට්මන්ස් ලංකා (පුද්) සමාගම;
* ශැන්ග්‍රිලා හොටේල්ස් ලංකා (පුද්) සමාගම;
* කලම්බු ඉන්ටර්නැෂනල් කන්ටේනර් ටර්මිනල්ස් සමාගම;
* සිලෝන් හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්සල්ටන්සි සමාගම;
* කර්න් ලංකා (පුද්) සමාගම.

සමාලෝචිත වර්ෂය තුලදී නීති දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ යුතු ඉලක්කය ද ඉක්මවා යන තරමේ ගිවිසුම් සමූහයකට (125) එළඹීම, මෙම වර්ෂය තුළදී නීති දෙපාර්තමේන්තුව ලද විශිෂ්ඨ ජයග්‍රහණයේ සේ සැලකිය හැකිය. මෙයට අමතරව තවදුරටත් ආයෝජනය කිරීම, පවතින ව්‍යාපාරයන් ව්‍යාප්ත කිරීම, ව්‍යාපාර ස්වභාවය වෙනස් කිරීම, ව්‍යාපෘති නැවත ස්ථානගත කිරීම, දුර්වල කර්මාන්ත පවරාගෙන ඒවා පුනරුත්ථාපනය කිරීම ආදී වශයෙන් වූ ගිවිසුම් 221 කට එළැඹීම මෙම වර්ෂය තුළදී කරනු ලැබීය.

ඉහත සඳහන් කාර්යයන්ට අමතරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතු ඉඩම්, සිය කර්මාන්ත පිහිටුවීම සඳහා ආයෝජකයින් වෙත පවරාදීම් කටයුතු වලද සහභාගී වෙමින් නීති දෙපාර්තමේන්තුව සිය ආයෝජකයන් වෙනුවෙන් සිදුකෙරෙන මෙහෙය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

## යටිතල පහසුකම් සංවර්ධනය සහ ප්‍රාදේශීය කලාප මෙහෙයුම්

දැනට පවතින අපනයන සැකසුම් කලාප 12 හි යටිතල පහසුකම් සංවර්ධනයෙහි සමස්ථ සම්බන්ධීකරණය මෙන්ම පරිශ්‍රයන් හඳුනාගැනීම, යෝග්‍යතාව ඇගයීම, සහ නව අපනයන පිරිසැකසුම් කලාප පිහිටුවීම, තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයට අයත්වෙයි.

දැනට එම අපනයන සැකසුම් කලාප 12, කටුනායක, බියගම, කොග්ගල, මහනුවර, සීතාවක, මීරිගම, මල්වත්ත, වතුපිටිවල, හොරණ, පොල්ගහවෙල, මාවතගම සහ මිරිජ්ජවිල යන ප්‍රදේශවල පිහිටුවා ඇත. 2011 වර්ෂය අවසාන වන විට මෙම අපනයන සැකසුම් කලාප තුළ කර්මාන්ත 276 ක් ක්‍රියාත්මකවන අතර, ඒවායින් පුද්ගලයින් 126000 කට රැකියා සැපයිනි.

වෙනත් රටවල පවතින ජාත්‍යන්තර කාර්මික කලාප ආකෘතිය අනුව ආයෝජන මණ්ඩලයට අයත් අපනයන සැකසුම් කලාප සංවර්ධනය කළ යුතු යැයි ආයෝජන මණ්ඩලය විසින් 2010 වර්ෂයේ දී තීරණය කරන ලදී. ඒ අනුව කලාප තුළ ප්‍රධාන වෙනස් කිරීම සිදුවෙමින් පවතී. 2011 වර්ෂයේ දී යටිතල පහසුකම් දියුණු කිරීම, වෙනස් කිරීම් සහ ආරම්භක කටයුතු සඳහා රු. මිලියන 291.33 ක් වැය කරන ලදී.

සාම්පූර්හි බැර කර්මාන්පුරයක් පිහිටුවීමට අවශ්‍ය මූලික කටයුතු 2011 වර්ෂයේදී ආයෝජන මණ්ඩලය විසින් අරඹන ලදී. තව ද පුත්තලම ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කටයුතු අඛණ්ඩව සිදුකළ යුතු යැයි අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබේ. හම්බන්තොට, යාපනය මහ මඩකලපුව යන ප්‍රදේශයන්හි නව ආයෝජන ප්‍රවර්ධන

කලාප පිහිටුවීම සඳහා 2011 වර්ෂය තුළදී පරිශ්‍රයන් හඳුනාගනු ලැබීය.

විශේෂයෙන්ම රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයට අදාලව, ආයෝජන ව්‍යාපෘති වැඩි වැඩියෙන් ආකර්ෂණය සහ පහසුකරණය කිරීමේ අපේක්ෂාවෙන් යුතුව ඒ ඒ ආයෝජන කලාපයට අවශ්‍ය කරන පරිබාහිර යටිතල පහසුකම් නිර්මාණය කිරීමට හා ඉදිකිරීමට ආයෝජන මණ්ඩලය තීරණය කර තිබේ.

## පරිසර කළමනාකරණය

දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන කාර්යයන් පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

* මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ඇතිව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරය ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන් සඳහා පාරිසරික නිදහස් කිරීම් ලබාදීම.

  ජාතික පාරිසරික නියෝග (ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාදාමය) ප්‍රකාරව, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය (Environmental Impact Assessment - EIA) අවශ්‍ය වන ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් පවත්වන ලද සැසිවාරයන්ට සහභාගී වූ අතර, එමගින් අවසර පත් නිකුත් කිරීමේ ක්‍රියාවලිය පහසු කරන ලදී.

  මධ්‍යම පරිසර අධිකාරිය විසින් ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිත ආයතනය ලෙස පත් කරනු ලැබූ විට එම බලධරියා ලෙස කටයුතු කරයි.

* මධ්‍යම පරිසර අධිකාරිය සමග එක්ව පරිසර ආරක්ෂක අවසරපත් නිකුත් කිරීම.
* විදුලි සංනිවේදන කුළුණු පිහිටුවීමට යෝජිත පරිශ්‍රයන් සම්බන්ධයෙන් විදුලි සංදේශ නියාමන කොමිසම වෙත පරිසර නිර්දේශයන් නිකුත් කිරීම.
* පරිසරයට අදාල කාර්යයන් පිළිබඳව මහජන පැමිණිළි සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම සහ පරිසර දූෂණ පාලනය සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් සැපයීම.
* අපනයන සැකසුම් කලාප වලින් පිටවන කාර්මික අපද්‍රව්‍ය නියාමනය කිරීම.

ඉහත සඳහන් කරුණු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ

| කාර්යය | සංඛ්‍යා |
|---|---|
| 1. ව්‍යාපෘති අනුමත කිරීමේ බලධාරී ආයතනය ලෙස ක්‍රියාත්මක කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 02 |
| 2. අ) ව්‍යාපෘති සඳහා ලබාදුන් පාරිසරික අනුමැතීන් සංඛ්‍යාව | 86 |
| ආ) ව්‍යාප්ත කිරීම් සහ නැවත වෙනත් ස්ථානයක පිහිටුවීම සඳහා ලබාදුන් පාරිසරික අනුමැතීන් සංඛ්‍යාව | 24 |
| 3. නිකුත් කරන ලද / අළුත් කරන ලද පාරිසරික අවසරපත් සංඛ්‍යාව | 614 |
| 4. ගුවන් සංනිවේදන කුළුණු ඉදිකිරීම සඳහා ලබාදුන් පාරිසරික නිර්දේශ සංඛ්‍යාව | 497 |
| 5. විසඳන ලද පැමිණිලි සංඛ්‍යා | 9 |
| 6. පරිසර අධීක්ෂණය | |
| අ) කර්මාන්ත වලින් එකතු කරගත් අපද්‍රව්‍ය සාම්පල<br>ආ) අපද්‍රව්‍ය පිරිසිදු කරන සාමාන්‍ය යන්ත්‍රාගාරවලදී එකතු කරගත් සාම්පල | 881 |
| ඇ) ජල සාම්පල | 100 |

* ඉහත සඳහන් කරුණු වලට අමතරව, ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් පරිසරය පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්ති වලට අනුකූල වන බවට, පාරිසරික සහ ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය සමග සාකච්ඡා කොට වගබලා ගන්නා ලදී. මෙම ප්‍රඥප්ති වලට ශ්‍රී ලංකාව අත්සන් තැබූ අන්තරායකාරී අපද්‍රව්‍ය මායිම් හරහා ගෙන යෑම පිළිබඳ බාසල් ප්‍රඥප්තිය, ඕසෝන් ස්ථරය හීනකරණ ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය සහ ශ්‍රී ලංකාව අත්සන් තැබූ ප්‍රස්ථිතික ජෛන්ද්‍රීය දූෂක පිළිබඳ ස්ටෝක්හෝම් ප්‍රඥප්තිය වේ.

## විවිධ කාර්යයන්

* යෝජිත පුත්තලම ආයෝජන ප්‍රවර්ධන කලාපය සම්බන්ධයෙන් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව සම්පාදනය කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනයට සහය විය.

  ඉහත කී පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව දැනට වයඹ පළාත් පාරිසරික අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලදුව අනුමැතිය අපේක්ෂාවෙන් පසුවෙයි.

* 1993 අංක 1 දරණ ජාතික පාරිසරික නියෝග අනුව (ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාදාමය) කටුනායක කලාපයෙහි ඉදිකිරීමට යෝජිත තරු පහේ හෝටල් 2 ක් සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ නියෝජිත ආයතනය වශයෙන් මධ්‍යම පරිසර අධිකාරිය විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත් කරනු ලැබීය. පරිසර බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාදාමයට අනුව යමින් මෙම ව්‍යාපෘති දෙක සඳහා පරිසර අනුමැතිය ලබා දෙන ලදී.

* පරිසර අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ "හරිත ලංකා වැඩසටහනෙහි" කාර්යයන් සඳහා සහභාගී විය.

ඉහත කී ව්‍යාපෘතිය යටතේ ජාතික හරිත වාර්තාකරණ පද්ධතිය යනුවෙන් කර්මාන්ත සඳහා නව පද්ධතියක් එම අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙනු ලැබීය. එම ක්‍රමය වූයේ කර්මාන්ත විසින් තම කාර්ය සාධනය පවත්වාගෙන යෑමේ තිරසාරත්වය පිළිබඳව ජාත්‍යන්තර ප්‍රජාවට වාර්තා කළ යුතු ය යන්නය. මෙසේ පරිසරයේ තිරසාරත්වය රැකීමෙන් ආර්ථිකයත් සමාජයත් අධීක්ෂණයට ලක්වේ. මෙය යහපත් වෙළඳපල උපකාරකයක් යයි පිළිගත යුතු ය. මෙම පද්ධතිය හා එක්වන ලෙස ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්ත වෙත පහසුකම් සපයනු ලැබීය.

## ඉංජිනේරු අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති

ඉංජිනේරු අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම් වන්නේ,

(1) ඒ ඒ ආයෝජකයන්ගේ කැමැත්ත අනුව, ආයෝජන මණ්ඩලය යටතේ ඇති සියළුම ව්‍යාපෘතීන් සඳහා රජයේ ඉඩම් හඳුනාගැනීමට සහ ලබාගැනීමට ඔවුන් වෙත පහසුකම් සැපයීම;

(2) මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතේ ආරම්භ කරන ලද ව්‍යාපාර පරිශ්‍රයන් සඳහා එම ගිවිසුම් අත්සන් කිරීමට පෙර අදාල ඉංජිනේරු අනුමැතීන් ලබාදීම.

(3) ගිවිසුම් අත්සන් කළ පසු සියළුම ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් සඳහා, ඉදිකිරීම් කාලසීමාව තුලදී බදු නිදහස් කිරීම් සහිතව ගොඩනැගිලි ද්‍රව්‍ය නිකුත් කිරීම.

(4) ආයෝජන මණ්ඩලය විසින් අනුමත කරන ලද ගොඩනැගිලි නියමයන් ප්‍රකාරව, ව්‍යාපෘතීන්ට අදාල ගොඩනැගිලි සැලසුම් සඳහා අනුමැතිය ලබාදීම.

(5) අපනයන සැකසුම් කලාප වැනි විශේෂ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගැනීම.

(6) උතුරු නැගෙනහිර පළාත්වල ඇරඹෙන ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් සඳහා අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ අනුමැතිය ලබාගෙන ඉඩම් වෙන් කිරීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් කඩිනම් කිරීම.

### (අ) ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබාගැනීම පහසුකිරීම

ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යාපෘතීන් සඳහා දිවයින පුරා ඇති ආයෝජන මණ්ඩලය සතු ඉඩම් හෝ රජයේ ඉඩම් හෝ යොදා ගැනීම සොයා බැලීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයයි. මෙම කාර්යභාරයට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, වී අලෙවි මණ්ඩලය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා අනෙකුත් රජයේ දෙපාර්තමේන්තු වැනි ආයතන සමග සම්බන්ධීකරණය කිරීමේ දී හමුවන බාධක ලිහිල් කිරීමද, මෙම කාර්යයට අයත් ය. එසේ ඉඩම් මුදාගත් පසු රාජ්‍ය ඉඩම් සඳහා බදු ගිවිසුම් වලට එළඹීම ද, ඒවා ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැපයීම ද එම කාර්යයට අදාලවේ.

ඒ අනුව රාජ්‍ය ඉඩම් සම්බන්ධයෙන් අදාළ කාර්යයන් පහත සඳහන් පරිදි විස්තර කළ හැකිය.

(i) ඉඩම් මුදා හැරීම කඩිනම් කිරීම සහ ආයෝජකයින් විසින් අපේක්ෂා කරන ආකාරයේ විභව්‍ය ඉඩම් හඳුනාගැනීම හා ඒවා ලබාගැනීම සඳහා ඇති බාධක ඉවත් කිරීමට සහය වීම.

(ii) අදාල රාජ්‍ය ආයතනයන් සහ අනෙක් අමාත්‍යාංශයන් සම්බන්ධීකරණය කරමින්,සිය ව්‍යාපෘතීන් අඛණ්ඩව ගෙන යාමට සුදුසු පරිසරයක් ආයෝජකයන්ට සලසා දීමත්, එමෙන්ම අවශ්‍ය යටිතල පහසුකම් සේවා ලබාදීමත් වේ.

(iii) සමහර ආයෝජන මණ්ඩල ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය වන ඉඩම් පවරා ගැනීමට හා එම පවරා ගත් ඉඩම් එම ව්‍යාපෘතීන් සඳහා ලබාදීමටත් ආයෝජන මණ්ඩලය කටයුතු කරයි.

(iv) රටේ විවිධ දිස්ත්‍රික්කයන්හි පිහිටීම විවිධ ඉඩම් තෝරා ගැනීම පහසු කරවනු සඳහා, පෞද්ගලික හා රාජ්‍ය ඉඩම් පිළිබඳව පරිගණක ගත කළ ඉඩම් දත්ත බැංකුවක්, යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ. අවශ්‍ය ආයෝජකයකුට ආයෝජන මණ්ඩල වෙබ් අඩවිය හරහා මෙම ඉඩම් බැංකුව වෙත ප්‍රවේශ විය හැකිය.

## 2011 වර්ෂයේදී ලබන ලද ප්‍රගතිය

(1) ඉංජිනේරු අනුමැතීන් සහ විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුවේ ඉඩම් අංශය විසින් ක්‍රියාත්මක කෙරෙන "උතුරු වසන්තය" වැඩසටහන යටතේ උතුරු පළාත් දිස්ත්‍රික්ක කිහිපයක රාජ්‍ය හා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් සමහරක් ඉඩම් බදු ගැනීමට සමත් වූ අතර, මෙහි පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අරඹනු ලැබීය.

වවුනියා දිස්ත්‍රික්කය හා කිලිනොච්චි දිස්ත්‍රික්කය

(i) ඇ.ඩො. මිලියන 20 ක ආයෝජනයෙන් යුතුව පුද්ගලයින් 1000 කට රැකියා සැපයීමට යෝජිත ව්‍යාපෘතියක් ව්‍යාප්ත කිරීම සඳහා Omega Line (Pvt) Ltd. වෙත වවුනියා දිස්ත්‍රික්කයෙන් ඉඩම් අක්කර 22 ක් වෙන්කර දෙනු ලැබීය. එහි කර්මාන්තශාලා ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සමාගම විසින් දැනටමත් ආරම්භ කර ඇත.

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අරවියල් නගර්හි අක්කර 14 ක රජයේ ඉඩමක් ඇ.ඩො. මිලියන 4 ක ආයෝජනයෙන් හා රැකියා අවස්ථා 500 ක් නිර්මාණය කිරීම යෝජිතව, ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම යටතේ Mas Active (Pvt) Ltd. වෙත වෙන්කර දෙන ලදී. 2011 වර්ෂයේදී සමාගම ඉඩම් ගොඩ කිරීම නිම කළ අතර, ගොඩනැගිලි ඉදිකිරීම ඇරඹීමට ආසන්න ව සිටී.

(iii) යෝජිත ව්‍යාපෘතියක් ව්‍යාප්ත කිරීම සඳහා Mas Intimate (Pvt) Ltd. වෙත කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අරවියල් නගර්හි රජයට අයත් ඉඩම් අක්කර 15 ක් වෙන් කර දෙන ලදී එයින් අපේක්ෂිත ආයෝජනය ඇ. ඩො. මිලියන 6 ක් වන අතර අපේක්ෂිත රැකියා අවස්ථා සංඛ්‍යාව 600කි.

(iv) Timex Garment (Pvt) Ltd, සහ Furgson Garment Industries (Pvt) Ltd. විසින් යෝජිත ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම සඳහා මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට අයත් ඉඩමක් හා කර්මාන්ත හා වෙළඳ වෙළඳ අමාත්‍යංශයට අයත් මන්නාරමේ කර්මාන්ත උද්‍යානයෙහි පිහිටි ඉඩමක් ලබා දෙන ලදී.

(2) පුත්තලම් දිස්ත්‍රික්කයෙහි ඉදිකිරීමට යෝජිත විශේෂ ආර්ථික කලාපය

පුත්තලමෙහි කල්ලඩි ග්‍රාමයේ පිහිටි අක්කර 250 ක ඉඩමක් රජයේ ප්‍රධානයක් වශයෙන් අය කිරීමක් නොමැතිව ආයෝජන මණ්ඩලය වෙත පැවරීම සඳහා ඉඩම් කොමසාරිස් ජෙනරාල් දෙපාර්තමේන්තුව සමග සම්බන්ධව කටයුතු කරන ලදි. මෙම යෝජිත ඉඩම තුළ පදිංචිවී සිටින පවුල් ඉවත් කිරීමත්, ඔවුන්ට විකල්ප නිවාස සපයා දීමත්, පිළිබඳව පුත්තලම ප්‍රාදේශීය ලේකම්වරයා සමග සාකච්ඡා පැවැත්විය. අය කිරීමකින් තොරව රාජ්‍ය ප්‍රධානයක් ලෙස ඉඩම නිදහස් කර ගැනීම සඳහා කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

(3) හම්බන්තොට විශේෂ ආර්ථික කලාපයක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකරගෙන යනු ලැබේ.

(4) කලින් තිබූ කර්මාන්ත ශාලා 50 වැඩසටහන සහ කර්මාන්ත ශාලා 200 වැඩසටහන යටතේ ආරම්භ වී වසා දමන ලද ඇඟළුම් කර්මාන්තයන්, වසා දමන ලද ව්‍යාපාර නැවත නගාසිටුවීමේ වැඩසටහන යටතේ පහත සඳහන් කර්මාන්ත ශාලාවන් නැවත ක්‍රියාත්මක කරන ලදී.

* ප්‍රයිම් කලෙක්ෂන් (පුද්) සමාගමට අයත්ව තිබූ ඌරගස්මංහන්දියේ පිහිටි ඇඟළුම් කර්මාන්ත ශාලාව (කර්මාන්ත ශාලා 50වැඩසටහන) DS ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් වෙත බදු දෙනු ලැබීය.

* වසා දමා ඇති ගලේවල හීනටිගල ගාමන්ට් (පුද්) සමාගමට අයත් කර්මාන්තශාලාව (කර්මාන්තශාලා 200 වැඩසටහන) CIC ඇග්‍රි බිස්නස් (පුද්) සමාගම වෙත ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව මගින් බදු දීමේ කටයුතු සිදුවෙමින් පවතී.

* රඹුක්කන පිහිටි PTK එන්ටප්‍රයිසස් (පුද්) සමාගමට (කර්මාන්තශාලා 200 වැඩසටහන) අයත්ව තිබූ ව්‍යාපෘතිය බ්‍රැන්ඩික්ස් ලංකා (පුද්) සමාගම වෙත බදු දී ඇත.

* කර්මාන්ශාලා 50 වැඩසටහන යටතේ ආරම්භ වූ වීරකැටියෙහි පිහිටි රෙඩ් හාට් ෆැෂන් (පුද්) සමාගම නමින් කලින් හැඳින්වූ ආයතනය, ආයෝජන මණ්ඩලයට අයත් නොවන ඇඟළුම් කර්මාන්තශාලාවකට බදු දෙනු ලැබීය.

* ඉපලෝගම පිහිටි විනෝ ලංකා (පුද්) සමාගම (කර්මාන්ශාලා 200 වැඩසටහන) ආයෝජන මණ්ඩලයට අයත් රේන්බෝ ෆැෂන් (පුද්) සමාගම වෙත බදු දෙනු ලැබීය.

### (ආ) ඉංජිනේරු අනුමැතීන්

ආයෝජන මණ්ඩල පනතේ 17 වැනි වගන්තිය යටතට ගැනෙන ඕනෑම ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වන අවධියේ දී වැදගත් සන්ධිස්ථානයක් ලෙස සලකනු ලබන ප්‍රධාන කාර්යයන් හතරක් ඉංජිනේරු අනුමැතීන් අංශය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. පරිශ්‍ර අනුමැතිය ලබාදීම, ගොඩනැගිලි සැලසුම් අනුමැතිය ලබාදීම, ප්‍රමාණ සහතිකකරණය සහ අනුකූලතා සහතික නිකුත් කිරීම, එම ප්‍රධාන කාර්යයන් වේ.

1. පරිශ්‍ර අනුමැතිය දෙන ලද ලිපිය, පනතේ 17 වැනි වගන්තිය යටතේ වැටෙන ව්‍යාපෘතියක ආයෝජකයන්ට ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹීමට තිබිය යුතු පූර්ව සුදුසුකමකි. ව්‍යාපෘතියේ මෙහෙයුම් ඇරඹීමට බලාපොරොත්තු වන ආකාරය හා අදාල පරිශ්‍රය අධ්‍යයනය කිරීමෙන් පසු ඉංජිනේරු අනුමැතීන් අංශය විසින් මෙම සහතිකය නිකුත් කරනු ලැබේ. 2011 වර්ෂය තුළ පරිශ්‍රයන් 101 ක් අනුමත කරනු ලැබීය.

2. සියලුම ආයෝජකයන් ගොඩනැගිලි ඉදිකිරීම ඇරඹීමට පෙර තම ගොඩනැගිලි සැලැස්ම අනුමත කරවා ගත යුතු ය. ගොඩනැගිලි සැලැස්ම අදාළ නියෝගයන් හා උපදෙස් සමග සසඳා බැලීමෙන් පසු එය අනුමත කරනු ලැබේ. 2011 වර්ෂය තුලදී ඉංජිනේරු අනුමැතීන් අංශය ගොඩනැගිලි සැලසුම් 181 ක් අනුමත කළේය.

3. 17 වැනි වගන්තිය යටතේ වැටෙන ව්‍යාපෘතීන් වල යෝජිත ඉදිකිරීම් සඳහා බදු වලින් නිදහස්ව ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙන්වා ගැනීමේ අයිතිය ආයෝජකයන්ට හිමි වේ. එක් එක් අයිතමයෙන් / ද්‍රව්‍යයන් අවශ්‍ය ප්‍රමාණය ගණනය කර ආයෝජන සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්‍ෂ වෙත නිර්දේශ කිරීම ඉංජිනේරු අනුමැතීන් අංශයට අයත් කාර්යයකි. 2011 වර්ෂය තුලදී ප්‍රමාණ සහතික 1024 ක් නිකුත් කර ඇත.

4. ඉදිකිරීම් නිම වූ පසු එම පරිශ්‍රයන්හි ව්‍යාපාරික කටයුතු ඇරඹීමට පෙර ආයෝජකයන් විසින් අනුකූලතා සහතික ලබාගත යුතු ය. දෙපාර්තමේන්තුවට අයත් නිලධාරීහූ පරිශ්‍රය පරීක්‍ෂා කර බලා අනුමත සැලැස්ම අනුව ගොඩනැගිලි ඉදිකර තිබේ ද යන වග අධ්‍යයනය කර, බදු සහන පහසුකම් මත මෙරටට ගෙන්වන ලද ද්‍රව්‍ය යෝග්‍ය පරිදි ගොඩනැගිලි සඳහා උපයෝගී කර ඇත්තේදැයි පරීක්‍ෂා කරයි. 2011 වර්ෂයේ දී එවැනි අනුකූලතා සහතික 29 ක් නිකුත් කරන ලදී.

## කාර්මික සබඳතා

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන් අතර ඉහළ කාර්යක්‍ෂමතාවයක් ද, ඵලදායීතාවයක් ද ලබාගැනීමට යෝග්‍ය වන පරිසරයක් ගොඩනැගීම සඳහා යහපත් කාර්මික සබඳතා පවත්වාගෙන යෑමේ දී ඉතා වැදගත් මෙහෙයක් ඉටුකරයි. ඉහත කී පරමාර්ථය සපුරා ගැනීම සඳහා කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යයන් ඉටු කරනු ලබයි.

* ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් වන ව්‍යාපාරයන් අතර සේවක කළමනාකරණ සහයෝගීතාව, කාර්මික සාමය සහ සමගිය, ඉහළ ඵලදායීතාවය යන කරුණු ප්‍රවර්ධනය කිරීම, පහසුකරණය කිරීම සහ පවත්වාගෙන යෑම.

* අවශ්‍ය අවස්ථාවලදී ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි නියුතු සේව්‍යයන් සහ සේවා නියුක්තියන් වෙත උපදේශන සේවා නියාමන උපදෙස් සැපයීම.

* අපනයන සැකසුම් කලාපයන්හි ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල රැකියා නියුක්ති සේවා ඒකක හරහා ද, රැකියා බැංකු වෙබ් අඩවිය හරහා ද, සේවකයින් තෝරා ගැනීමට උපකාරී වන වැඩසටහන් සංවිධානය කිරීම මගින් ද, සිය මිනිස් බල අවශ්‍යතා සපයා ගැනීමට ආයෝජකයන්ට සහය වීම.

2011 වර්ෂයේදී පහත සඳහන් ප්‍රගතීන් උදාකර ගැනීමට කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව සමත් විය

* **කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යෑම**

  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල කම්කරු ප්‍රමිතීන් සහ සේවා සම්බන්ධතා සංග්‍රහයෙහි නියමකර ඇති කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යෑම අරමුණුකොට, ප්‍රධාන කාර්යාලයේ සහ කලාප වල සේවයේ නියුතු කාර්මික සම්බන්ධතා නිලධාරීන් විසින්, ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන් තුළ කලින් කලට කම්කරු විගණන පවත්වනු ලැබේ.

  2011 වර්ෂය තුලදී කලාපවල සහ ඉන් පිටත පිහිටි ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි කම්කරු විගණන 565 ක් පැවැත්වූ අතර, එහිදී වැරදි අඩුපාඩු නිවැරදි කිරීම සඳහා පියවර ගනු ලැබීය.

* **කම්කරු කළමනාකාරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම**

  ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන මෙවලම "සේවක සභා"වේ වෘත්තීය සමිති සමග සහයෝගීව ඒවා දිරිමත් කරමින් ආයෝජන මණ්ඩලයේ ව්‍යාපාරවල සේවක සභාවලට, කම්කරු කළමනාකරණ සහයෝගීතාව ප්‍රවර්ධනය සඳහා එම ව්‍යාපාර වල සේවා නියුක්තිකයෝ වැඩි වැඩියෙන් කළමනාකරණ සහයෝගීතා ප්‍රවර්ධනය වෙත යොමු කළහ.

  2011 වර්ෂය තුළදී කාර්මික සම්බන්ධතා දෙපාර්තමේන්තුව සේවක සභා 141 ක් ස්ථාපනය කොට, මෙහෙයුම් කටයුතු සිදුකිරීමට පහසුකම් සපයා ඇත.

  වෘත්තීය සමිති නිලධාරින්ට අවශ්‍ය සාමාජිකයන් හමුවීම පහසුකරවනු සඳහා කටුනායක, බියගම සහ කොග්ගල යන ප්‍රධාන කලාපයන්හි "පහසුකම් මධ්‍යස්ථාන" පිහිටුවනු ලැබීය.

  ඉහත කී කරුණු වලට අමතරව, 2011 වර්ෂය තුලදී ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි සේවා නියුක්තිකයන් සහ කළමනාකරණ නිලධාරීන් සඳහා සමාජීය කතිකා, සාමාන්‍ය දැනීම, සේවා ස්ථාන සහයෝගය, යහපත් කම්කරු පරිචයන්, සෞඛ්‍යය සහ ආරක්ෂාව ආදී මාතෘකා යටතේ දැනුවත් කිරීමේ වැඩසටහන් 71 ක් අදාල රාජ්‍ය ආයතන සමග සහයෝගයෙන් පවත්වනු ලැබීය.

* **කාර්මික ආරවුල් වෙනුවෙන් මැදිහත්වීම / නිරාකරණය කිරීම**

  ආයෝජන මණ්ඩල ව්‍යාපාර අතර කාර්මික සාමය සහ සමගිය ආරක්ෂා කිරීම සඳහා කාර්මික සබඳතා නිලධාරීහු එම ව්‍යාපාරවල පැන නගින කාර්මික ආරවුල් වලට මැදිහත් වෙති. 2011 වර්ෂයේදී එවැනි ආරවුල් 18 ක් සමථයට පත් කරන ලදී.

* **සේවක පත්වීම් උපකාරක වැඩසටහන**

  රැකියා අපේක්ෂාවෙන් සිටින තරුණ ප්‍රජාව සහ ආයෝජන මණ්ඩල ව්‍යාපාර අතර අන්තර් සම්බන්ධතා පහසු කිරීම ආයෝජන මණ්ඩල රැකියා බැංකු වෙබ් අඩවියෙන් සිදුකෙරේ. (www.boijobbank.com) මෙම සේවය මහජනතාවට ආයෝජන මණ්ඩල ව්‍යාපාරයන්හි ඇති රැකියා අවස්ථා දැන්වීම පිණිස නොමිලේ සිදුකරන සේවාවකි.

  2011 වර්ෂය තුලදී අපනයන සැකසුම් කලාපයන්හි ඇති රැකියා සේවා අංශයන්හි රැකියා අපේක්ෂිතයන් 60,463 ක් ලියාපදිංචි වී සිටි අතර, එයින් 59,929 ක් රැකියාවන්හි නිරත කරවීම සඳහා ව්‍යාපාරයන් වෙත යොමු කරන ලදී.

  ඊට අමතරව කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව අනිකුත් අදාල ආයතන සමග සම්බන්ධ වී රැකියා පොළවල් සංවිධානය කිරීමට පහසුකම් සලසයි. එහි පරමාර්ථය ආයෝජන මණ්ඩල ව්‍යාපාර වල පවතින රැකියා අවස්ථා සඳහා රැකියා සොයන්නන් වැඩි වැඩියෙන් ආකර්ශනය කර ගැනීමයි. 2011 වසර තුලදී එවැනි රැකියා පොළවල් 18 ක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලැබිණි.

## මාධ්‍ය හා ප්‍රචාරණය

ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය දෙපර්තමේන්තුව සතු වගකීම වන්නේ බාහිර සන්නිවේදනයයි. විවිධාකාරයේ ප්‍රේක්ෂකයන් (අයෝජකයින්) ආමන්ත්‍රණය කරමින් විවිධ මාධ්‍යයන් තුළින්, ශ්‍රී ලංකාවේ පවතින ආයෝජන අවස්ථා, ව්‍යාපාරික වාතාවරණය, ආයෝජන මණ්ඩලයේ සඵලත්වය ආදී කරුණු පිළිබඳව දැනුවත් කිරීම සඳහා 2011 වර්ෂයේදී ආයෝජන මණ්ඩලය කටයුතු කරනු ලැබීය.

2011 වර්ෂයේදී විවිධ මාධ්‍ය යොදා ගනිමින් ආයෝජන මණ්ඩලය ප්‍රචාරණ ව්‍යාපාරයන්හි යෙදිණි. ඒ සඳහා මුද්‍රිත ප්‍රවර්ධන පත්‍රිකා, පුවත්පත් වල දැන්වීම් පළ කිරීම, වාර්තා චිත්‍රපටි නිපදවීම යන කාර්යයන් ආයෝජන මණ්ඩලය විසින් සිදු කරනු ලැබීය.

මාධ්‍ය දෙපාර්තමේන්තුව විසින් 2011 වර්ෂයේදී ඉටු කරනු ලැබූ ප්‍රධාන කාර්යයන්:-

* මාධ්‍ය නිවේදන නිකුත් කිරීම;
* "ශ්‍රී ලංකාවෙහි ආයෝජනය කරන්න" යන මැයින් නව ප්‍රවර්ධන විස්තර පත්‍රිකාවක් ප්‍රචාරය කිරීම;
* පුවත්පත් දැන්වීම් ප්‍රචාරණය කිරීම හා වැඩි දියුණු කිරීම.

### විශේෂ අවස්ථා

* මොණරාගල බුත්තල පැවැති දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සහභාගී වීම.
* ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය දෙපාර්තමේන්තුව කම්කරු සබඳතා සහ ඵලදායීතා ප්‍රවර්ධන අමාත්‍යංශය සමග සහයෝගයෙන් 2011 දෙසැම්බර් 10 වන දින වැල්ලවායේ මහින්ද රාජපක්ෂ සම්මන්ත්‍රණ ශාලාවේදී රැකියා පොළක් සංවිධානය කරන ලදී. එම රැකියා පොළ දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනය හා සමගාමීව පැවැත්විණි. මෙම රැකියා පොළ වැල්ලවාය, බුත්තල සහ මොණරාගල යන ප්‍රදේශවල පදිංචි රැකියා විරහිත තරුණ තරුණියන්ට සුදුසු රැකියාවක් සොයා ගැනීමේ අනර්ඝ අවස්ථාවක් විය. සිය සේවක මණ්ඩල තෝරා ගැනීමට ප්‍රධාන පෙළේ ආයෝජන මණ්ඩල ව්‍යාපාර 26 ක් ඉක්මවා මේ සඳහා සහභාගී වූ අතර, එමගින් 1000 කට ආසන්න රැකියා අපේක්ෂිතයන්ට සමාගම් නියෝජිතයන් හමුවීමට මහඟු අවස්ථාවක් ලැබුණි. ඇත්ත වශයෙන්ම මෙය ඒ ප්‍රදේශවල තරුණ තරුණියන්ට අලුත් අත්දැකීමක් විය. මෙම කාර්ය සඳහා මාධ්‍ය දෙපාර්තමේන්තුව පුවත්පත් දැන්වීම්, පෝස්ටර්, අත් පත්‍රිකා හා ලිපි මගින් එම අවස්ථාව ප්‍රසිද්ධියට පත් කරන ලදී. මෙම ව්‍යාපෘතියේ දී මාධ්‍ය දෙපාර්තමේන්තුව කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කරන ලදී.

### ආයෝජන මණ්ඩලයේ වෙබ් අඩවිය කළමනාකරණය කිරීම

www.investsrilanka.com වෙබ් අඩවිය වෙත 2011 වර්ෂයේ දී ඇමතුම් මිලියන 7 කටත් වඩා ලැබුණි.

## පරිපාලනය

පරිපාලන දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා ඉතා විශාල මෙහෙයක් ඉටු කරයි. එය අනිකුත් සේවාදායක දෙපාර්තමේන්තු වෙත සහ කලාප කාර්යාල 14 වෙත ප්‍රශස්ත සේවයක් ඉටු කරයි. පරිපාලන දෙපාර්තමේන්තුව, අනෙක් දෙපාර්තමේන්තු හා කලාප සඳහා අවශ්‍ය ප්‍රවාහන, යටිතල පහසුකම් සහ අනෙකුත් ද්‍රව්‍ය නිසි වේලාවේදී සපයා දීමෙන්, ඒවායෙහි ඉලක්කයන් ළඟා කරවනු සඳහා පහසුකම් සපයයි. පරිපාලන දෙපාර්තමේන්තුව පහත සඳහන් උප ඒකකයන්ගෙන් සමන්විත වේ.

* ගබඩා හා සැපයුම් ඒකකය;
* ප්‍රවාහන ඒකකය;
* ගොඩනැගිලි නඩත්තු;
* සාමාන්‍ය පරිපාලනය; හා
* තැපැල් අංශය.

### 2011 වර්ෂයේදී උදාකර ගනු ලැබූ ප්‍රගතිය

2011 වර්ෂයේ දී පරිපාලන දෙපාර්තමේන්තුව, ආයෝජන මණ්ඩලයට අයත් දෙපාර්තමේන්තු ප්‍රතිව්‍යුහගත කිරීමේ කාර්යයෙහි කාර්යක්ෂමව යෙදුණි. ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත පිහිටි ආයෝජන මණ්ඩල ගොඩනැගිල්ලේ පස්වන මහල විදේශ කටයුතු අමාත්‍යාංශයට බදු දීම සඳහා ක්‍රියා මාර්ග ගනු ලැබූ අතර, එමගින් අතිරේක ආදායම් මාර්ගයක් උපයා ගැනීමට හැකිවිය.

ආයෝජන මණ්ඩලය සතු ගමනාගමනයට නොගැළපෙන වාහන නුදුරු අනාගතයේ දී ඉවත් කිරීමට කටයුතු ආරම්භ කරන ලදී.

### සැපයුම් ඒකකය

සැපයුම් ඒකකය විසින් 2011 වර්ෂයේ දී ලබාගත් භාණ්ඩ හා සේවා වල වටිනාකම රු. 73,290,089.24 ක් විය.

ආසිවර්ල්ඩ් පරිගණක පද්ධතිය සාර්ථකව සම්පූර්ණ කරනු සඳහා ඒ ඒ දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පරිදි පරිගණක 156 ක් සහ UPS 156 ක් ලබා ගන්නා ලදී.

## මානව සම්පත් කළමනාකරණය

### පිරිස් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

ආයෝජන මණ්ඩලයට අයත් සමස්ත මානව සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම පැවරෙන ප්‍රධාන දෙපාර්තමේන්තුව පිරිස් දෙපාර්තමේන්තුව වන්නේය. එයට අයත් ප්‍රධාන කාර්යයන් අතර,

* මානව සම්පත් සැලසුම්කරණය

    - වර්තමාන හා අනාගත මානව සම්පත් අවශ්‍යතා තක්සේරු කිරීම.

    - ඉහත අවශ්‍යතා සපුරා ගැනීම සඳහා, පත් කිරීම හා තෝරා ගැනීමේ ක්‍රියාවලින් ක්‍රියාත්මක කිරීම.

* කාර්යය සාධනය ඇගයීම

    - සේවා නියුක්තිකයන්ගේ කාර්ය සාධනය වාර්ෂිකව සමාලෝචනය කර අගයනු ලැබේ.

    - සේවා නියුක්තිකයන්ගේ කාර්ය සාධන මත පිහිටා වාර්ෂික වැටුප් වැඩිවීම් ලබාදීම.

    - සේවා නියුක්තිකයන්ගේ කාර්ය සාධනය, සුදුසුකම් මත සහ පළපුරුද්ද මත පිහිටා ඔවුන් ඉහළ ශ්‍රේණිවලට උසස් කිරීම.

* විනය පවත්වාගෙන යාම

    - සේවා නියුක්තිකයන්ගේ විනය පවත්වාගෙන යාම හා වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය වන ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

    - කම්කරු ප්‍රශ්න පිළිබඳව කම්කරු විනිශ්චය සභා, කම්කරු දෙපාර්තමේන්තුව, මානව සම්පත් කවුන්සලය සහ උසාවිය වැනි බාහිර ආයතන වල නඩුවලට සහභාගී වීම.

* පැමිණීම හා නිවාඩු වාර්තා පවත්වා ගෙන යාම

* සේවක සුභ සාධන කටයුතු

    - විවිධ මාදිලියේ ණය යෝජනා ක්‍රම සාරාණුකුල ජීවිත සහ දුබලතා රක්‍ෂණ ක්‍රම වෛද්‍ය පහසුකම් මරණාධාර යෝජනා ක්‍රම, නිල බස් ප්‍රවාහන සේවා , ප්‍රවාහන දීමනා හා පැමිණීම දිරි ගැන්වීමේ ක්‍රම ආදී විවිධ සහන ක්‍රියාත්මක කිරීම.

**2011 වර්ෂයේදී උදාකර ගන්නා ලද ජයග්‍රහණ හා කාර්ය සාධනයන්**

* පරිගණක ගතකර ඇති නව මානව සම්පත් පද්ධතියට අයත් (HCM) පුහුණු හා සංවර්ධන ඒකකය සහ සේවක ප්‍රතිලාභ ඒකකය ක්‍රියාත්මක කළ අතර, කාර්යසාධන කළමනාකරණ ඒකකය ද අවසාන අදියර දක්වා දියුණු කර ඇත.

* විධායක නිලධාරීන් 3 ක්ද, ලිපිකරු හා ආශ්‍රිත සේවා නියුක්තිකයන් 6 ක් ද, පොදු සේවා නියුක්තිකයන් 8 ක්ද, ආයෝජන මණ්ඩල සේවයට අලුතින් බඳවා ගනු ලැබීය.

* අනියම් සේවකයන් 13ක්ද, එක් කොන්ත්‍රාත් පදනම් සේවකයෙකු ද, එක් කළමනාකරණ ආධුනිකයෙකු ද, නිත්‍ය සේවක මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු ලැබීය.

* විධායක නිලධාරින් 22ක්ද, ලිපිකරු සහ ආශ්‍රිත සේවා නිලධාරීන් 8 ක්ද, ඉහළ ශ්‍රේණිවලට උසස් කරනු ලැබීය.

* මූල්‍ය හා ගණකාධිකරණය, මානව සම්පත් කළමනාකරණය, තොරතුරු තාක්‍ෂණය, පරිගණක භාවිතය, ලඝු ලේඛනය, ලේකම් සේවාවන්, කාර්මික පුහුණුව, විගණනය යන අංශයන්හි ලා සේවාස්ථ පුහුණු පාඨමාලාවන් සේවා නියුක්තිකයන් 33 දෙනෙක් සඳහා ලබා දෙන ලදී.


* සුභ සාධන සේවා යටතේ සේවා නියුක්තිකයන් 1094 දෙනෙකුට වෛද්‍ය පහසුකම් ද, 96 දෙනෙකුට මරණාධාර යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ද, 912 දෙනෙකුට වැටුප් ණය ද, 150 දෙනෙකුට වාහන ණය ද, 55 දෙනෙකුට නිවාස ණය ද (පොලී ප්‍රතිපූර්ණ පදනම මත), 34 දෙනෙකුට පා පැදි ණය ද, 875 දෙනෙකුට උත්සව හා විශේෂ අත්තිකාරම් ද, 98 දෙනෙකුට උත්සව වවුචර් පත් ද, නිල ප්‍රවාහන පහසුකම් සඳහා බස් රථ 19 ක්ද, 2011 වර්ෂය තුළදී ලබා දෙන ලදී.

**වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් කාර්යමණ්ඩලය**


| | | |
|---|---|---|
| ආචාර්ය උපාධිධාරීන් | - | 01 |
| ශාස්ත්‍රපති/විද්‍යාපති | - | 51 |
| නීතිඥයින් | - | 12 |
| ගණකාධිකරණ වෘත්තිකයින් | - | 04 |
| ඉංජිනේරු වෘත්තිකයින් | - | 11 |
| නගර සැලසුම්කරුවන් | - | 01 |
| මානව සම්පත් වෘත්තිකයින් | - | 03 |
| තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් | - | 04 |
| උපාධිධාරීන් | - | 232 |
| එකතුව | | 319 |

**මුළු ශ්‍රම හමුදාව**

2011 දෙසැම්බර් 31 වෙනිදා වන විට ආයෝජන මණ්ඩල සමස්ත සේවක සංඛ්‍යාව 1099 ක් විය




**ප්‍රධාන කාර්ය සාධන ක්ෂේත්‍රයන් සංසන්දනය කිරීම 2010-2011 සමග**




| | නවපත් කිරීම | සේවා උසස් කිරීම | රැකියා පුහුණුව ලබමින් |
|---|---|---|---|
| 2010 | 19 | 38 | 47 |
| 2011 | 17 | 30 | 33 |

## දෙපාර්තමේන්තුව පිළිබඳ සුවිශේෂී ප්‍රවෘත්ති

* පරිගණකගත කර ඇති මානව ප්‍රාග්ධන කළමනාකරණ වැඩසටහන (HCM) තවදුරටත් වර්ධනය කරමින්, පුහුණු සහ සංවර්ධන ඒකක ද සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී.

## ක්‍රියාකාරකම්

* වාර්ෂික පුහුණු සැලැස්ම පිළිවෙළ කිරීම.
* සේවාස්ථ පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
* සේවක මණ්ඩලය සඳහා පුහුණු අවස්ථා ලබාදීම අරමුණු කොටගෙන දේශීය හා විදේශීය පුහුණු සංවිධාන හා ආයතන සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම.
* විදේශ සම්පත් අමාත්‍යංශය සහ අනිකුත් විදේශීය සංවිධාන හා දෙපාර්තමේන්තුවලින් ද පුහුණු අවස්ථා සඳහා නිලධාරීන් නම් කිරීම ආදී කටයුතු සම්බන්ධීකරණය කිරීම.
* දේශීය හා විදේශීය ආයතන විසින් මෙහෙයවනු ලබන වැඩසටහන් සඳහා නිලධාරීන් නම් කිරීම.
* නිලධාරීන්ට අවශ්‍ය පුහුණු අවශ්‍යතාවන් හඳුනා ගැනීමට පුහුණු අවශ්‍යතා විශ්ලේෂණයන් පවත්වාගෙන යෑම හා එම අවශ්‍යතාවයන් පුහුණු සැලැස්මට ඇතුළත් කිරීම.
* කළමනාකාරීත්වය විසින් පවරනු ලබන පුහුණුව සහ සංවර්ධනය යටතට ගැනෙන වෙනත් කාර්යයන් ඉටු කිරීම.

### 2011 වර්ෂයේ දී සිදුකරන ලද සේවක මණ්ඩල පුහුණු කිරීම් පිළිබඳ සාරාංශයක්


| | විධායක | ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක | එකතුව |
|---|---|---|---|---|
| විදේශ පුහුණු අවස්ථා | 14 | - | - | 14 |
| ශාස්ත්‍රපති උපාධි වැඩසටහන | 2 | - | - | 2 |
| දේශීය පුහුණුව (මෘදු කුසලතා) | 286 | 75 | 2 | 363 |
| සේවාස්ථ පුහුණු වැඩසටහන් | 271 | 173 | 23 | 467 |
| එකතුව | 573 | 248 | 25 | 846 |

### ජයග්‍රහණයන්


* මානව ප්‍රාග්ධන කළමනාකරණ වැඩසටහනෙහි පුහුණු සහ සංවර්ධන ඒකකය සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.
* 2011 වසරේදී නිලධාරීන් 467 දෙනෙකු සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන් 7 ක් පවත්වන ලදී.
* ආයෝජන මණ්ඩල කාර්යමණ්ඩලය සඳහා විදේශ පුහුණු අවස්ථා 14 ක් සලසා දෙන ලදී.
* පුහුණු වැඩසටහන් සඳහා 2011 වර්ෂය තුලදී රු. 5,907,615.00 ක් වැය කරන ලදී.

### 2011 වර්ෂයේ දී අලුතින් බඳවා ගැනීම්

| තනතුර | පත්වීම් සංඛ්‍යාව |
|---|---|
| විධායක නිලධාරී මණ්ඩලය | |
| සහකාර අධ්‍යක්‍ෂවරු (ස්ථිර 1 කොන්ත්‍රාත් පදනම 1) | 02 |
| සම්බන්ධීකාරක (කොන්ත්‍රාත් පදනම) | 01 |
| මුළු පත් කිරීම් සංඛ්‍යාව (විධායක නිලධාරී) | 03 |
| ලිපිකරු හා සමාන්තර සේවා | |
| කළමනාකරණ සහකාර (ස්ථිර 5, කොන්ත්‍රාත් පදනම 1) | 06 |
| මුළු පත් කිරීම් සංඛ්‍යා (ලිපිකරු සහ ආශ්‍රිය සේවා) | 06 |
| පොදු සේවා නියුක්තිකයන් | |
| රියදුරු (ස්ථිර 1 අනියම් 1) | 02 |
| විදුලි ශිල්පී (අනියම් 1) | 01 |
| කාර්යාල සහායක (කොන්ත්‍රාත් පදනම) | 02 |
| කම්කරු (අනියම්) | 03 |
| මුළු පොදු සේවා පත් කිරීම් සංඛ්‍යාව | 08 |
| 2011 දී කරන ලද මුළු නව පත්වීම් සංඛ්‍යාව | 17 |



# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය - සංවිධාන ව්‍යුහය (2011-12-31)




✷දැනට තනතුර දරන්නා සේවයෙන් අස් වූ පසු තනතුර අහෝසි කරනු ඇත.

තනතුර

| | | |
|---|---|---|
| DG | - | අධ්‍යක්ෂ ජනරාල් |
| DDG | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් |
| ED | - | විධායක අධ්‍යක්ෂ |
| D | - | අධ්‍යක්ෂ |
| SM | - | ජ්‍යෙෂ්ඨ කළමනාකාර |

පිහිටි ස්ථානය

| | |
|---|---|
| ACT | - ගුවන් භාණ්ඩ පර්යන්තය |
| BEPZ | - බියගම අපනයන සැකසුම් කලාපය |
| CRO & KIP | - මධ්‍යම ප්‍රාදේශීය කලාපය සහ මහනුවර කාර්මික උද්‍යානය |
| CVT | - නැව්බඩු සත්‍යායන පර්යන්තය |
| HEPZ | - හොරණ අපනයන සැකසුම් කලාපය |
| JRO | - යාපනය ප්‍රාදේශීය කාර්යාලය |
| KEPZ | - කටුනායක අපනයන සැකසුම් කලාපය |
| MEPP | - මල්වත්ත අපනයන සැකසුම් කලාපය |
| MWEPZ | - මාවතගම අපනයන සැකසුම් කලාපය |
| NWRO | - වයඹ ප්‍රාදේශීය කලාපය |
| PEPZ | - පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය |
| SBJW | - සර් බාරොන් ජයතිලක මාවත කාර්යාලය |
| SEPZ | - සීතාවක අපනයන සැකසුම් කලාපය |
| SRO & KGEPZ | - දකුණු ප්‍රාදේශීය කාර්යාලය සහ කොග්ගල අපනයන සැකසුම් කලාපය |
| WEPZ | - වතුපිටිවල අපනයන සැකසුම් කලාපය |
| WTC | - ලෝක වෙළෙඳපොළ කාර්යාලය |
| MEPZ | - මීරිගම අපනයන සැකසුම් කලාපය |

▭ - පුරප්පාඩු

## පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන

පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව ආයෝජන ගැටළු පිළිබඳව පර්යේෂණ විශ්ලේෂණයන් සිදු කිරීම හා ආයෝජන ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ප්‍රතිපත්ති උපදේශන සැපයීම ද කරනු ලබයි. ජාත්‍යන්තර තරගකරුවන් අතර ශ්‍රී ලංකාව සමව තැබීම සඳහා මෙම දෙපාර්තමේන්තුව පර්යේෂණවල යෙදෙයි. ප්‍රතිපත්ති උපදේශන කටයුතු වලදී එය ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමග සහයෝග යෙන් කටයුතු කරයි. පූර්ණ කාලීන වෘත්තීය කාර්යමණ්ඩලයක්ද, සහය සේවක මණ්ඩලයක්ද, දෙපාර්තමේන්තුව සතුය. විටින් විට ද්විපාර්ශවික සහ කලාපීය ගිවිසුම් සම්බන්ධයෙන් අවශ්‍ය වන්නා වූ තාක්ෂණික දැනුම, අවස්ථානුකූලව බාහිර විශේෂඥයන්ගෙන් ලබාගන්නා අතර, අපනයන සැකසුම් කලාප වැඩි දියුණු කිරීමේ කාර්යයන්හි ද නිරත වෙයි.

මෙම වර්ෂය තුලදී පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශක දෙපාර්තමේන්තුව, සේවාස්ථ සහ බාහිර අධ්‍යයනයන් 30 කට අධික සංඛ්‍යාවක් නිම කිරීමට සමත් විය. ඒවායෙන් බොහෝමයක් රටේ ව්‍යාපාරික පරිසරය වැඩි දියුණු කිරීමටත්, ආංශික මෙන්ම කලාපීය ප්‍රවර්ධනයේ දී අවශ්‍ය සංවර්ධන ක්‍රමෝපායන් සැපයීමටත් උපකාරී විය.

ප්‍රතිපත්ති ප්‍රකාශ සැකසීමේ දී ප්‍රධාන අවධානය යොමු වූයේ ඖෂධ, සිමෙන්ති සහ තිරිඟුපිටි වැනි මෙරටට ආනයනය කෙරෙන ද්‍රව්‍ය සඳහා ආදේශ කළ හැකි කර්මාන්තයන් පිළිබඳවයි. එමෙන්ම සංචාරක, ආහාර සැකසුම්, වානේ ප්‍රතිඋත්පාදන, බලශක්තිය, පෞද්ගලික උසස් අධ්‍යාපනය, සීනි කර්මාන්ත සහ කර්මාන්ත ආංශීය පිරිවැය සහ ආනයන බදු ව්‍යුහයන් යන කරුණු පිළිබඳව ද අධ්‍යයනයන් සිදුකරන ලදී. එක් එක් අංශයන්හි විශේෂ කරුණු ආමන්ත්‍රණය කෙරෙන සුදුසු ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමෙන්, එම අංශයන්හි ධනාත්මක ප්‍රතිඵල ලබාගත බව එම අධ්‍යයනයන්ගෙන් පෙනී යයි. ශ්‍රී ලංකාවේ පවතින ඔට්ටු සෙල්ලං නීතින්හි (Gaming Laws) සිදුකරන නව නීති සම්පාදනයන් සඳහා පර්යේෂණ පත්‍රිකාවක් ද, පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශක දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබේ.

ක්‍රියාකාරී වැඩසටහන් සහ ප්‍රතිපත්ති වෙනස්කිරීම් ප්‍රචාරණයට, විවිධ අධිකාරීන් සහ ආයතන සමග සම්බන්ධතා ආරම්භ කිරීමත් පවත්වාගෙන යැමක් සඳහා මුල පුරන ලදී. මේ සඳහා විවිධ තලයන්හි තීරණ ගන්නන් සමග සාකච්ඡා කරමින් යෝජනා පත්‍ර ඉදිපත් කරමින් ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ වල අවශ්‍යතාව කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරවනලදී. එමෙන්ම රජය සහ අනිකුත් අදාල සංවිධානයන්, මෙම අවශ්‍යතාව මුදුන් පත් කර ගැනීමට සම්බන්ධීකරණය කරන ලදී. ප්‍රතිපත්ති සම්පාදනය හා සංවර්ධනය පිළිබඳ පසු විපරම් කටයුතු අඛණ්ඩව පවත්වාගන යනු ලැබීය.

2011 වර්ෂය තුලදී පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව කටාර් රාජ්‍යයය හා බංග්ලාදේශය වැනි රටවල් සමග ද්විපාර්ශ්වික ආයෝජන ප්‍රවර්ධනය සහ ආරක්ෂණ ගිවිසුම් කෙටුම්පත් කිරීමට මැදිහත් විය. ආයෝජන ආරක්ෂණ ගිවිසුම් බොහොමයක් සඳහා අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කල අතර, ඒවා ප්‍රතිපාර්ශවීය ආයතන සමග ක්‍රියාත්මක කරන ලදී.

"පර්යේෂණ කණ්ඩායම" පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව තුළ ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමෙන්ම යෙදවුම්වලට වඩා ප්‍රතිඵල ගැන අවධානය යොමු කිරීමේ ප්‍රතිපත්තිය මත පිහිටා ක්‍රියා කරන අතර, සිය සාමුහික ප්‍රයත්නයන්හි දී බාධාවන් නොතකා ක්‍රියාකරයි.

## තොරතුරු තාක්ෂණය

### 1. දෙපාර්තමේන්තුව විසින් ඉටුකළ කාර්යයන් පිළිබඳ සාරාංශයක්

- ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ ගැටළු සඳහා විසඳුම් හඳුනා ගැනීම, ඇගයීම සහ ක්‍රියාත්මක කිරීම් සම්බන්ධයෙන් උපදෙස් සහ තාක්ෂණික සහයෝගය ලබාදීම.
- ආයෝජන මණ්ඩලය සතු ICT resource සැලසුම් කිරීම, නිර්දේශ කිරීම, සම්බන්ධීකරණය සහ ලබාගැනීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.
- පරිගණක ජාලයන් සහ දත්ත සන්නිවේදන පහසුකම් වැඩිදියුණු කිරීම සහ කළමනාකරණය කිරීම.
- ආයෝජන මණ්ඩලයට අවශ්‍ය මෘදුකාංග පද්ධති යොදාගැනීම සැලසුම් කිරීම, සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.
- පරිගණක භාවිතාකරන්නන්ගේ දෘඪාංග, මෘදුකාංග සන්නිවේදනය, ජාල, විද්‍යුත් තැපැල් සහ වෛරසයන් පිළිබඳ ගැටළු විසඳීම සඳහා උපකාරීවීම. (User Support).

* ව්‍යාපාරයන් නැවත ක්‍රියාකිරීමේ ප්‍රයත්නයන්හිදී, තොරතුරු තාක්‍ෂණය යොදා ගැනීම සම්බන්ධයෙන් අනිකුත් දෙපාර්තමේන්තු වලට උපකාරී වීම

* ඒකාබද්ධ දත්ත ශබ්දකෝෂයක සහ දත්ත පදනමක් හා ඒ ආශ්‍රිත ලේඛන පද්ධතියක් වර්ධනය කර පවත්වාගෙන යෑම.

## 2. 2011 වර්ෂයේදී නිම කරන ලද ව්‍යාපෘතීන්

### 2.2 තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

* පිහිටුවන ලද නව අංශයන්හි අවශ්‍යතා සපුරාලන අයුරින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 19, 24 සහ 26 යන මහල්වල පරිගණක ජාලයන් නැවත සැලසුම් කර වැඩ අරඹනු ලැබීය.

* කටුනායක පිහිටි ගුවන් භාණ්ඩ සතොක්ෂන කාර්යාලය වෙත සපයා තිබූ පරිගණක ජාලයට සම්බන්ධ කර ඇති අනෙකුත් සේවාවන්හි වඩා කාර්යක්‍ෂම කිරීමට, එම පරිගණක ජාලයේ කලාප පළල (Bandwidth) 64 kbps මට්ටමේ සිට 128 kbps මට්ටම දක්වා (දෙගුණයක් දක්වා) දියුණු කිරීම.

* නව ගිණුම් 36 ක් භාවිතයට ලබාදෙමින්, විද්‍යුත් තැපැල භාවිතා කරන්නන් ප්‍රමාණය 502 දක්වා වර්ධනය කිරීම.

* දැනට පවතින වැටුප් වාර්තා පද්ධතියෙහි කාර්ය සාධනය දියුණු කිරීමටත්, යෝජිත දියුණු කළ වැටුප් වාර්තා පද්ධතිය ක්‍රියාත්මක කිරීමටත් නව Server යක් සපයන ලදී.

* DNS, SQL හා විද්‍යුත් තැපැල් සේවාවේ උපස්ථ පද්ධතීන් (Back up) හා අන්තර්ජාලය හා සම්බන්ධ අනෙකුත් සේවාවන් හා සම්බන්ධ ප්‍රධාන පාලකය සඳහා ඉතා ඉහළ ධාරිතාවයක් ඇති පරිගණක 4 ක් මිලදී ගෙන දැනට භාවිතා කරමින් පවතියි.

* නව පරිගණක 138 ක්ද, ලැප්ටොප් 4 ක්ද, මුද්‍රක (Printers) 58 ක් ද, මිලදී ගන්නා ලදුව පරිගණක භාවිතා කරන්නන් සඳහා වඩා යහපත් වැඩකරන පරිසරයක් සහ දියුණු කරන ලද තොරතුරු තාක්‍ෂණ යටිතල පහසුකම් සපයා දෙනු ලැබීය.

* නවීන තාක්‍ෂණ වේදය සම්බන්ධයෙන් තම දැනුම සහ දක්‍ෂතා වැඩි දියුණු කරගැනීමට හැකිවන පරිදි නිලධාරීන් අට දෙනකු (8) සඳහා දේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදහ.

### 2.2 මෘදුකාංග සංවර්ධනය

* මාසික රැකියා නියුක්ති දත්ත විධිමත් කරනු සඳහා ද, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වල ද්විවාර්ෂික කාර්ය සාධන දත්ත විධිමත් කරනු සඳහා ද, ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) හා සම්බන්ධකර ඇති දත්ත ග්‍රාහක මොඩියුලය නවීකරණය කරන ලදී.

* නව කාණ්ඩ අංශ සංකල්පයට අනුකූල වන ආකාරයට ව්‍යාපෘති කළමනාකරණ තොරතුරු පද්ධතිය සහ ව්‍යාපෘති හා සම්බන්ධ අනෙකුත් පද්ධතීන් ද සංශෝධනය කරනු ලැබිය.

* නව අංගයන් එකතු කරමින් දැනට පවතින ප්‍රවේශ අවසරපත් නිකුත් කිරීමේ පද්ධතිය (Entry Permit Issuance System) වැඩි දියුණු කරන ලදී.

* ආයෝජක සේවා දෙපර්තමේන්තු සඳහා උප-කොන්ත්‍රාත් අධීක්‍ෂණ පද්ධතියක් සංවර්ධනය කර, අදාල සේවා මධ්‍යස්ථානයන් හි පිහිටුවනු ලැබීය.

* ආයෝජක සේවා දෙපාර්තමේන්තුව විසින් භාවිතා කරනු ලබන ආනයන අපනයන බදු අධීක්‍ෂණ පද්ධතිය (TIN Validation System) උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘතින් හී උප-කොන්ත්‍රාත්කරුවන්ට ද ගැලපෙන පරිදි වැඩි දියුණු කරන ලදී.

## අභ්‍යන්තර විගණනය

ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තරික පාලනයෙහි සහ ඒකාබද්ධ පාලනයෙහි ඵලදායීතාවය ඇගයීමද, වැඩිදියුණු කිරීම ද,අරහයා ක්‍රමාණුකුල හා විනයානුකූල ප්‍රවේශයක් මගින් ආයෝජන මණ්ඩල ආයතනික පරමාර්ථයන් සපුරාගනු සඳහා, ආයෝජන මණ්ඩලීය කාර්යයන්ට අගය එකතු කිරීම තහවුරු කිරීමත්, එහි මෙහෙයුම් වැඩි දියුණු කිරීමත්, කෙරෙහි අභ්‍යන්තරික විගණක අංශය ප්‍රධාන වශයෙන් යොමු වේ.

ආයතනික කටයුතුවලදී අවදානමට ලක්වීම අවම කරවීම අරමුණු කොට, අභ්‍යන්තරික පාලනය හැකිතාක් දුරට ආරක්ෂාකාරීව සහ නිවැරදිව පවත්වාගෙන යෑම තහවුරු කිරීමත්, ප්‍රතිපත්ති, රෙගුලාසි හා ක්‍රමවේදයන්ට අනුකූලවීම තහවුරු කිරීමත්, සඳහා අභ්‍යන්තර විගණන අංශය සමස්ථ ආයෝජන මණ්ඩලය ආවරණය වන අයුරින් කාලීනව විගණනයන් සිදු කරයි

එමනේම ISO 9001:2008 දරණ ජාත්‍යන්තර ප්‍රමිතිය මත පදනම් වූ ගුණාත්මක කළමනාකරණ පද්ධතිය අධීක්ෂණය කිරීමේ සහ පවත්වාගෙන යාමේ වගකීම ද අභ්‍යන්තර විගනන දෙපාර්තමේන්තුවට අයත් වෙයි. එහි දී ප්‍රධාන වශයෙන් ආයෝජන මණ්ඩලයේ සියළු ක්‍රියාදාමයන් ආවරණය කරයි.

ISO වැඩසටහනෙහි "කළමනාකරණ නියෝජිත" ලෙස අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ගුණාත්මක කළමනාකරණ පද්ධතීන් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සිදුකරයි. වැඩසටහන ලබාඇති කාර්ය සාධනය හා ගුණාත්මය ද, අඛණ්ඩව දියුණුකිරීමට අවශ්‍ය ක්ෂේත්‍රයන් පිළිබව ද, ඉහළ කළමනාකාරීත්වයට වාර්තා කරයි.

ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පවත්වනු ලැබූ වාර්ෂික විගණන පරීක්ෂණයට පසුව අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ගුණාත්මක කළමනාකරණ පද්ධති සමග අනුකූල වන්නේ දැයි පරීක්ෂා කිරීම සඳහා, ආයෝජන මණ්ඩලයේ සියළුම දෙපාර්තමේන්තු ආවරණය වන පරිදි ගුණාත්මක භාවය තහවුරු කෙරෙන අභ්‍යන්තර විගණන මාලාවක් පවත්වනු ලැබීය.

අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් ලබා දුන් උපදේශයන් අනුව යමින් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්තා කළමනාකරණ වැඩසටහන් ආරම්භ කර ඇත. අනුමත කාර්ය සැලැස්මෙහි ඇතුළත් වැදගත් සංධිස්ථානයන් මුදුන් පත් කරගැනීමට එම වැඩසටහන් නොනවත්වා ක්‍රියාත්මක කරගෙන යනු ලැබේ.

ඉහත කාර්යයන්හි නියැලෙන අතරම, අභ්‍යන්තර විගණන අංශය ඍජුවම සභාපති / අධ්‍යක්ෂ ජනරාල් වෙත සම්බන්ධ වෙමින් සිය ස්වාධීනත්වය පවත්වා ගන්නා ලදී. විගණන කමිටුව සමග සහයෝගයෙන් කටයුතු කරමින් එහි ක්‍රියාකාරකම් අඛණ්ඩව විමර්ෂනයට ලක්කරන ලදී.

## මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය සමාලෝචනය 2011**

| | රු.(මිලියන) |
|---|---|
| මෙහෙයුම් ආදායම | 2,148.82 |
| මෙහෙයුම් වියදම | 1,998.83 |
| **අය බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය** | 149.99 |
| පොලී ආදායමෙන් ගෙවූ බදු | 32.94 |
| **බදු ගෙවීමෙන් පසු මෙහෙයුම් කටයුතු වලින් ලැබුණු අතිරික්තය** | 117.05 |
| මෙහෙයුම් නොවන වියදම් | (33.45) |
| **ශුද්ධ අතිරික්තය** | 83.60 |

2011 වසර තුළ මෙහෙයුම් ආදායම රු. මි. 2148.82 ක් වූ අතර, එය 2010 වසරට වඩා 0.67%ක වැඩිවීමකි. එම වසරෙහි මෙහෙයුම් වියදම රු. මි. 1998.83 ක් වූ අතර එය 2010 වසරට වඩා 2.41%ක වැඩිවීමකි. එමෙන් අයබදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලින් ලද අතිරික්තය රු. මි. 149.99කි. එය පෙර වසරට වඩා 17.90%ක අඩුවීමකි.

2011 දෙසැම්බර් 31 වැනි දායින් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය රු. මිලියන 83.60 කි. එය පෙර වසර ට වඩා 41.41% ක අඩුවීමකි. 2010 වසර සමග සංසන්දනාත්මකව 2011 වර්ෂයේදී ශුද්ධ අතිරික්තය රු. මි. 59.07 කින් අඩුවිය. ඉහත කී අඩුවීමට ප්‍රධාන හේතුවක් වූයේ නිති කෘත්‍යක් ප්‍රකාරව ඩච් ලංකා ඇසසරීස් පුද්. සමාගමට ගෙවූ රු.මි. 32.72 යි.

## මෙහෙයුම් ආදායම

2010 වසරේ සිට 2011 වසර දක්වා කාලය තුළ බිම් කුලිය, වාර්ෂික ගාස්තු ආනයනය / අපනයන සේවා, ජලසැපයුම් සහ ප්‍රවේශ බලපත් ආදායමෙහි ආන්තික වැඩිවීමක් දක්නට ලැබුණි. ඒ අතරම ඉඩම් වාරික වලින් 2010 සිට 2011 දක්වා 13% ක වැඩිවීමක් දක්නට ලැබුණි.

මෙසේ ඉඩම් වාරිකයන්හි වැඩිවීමක් දක්නට ලැබුනේ කටුනායක, කොග්ගල, පල්ලේකැලේ,මල්වත්ත හා මීරිගම ආදී ආයෝජන සැකසුම් කලාපයන්හි ය.


ආනයනය / අපනයනය සේවා ගාස්තු වශයෙන් රු.මි. 580ක් ලැබුණු අතර, එය මෙහෙයුම් ආදායමින් 27% ක ප්‍රමාණයකි. එම මුදල මෙම වසරේදී මෙහෙයුම් ආදායමට ලද විශාලතම දායකත්වයයි.

2010 සිට 2011 කාලය තුලදී පහත සඳහන් ආදායම් මාර්ග වලින් ලැබුණු ආදයම් අඩු විය.


| | අඩුවීමේ ප්‍රතිශතය |
|---|---|
| පොලී ආදායම | 6 |
| ගිවිසුම /සැකසුම් ගාස්තු | 42 |

පොලී ආදායම් පහත වැටීම 2010 වර්ෂය හා සැසඳීමේ දී ආයෝජන පදනමෙහි අඩුවීමක් නිසා සිදුවිය.

ගිවිසුම/සැකසුම් ගාස්තු ආදායමෙහි පහත වැටීම 2011 වර්ෂයේදී සිදුවූයේ ඇ.ඩො. මි. 25 ට වැඩි ව්‍යාපෘති සඳහා සාමාන්‍ය අයදුම්පත් සැකසුම් ගාස්තුව වන ඇ.ඩො. 155 අයකිරීම් ප්‍රතිපත්තියෙහි වෙනසක් ඇති වූ හෙයිනි.





2007-2011 දක්වා මුළු වසර 5 පුරාම මෙහෙයුම් ආදායම් වැඩිවී ඇත.





## මෙහෙයුම් වියදම

2010 වසර සමග සැසඳීමේ දී 2011 වසරේදී මෙහෙයුම් වියදම 2.41% වැඩිවී ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2011 තක්සේරු වර්ෂය තුළ දී ලද පොලී ආදායම සඳහා රු. මි. 32.9 ආදායම් බද්දක් ගෙවීය. එසේම 2011 වර්ෂය තුල දී වැට් බදු වශයෙන් රු. මි. 137 ක් ගෙවනු ලැබීය.





2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වන අවු : 5 කාලසීමාව තුළ මෙහෙයුම් වියදම් පහත වගුවෙන් දැක්වෙන පරිදි වැඩිවීමක් සිදුවිය




## ප්‍රාග්ධන වියදම්

රු. මි. 306.42 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් අපනයන සැකසුම් කලාපයන් හි සහ කාර්මික උද්‍යානයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැය කරන ලදී. ප්‍රාග්ධන වියදම් සඳහා වැය කරන ලද්දේ සම්පූර්ණයෙන්ම ආයෝජන මණ්ඩලය විසින් අභ්‍යන්තර වශයෙන් උත්පාදනය කළ අරමුදල් වලිනි.



# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | 2011 (රු.) | 2011 (රු.) | 2010 (රු.) | 2010 (රු.) |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල, යන්ත්‍රාගාර උපකරණ | 22,129,212,413 | | 22,393,533,609 | |
| තාවකාලික අතිරික්ත අරමුදල - මහ බැංකුව | 988,430,100 | | 430,397,379 | |
| ක්‍රියාත්මකවන ප්‍රාග්ධන කාර්යයන් | 189,445,840 | | 182,256,166 | |
| විලම්බිත වියදම් | 437,594,339 | | 406,929,674 | |
| ඉවත් කිරීම සඳහා වෙන් කොට ඇති වතුපිටිවල | | | | |
| කලාපයේ නිවාස වල අගය | 5,401,000 | | 8,198,000 | |
| ව්‍යාපෘති මූලික වියදම් සඳහා අත්තිකාරම් | 147,747,661 | 23,897,831,353 | 414,685,630 | 23,836,000,458 |
| **ජංගම වත්කම්** | | | | |
| තොග | 12,507,390 | | 10,748,569 | |
| **ලැබිය යුතු මුදල්** | | | | |
| ව්‍යවසායයන්ගෙන් අය විය යුතු | 353,720,292 | | 382,459,356 | |
| සේවක ණය හා අත්තිකාරම් | 474,532,730 | | 336,550,552 | |
| වෙනත් ණය ගැතියන් | 53,515,522 | | 55,575,876 | |
| මූල්‍යාධාර වැඩසටහන | 63,065,244 | | 84,207,892 | |
| ලැබිය යුතු පොලී සහ තැන්පතු | 38,961,932 | | 85,289,944 | |
| කලින් ගෙවන ලද අත්තිකාරම් | 78,512,579 | | 11,039,973 | |
| කෙටිකාලීන ආයෝජන | 105,356,765 | | 1,249,509,100 | |
| අතැති මුදල් හා බැංකු ශේෂයන් | 177,230,133 | 1,357,402,587 | 244,131,099 | 2,459,512,361 |
| **මුළු වත්කම** | | **25,255,233,939** | | **26,295,512,819** |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| සුළු ණයකරුවෝ | 67,692,702 | | 296,223,967 | |
| උපචිත වියදම් | 158,777,519 | | 339,654,311 | |
| අත්තිකාරම් වශයෙන් ලැබීම් | 120,357,839 | | 173,671,470 | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 88,196,220 | **435,024,280** | 76,067,427 | 885,617,175 |
| **ස්ථාවර බැරකම්** | | | | |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 300,446,413 | | 279,671,634 | |
| ඉඩම් වාරික | 1,706,224,292 | 2,006,670,705 | 1,480,415,557 | 1,760,087,191 |
| **මුළු බැරකම්** | | **2,441,694,985** | | **2,645,704,366** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **22,813,538,954** | | **23,649,808,453** |
| ශුද්ධ වත්කම් / හිමිකාරිත්වය | | | | |
| සමුච්චිත අරමුදල | 7,457,162,441 | | 8,259,677,671 | |
| අරමුදල සහ සංචිත | 15,356,376,513 | | 15,357,251,680 | |
| යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විශේෂ අරමුදල | - | 22,813,538,954 | 32,879,102 | 23,649,808,453 |
| මුළු ශුද්ධ වත්කම් / හිමිකාරීත්වය | | 22,813,538,954 | | 23,649,808,453 |

මෙම මූල්‍ය ප්‍රකාශනය පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරණු ලබයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් තබන ලදී

එම්. එම්. සී ෆර්ඩිනැන්ඩෝ මයා
සභාපති/අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

පොලින් මාතායස් මහත්මිය
විධායක අධ්‍යක්ෂ (මූල්‍ය)
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2011 දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| මෙහෙයුම් ආදායම | 2011 (රු) | 2010 (රු) |
|---|---|---|
| බිම් කුලිය | 428,219,319 | 413,125,423 |
| වාර්ෂික ගාස්තු | 421,097,317 | 413,643,910 |
| ආනයන / අපනයන සේවා ගාස්තු | 580,307,410 | 548,239,018 |
| ව්‍යාපාර සඳහා ජලය සැපයීමෙන් ලද ශුද්ධ ලාභය | 240,045,374 | 226,854,682 |
| ඉඩම් වාරික | 43,917,015 | 38,832,634 |
| තැන්පතු වලින්/සේවක මණ්ඩල ණය වලින් ලද පොලිය | 143,865,424 | 152,383,006 |
| කුලී ආදායම | 61,304,496 | 61,751,213 |
| 16 වැනි වගන්තිය යටතේ ව්‍යාපාර අවසරපත් ගාස්තු | 19,686,244 | 19,086,126 |
| ඇතුළත්වීමේ අවසරපත් අලෙවිය | 92,393,340 | 86,593,817 |
| ගිවිසුම්/සැකසුම් ගාස්තු | 39,412,763 | 67,446,433 |
| නිවාස ව්‍යාපෘති හා අනිත් ව්‍යාපෘති වලින් ලද ලාභ | 21,833,105 | 22,641,072 |
| විවිධ ආදායම් | 56,734,714 | 83,861,029 |
| | **2,148,816,521** | **2,134,458,363** |
| **මෙහෙයුම් වියදම්** | | |
| සේවක මණ්ඩල වැටුප් | 892,705,908 | 816,943,094 |
| සේවක මණ්ඩල සුභසාධක වියදම් | 157,977,706 | 152,299,738 |
| ආයෝජන ප්‍රවර්ධන වියදම් | 22,295,456 | 22,789,421 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 21,698,563 | 23,105,626 |
| P/M පරිගණක සහ කාර්යාල උපකරණ ගාස්තු | 33,627,058 | 12,167,991 |
| ගොඩනැගිලි නඩත්තුව | 57,672,694 | 60,286,595 |
| ප්‍රවාහන ආශ්‍රිය වියදම් | 71,217,499 | 70,603,728 |
| සැකසුම් කලාප නඩත්තුව | 95,334,336 | 95,107,913 |
| කාර්යාල කුලී හා සතෝස්ක්ෂණ ඒකක කුලිය | 34,370,337 | 33,531,080 |
| ජල පරිභෝජනය | 5,677,192 | 6,237,595 |
| විදුලිය සහ බලශක්තිය | 48,054,503 | 45,131,604 |
| සංනිවේදන වියදම් | 28,157,326 | 25,755,397 |
| මහ නගර සභා වරිපනම් | 7,549,380 | 6,604,662 |
| ආරක්ෂක සේවා | 46,306,120 | 56,177,311 |
| පුවත්පත් දැන්වීම් | 2,124,369 | 967,690 |
| නිලධාරී පුහුණුව | 5,980,862 | 6,472,566 |
| නෛතිකහා වෘත්තීය ගාස්තු ගෙවීම් | 8,262,382 | 44,433,548 |
| පොදු වියදම් | 26,707,503 | 29,581,461 |
| පොදු වියදම් - රාජ්‍ය හා පුද්ගලික හවුල්කාරීත්වය පුළුල් කිරීම | | 332,500 |
| ඒකාබද්ධ සමාජ වගකීම් වියදම් | 1,250,000 | |
| ගමන් වියදම් සහ යැපීම්වියදම් | 3,850,994 | 3,863,184 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 25,852,810 | 38,412,616 |
| විගණන ගාස්තු | 1,800,000 | 1,570,000 |
| බොල් ණය සහ අඩමාන ණය | 47,970,747 | 34,497,402 |
| ක්ෂයවීම් | 352,385,570 | 364,909,171 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **1,998,829,314** | **1,951,781,895** |
| බදු ගෙවීමට පෙර මෙහෙයුම් අතිරික්තය | 149,987,207 | 182,676,469 |
| පොලී ආදායම මත බදු | 32,935,760 | 40,047,528 |
| බදු ගෙවීමෙන් පසු මෙහෙයුම ක්‍රියාකාරකම් වලින් ලැබූ අතිරික්තය | 117,051,447 | 142,628,941 |
| දේපල යන්ත්‍රෝපකරණ සහ උපකරණ විකිණීමෙන් ලැබූ ලාභ | (736,253) | 39,080 |
| විශේෂ අයිතම නඩු සහ සමථකරණය | (32,719,097) | |
| මුළු මෙහෙයුම් නොවන ආදායම/වියදම | (33,455,350) | 39,080 |
| **කාල පරිච්ඡේදය තුළ ලැබූ ශුද්ධ අතිරික්තය** | **83,596,097** | **142,668,021** |

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## 2011 දෙසැම්බර් 31 වැනිදයින් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 (රු. මි.) | 2010 (රු. මි.) |
|---|---|---|
| **මෙහෙයුම් වලින් ලද අරමුදල් ප්‍රවාහය** | | |
| **මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත අරමුදල් (අ-සටහන)** | 1,444.61 | 580.7 |
| ගෙවූ ආදායම් බදු | (260.03) | |
| ගෙවූ පාරිතෝෂිත | (28.63) | (11.3) |
| පෙර වසර සමග ගැලපීම් | (39.48) | 0.6 |
| **ශුද්ධ අරමුදල් ගලාඒම /පිටතට ගලායෑම් (මෙහෙයුම් කටයුතු වලින්)** | **1,116.48** | **569.9** |
| **ආයෝජන කටයුතු වලින් ලද අරමුදල් ප්‍රවාහ** | | |
| ආයෝජන ආදායම් | 143.87 | 152.4 |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (186.94) | (104.6) |
| ස්ථාවර වත්කම් අලෙවියන් ලද මුදල් | 3.62 | 0.8 |
| තාවකාලික අතිරික්ත අරමුදල් - මහ බැංකුව | (558.03) | (406.3) |
| නගර සංවර්ධනය | (248.08) | (27.7) |
| ප්‍රාග්ධන කටයුතු | (7.19) | 67.1 |
| ව්‍යාපෘතිවල මූලික වියදම් සඳහා වූ අත්තිකාරම් | 266.94 | (59.5) |
| විලම්භිත වියදම් | (64.59) | (51.2) |
| **ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ අරමුදල් ප්‍රවාහ** | **(650.41)** | **(429.1)** |
| **මූල්‍යකරණ කටයුතු වලින් ලද අරමුදල් ප්‍රවාහ** | | |
| භාණ්ඩාගාරය වෙත අරමුදල් මාරු කිරීම් | (500.00) | |
| යටිතල පහසුකම් සංවර්ධනය සඳහා විශේෂ අරමුදල් | (32.88) | |
| කාර්ය මණ්ඩලය සුභසාධන අරමුදල | (0.08) | (0.2) |
| **මූල්‍යකරණ කටයුතු වලින් ගලා ආ ශුද්ධ මුදල් / ප්‍රවාහ** | **(532.96)** | **(0.2)** |
| **මුදල් සහ මුදල් සාම්‍යයන්ගේ ශුද්ධ ඉහල යෑම / පහළයෑම** | **(66.90)** | **140.6** |
| **වර්ෂය මුලදී පැවැති මුදල් සහ මුදල් සාම්‍යයන්** | **244.1** | **103.5** |
| **වර්ෂය අගදී පැවැති මුදල් සහ මුදල් සාම්‍යයන් (ආ - සටහන)** | **177.23** | **244.1** |

| | 2011 (රු. මි.) | 2010 (රු. මි.) |
|---|---|---|
| **අ - සටහන** | | |
| **මෙහෙයුම් වලින් උත්පාදිත මුදල්** | | |
| මෙහයුම් වලින් ලැබූ ශුද්ධ අතිරික්තය | 83.60 | 142.7 |
| ක්ෂයවීම් | 352.39 | 364.9 |
| ගෙවන ලද ආදායම් බදු | 32.94 | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 49.40 | 67.5 |
| බොල් ණය සඳහා ශුද්ධ වෙන්කිරීම් | 47.97 | 11.4 |
| කපා හැරී බොල්ණය සඳහා (අධි/ඌණ) වෙන් කිරීම් | 25.14 | (3.1) |
| ආදායමට එකතු කළ ඉඩම් වාරික | (43.92) | (38.8) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබූ අලාභය / ලාභය | 0.74 | (0.0) |
| ආයෝජන ආදායම | (143.87) | (152.4) |
| විලම්භිත වියදම්වල ක්‍රම ක්ෂය | 33.93 | 30.0 |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය** | **438.32** | **422.1** |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| තොග | (1.76) | 0.1 |
| ව්‍යාපාරයන්ගෙන් ලැබිය යුතු | (4.00) | (25.1) |
| සේවක ණය සහ අත්තිකාරම් | (137.98) | (29.1) |
| අනික් ණය ගැතියෝ | (40.34) | (0.8) |
| මූල්‍ය ආධාර වැඩසටහන | 21.14 | 13.9 |
| ලැබිය යුතු පොලී | 46.33 | 16.8 |
| අත්තිකාරම් ගෙවීම් | (67.47) | 6.3 |
| කෙටිකාලීන ආයෝජන | 1,144.15 | (323.0) |
| ලැබූ ඉඩම වාරික (ශුද්ධ) | 269.73 | 283.3 |
| සුළු ණය කරුවෝ | (228.53) | 186.1 |
| උපචිත වියදම් | 46.21 | (1.1) |
| අත්තිකාරම් ලැබීම් | (53.31) | 37.4 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | 12.13 | (6.3) |
| **ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්කිරීම් වලින් පසුව මෙහෙයුම් අතිරික්තය** | **1,444.61** | **158.5** |
| **සටහන - ආ** | | |
| **මුදල් හා මුදල් සාම්‍යයන් විශ්ලේෂණය** | | |
| බැංකු / මුදල් ඉතිරි | 177.23 | 244.1 |
| ඇරයුම් තැන්පතු | 0.00 | |
| | **177.23** | **244.1** |

# 2011 දෙසැම්බර් 31 වන දිනට අදල මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

## ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) ඓතිහාසික පිරිවැය ප්‍රමිති භාවිතා කරමින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත. මෙම ගිණුම් වලට බලපානු ලබන උද්ධමන සාධකයන් සඳහා වන ගැලපීම් සිදුකර නොමැත.

(ආ) විදේශ විනිමය ප්‍රකාරව ප්‍රකාශිත මූල්‍ය වත්කම් හා වගකීම අවසාන ශේෂ දිනයට පැවැති විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ඇත. මෙකී පරිවර්තනය හේතු කොට ගෙන හටගත් සියලු විනිමය ලාභ හා අලාභ මූල්‍ය කාර්යාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

(ඇ) මහා පරිමාණ දේපල සංවර්ධන ව්‍යාපෘති හා නිවාස සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජන මණ්ඩල සතු ඉඩම් කල් බදු දීම.

මෙම ගිවිසුම් ප්‍රධාන වශයෙන් 1997 ඔක්තෝබර් මස 8 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අංක 97/4624/03/070 දරණ "ඉඩම් පවරා දීමේ ක්‍රියා පටිපාටි ක්‍රමානුකූලව කිරීම හා ආයෝජන මණ්ඩලය විසින් අනුමත මහා පරිමාණ ව්‍යාපෘති සඳහා සහන සැලසීම" යන මැයින් වූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ දක්වන ලද විධි විධානයන් මත පදනම් වේ.

ඒ අනුව ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද ඉඩමේ පවතින වෙළඳපල අගය අනුව බදුකරු විසින් වාරික වශයෙන් ගෙවීම් කළ යුතු වේ. අදාළ මූල්‍ය වර්ෂය තුළ ලැබුණු එවැනි වාරික, ඉඩම් විකිණීමෙන් ලද මුදල් ලෙස සලකනු ලැබේ. ඉඩමේ සාමානුපාතික පිරිවැය අඩු කිරීමෙන් පසු ලැබුණු ලාභය, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි "නිවාස හා අනෙකුත් ව්‍යාපෘති මත ලැබූ ලාභය" වශයෙන් දක්වා ඇත.

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

#### වත්කම් හා තක්සේරු කිරීමේ පදනම

#### ජංගම නොවන වත්කම්

කාර්යාලයීය ලී බඩු උපකරණ සහ පරිගණක හා පරිගණක ආශ්‍රිත කොටස් 2010 ජනවාරි පළවන දින නැවත තක්සේරු කරනු ලැබ ඇත. එම තක්සේරු කිරීමේ දී, පිළිවෙළින් රු. මි. 37.33 ක් සහ රු. මි. 28.41 ක් වූ අදාල නැවත තක්සේරු අතිරික්තයක් සංචිතයක් ලෙස පෙන්වා ඇත.

2010 ජනවාරි පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආම්පන්න ගණයට වැටෙන කාණ්ඩය ස්ථාවර වත්කම් ලෙස නොසැලකීමට ආයෝජන මණ්ඩලය තීරණය කර ඇත. ඒ නිසා රු. මි. 1.88 ක් වූ ආම්පන්න වල ඉතිරි පිරිවැය, කාර්යාල ලී බඩු හා උපකරණ නැවත තක්සේරු කිරීමේ ගිණුමට ඇතුළත් කරන ලදී. එසේ කරන ලද්දේ ඉහත කී භාණ්ඩ කාර්යාලීය ලී බඩු හා උපකරණ යටතේ ලැයිස්තුගත කර තිබූ හෙයිනි.

මෝටර් රථ වාහන සහ ව්‍යුහයන් 2006 සහ 2007 යන වර්ෂවලදී නැවත තක්සේරු කරන ලදී.

ඉඩම්. ගොඩනැගිලි හා යන්ත්‍රාගාර හා යන්ත්‍රෝපකරන 2009 වර්ෂයේදී නැවත තක්සේරු කරන ලදී.

පහත සඳහන් වාර්ෂික අනුපාතයන් භාවිතයට ගනිමින් සරල රේඛීය ක්‍රමයක් මත ස්ථාවර වත්කම් ක්ෂය කිරීම දක්වා ඇත.

| වත්කම් කාණ්ඩය | % |
|---|---|
| ගොඩනැගිලි | 5 |
| ව්‍යුහයන් | 5 |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 10 |
| සවිකුරු හා සවිකිරීම | 10 |
| කාර්යාලීය ලී බඩු හා උපකරණ | 10 |
| පෞද්ගලික පරිගණක | 33 1/3 |
| රථ වාහන | 20 |
| ආම්පන්න | 25 |

ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වීම් එම වත්කම් මිලදී ගත් වර්ෂයේ දී ගණනය නොකරන අතර, ඒවා බැහැර කරන වර්ෂයේදී ක්ෂය වීම් සම්පූර්ණයෙන් ගණනය කරනු ලැබේ.

1. කලාප අවට ප්‍රවාහන පහසුකම් වර්ධනය කිරීම සඳහා කල්බදු පදනම යටතේ සමුපකාර සමිතිවලට බස්රථ 15 ක් ලබාදෙන ලදී. මෙම බස්රථ භෞතික වශයෙන් හිමිකාරීත්වය සමුපකාර සමිති සතුව පැවතුණ ද, ඒවායේ නෛතික හිමිකාරීත්වය ආයෝජන මණ්ඩලය සතු විය. මෙම බස්රථවල ණය මුදල් සම්පූර්ණයෙන් හිලව් කරගෙන ඇත. 2011 වර්ෂයේදී, අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් අනුව මෙම බස්රථවල අයිතිය ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට පවරන ලදී.

2. නොනිමි වැඩසටහන් ඓතිහාසික පිරිවැය පදනම යටතේ ගණනය කර ඇත.

3. ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා මූලික වියදම් වශයෙන් ගෙවනු ලබන අත්තිකාරම් දීමනා මුලින්ම ඇස්තමේන්තු නොකරන ලද හෝ ශේෂ පත්‍ර දිනයට ඇස්තමේන්තු නොකරන ලද හෝ ඒවා අයවන තුරු දිගුකාලීන අත්තිකාරම් මුදල් ලෙස සලකනු ලැබේ.

4. වතුපිටිවල අපනයන සැකසුම් කලාපයෙහි පිහිටි බැහැර කිරීම සඳහා ඇති ඉතිරි නිවාස ඒකක පහත සඳහන් පරිදි ගිණුම් ගත කරන ලදී.

   * ගිවිසගත් විකුණුම් මිලට විකිණීමට සූදානම් කර ඇති නිවාස ඒකක. එම මිල පදනම්ව.

   * ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද වටිනාකම අනුව, තවමත් විකිණීමට තීරණය කර නොමැති නිවාස ඒකක - 2010 වසරේදී ප්‍රධාන තක්සේරුකරු විසින් දෙන ලද වටිනාකම 2011 වසරේදී නැවත ප්‍රධාන තක්සේරුකරු විසින්ම ප්‍රතිශෝධනය කරන ලදුව එය ගිණුම් සමග ගලපා ඇත. කට්ටි අංක 13 විකිණීමෙන් ලද මුදල් වල පියවීමට ඇති ශේෂය වාරික වශයෙන් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය දී ඇති අතර, එසේ ලැබුණු වාරික මුදල් ජංගම බැරකම් යටතේ වතුපිටි වල නිවාස සඳහා ලැබුණු වාරික යන ගිණුමට ඇතුළත් කරන ලදී. නිවසේ වටිනාකම සම්පූර්ණයෙන් ගෙවූ පසු එහි අයිතිය පවරා දෙනු ලැබේ.

5. ප්‍රධාන වශයෙන් ජන සමාජයෙහි සහ රටෙහි යහපත තකා, රජය වෙනුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති පවත්වාගෙන ගිය අවස්ථා දක්නට ලැබුණි. එම කාර්යයන් සම්පූර්ණ වූ පසු එම ව්‍යාපෘති අදාල බලධාරීන් වෙත භාර දෙන ලද්දේ එම ව්‍යාපෘති ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් හෝ එහි කාර්යයන්ට අදාල නොවන හෙයිනි. එනිසා එවැනි ව්‍යාපෘතීන් සඳහා වැය කරන ලද සියලු වියදම් නගර සංවර්ධන ගිණුමට ඇතුළත් කර, වර්ෂය අවසානයේ දී නගර සංවර්ධන ගිණුමෙහි පවතින ශේෂය සමුච්චිත අරමුදලට මාරු කරන ලදී. එසේ කරන ලද්දේ රාජ්‍ය අයිතිය පිළිබඳ නිවැරදි තත්ත්වය පිළිබිඹු කරනු සඳහා ය. ඉහත කී ස්වභාවයේ ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබෙන අරමුදල් ද නගර සංවර්ධන ගිණුමට ඇතුළත් කරන ලදී. එසේ කරන ලද්දේ එම ව්‍යාපෘතීන් හා සම්බන්ධ වියදම් ද නගර සංවර්ධන ගිණුම යටතේ ඇතුළත්කර ඇති බැවිනි.

6. **ඉඩම්**

   පහත සඳහන් ඉඩම් නිදහස් දීමනාවක් ලෙස පහත සඳහන් ආයතනයන්ට පවරා දී ඇති අතර ඒවායේ වටිනාකම් සමුච්චිත අරමුදල් ගිණුමට ඇතුළත් කර ඇත.

| ඉඩම් විස්තරය | වටිනාකම | පැවරුම්ලාභීන් |
|---|---|---|
| රෙජිඩේල් එස්ටේට්, පිළියන්දල | රු. 95,500,000 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය |
| ගලේවල හීනටිගල ගාමනට්ස් වෙත බදු දී තිබූ ඉඩම | රු. 768,000 | ප්‍රාදේශීය ලේකම් ආයතනයට ගලේවල |

   අනුරාධපුර දිස්ත්‍රික්කයේ රඹෑව සහ පුලියන්කුලම යන ගම්වල පිහිටි 1999 වර්ෂයේදී විකුණා, ඔප්පු ද සකසා තිබූ ඉඩම් 2 ක් වැරදීමකින් නැවත තක්සේරු කරනු ලැබ තිබේ. එම අගයන් සටහන් පොත් අගයන් ගෙන් හිලව් කර ඇත.

**ජංගම වත්කම්**

භාණ්ඩ තොග ඓතිහාසික පිරිවැයට අනුව ගණනය කරයි. ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් පදනම මත භාණ්ඩ නිකුත් කරන අතර, භාණ්ඩ තොග නිකුත් කිරීමේ දී ඒවා පොත් අගය මත සටහන් කරන ලැබේ.

### අයවිය යුතු දේ

වාර්ෂික ගාස්තු සහ මූල්‍යාධාර වැඩසටහන හැරුණු කොට ණයගැතියන් සඳහා 7.5%ක වෙන් කිරීමක් සිදුකර ඇත.

අවලංගු කල හා වසා දමන ලද ව්‍යාපෘතීන් වලින් අය විය යුතු දැ සඳහා 100% ක වෙන් කිරීමක් ද, වාර්ෂික ගාස්තුමත අයවිය යුතු ශේෂය සඳහා 15% ක වෙන් කිරීමක් ද සිදුකර ඇත.

මූල්‍යාධාර වැඩසටහන සඳහා 20%ක වෙන් කිරීමක් කර ඇත. එකී වැඩසටහනේ ගෙවීම් පැහැර හරින්නන් සඳහා සිදුකළ 100% වෙන් කිරීම රු. මි. 27.42 කි. ගෙවීම් පැහැරහැර ඇති ව්‍යවසායන් ලෙස නම්කර තිබූ එක් ව්‍යවසායක් ගෙවීමට එකඟ වූ බැවින් ඒ සම්බන්ධයෙන් පොදු විධිවිධාන අනුව කටයුතු කරන ලදී.

නියත ණයගැතියන් අතර සිටි සුළු ණයගැතියන් සඳහා කළ 100%වෙන් කිරීම රු. මි. 3.34විය.

සුළු ණය ගැතියන්ගෙන් අයවීමට තිබූ රු. මි. 40.374 ක් 2011 දෙසැම්බර් 31 දිනට කපා හරිනු ලැබ ඇත.

ලැබිය යුතු ගෙවීම් ප්‍රමාද වීම වෙනුවෙන් පොළී අයකරනු ලැබූ අතර, ඒවා අදාල ආදායම් මාර්ග සහ ණයගැතියන් යටතේ දක්වනු ලැබීය.

### මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

1. ආදායම් උපචිත පදනම මත සලකා බලනු ලැබේ.

2. ව්‍යවසායන් වෙත ජල සැපයුමෙන් ලද ශුද්ධ ආදායම්

   මෙය ගණනය කරනු ලබන්නේ ව්‍යවසායන්ට ජලය සැපයීමේ දී වූ වියදම (ජල කළමණාකරණය / කාර්යකරණය හා අප ජල පිරිපහදුව සඳහා වූ මුදල) අදාල ව්‍යවසායන් ගෙන් ජල සැපයීම සහ අප ජලය වෙනුවෙන් ලද මුදලින් අඩු කිරීමෙනි.

3. ස්ථාවර වත්කම් බැහැර කිරීම මත වන ලාභ හෝ පාඩු මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි දක්වා ඇත්තේ දේපළ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ අලෙවියෙන් ලද ලාභය හෝ පාඩුව යටතේ ය.

4. ආයෝජන මණ්ඩලයට අයත්ව තිබුණු හොරණ පර්ත් වතුයායේ හෙක්ටයාර 700ක් වූ රබර් වගාවේ කළමනාකරණය 1999 වසරේ සිට 2006 වසර දක්වා අවබෝධතා ගිවිසුමක් යටතේ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙත ලබාදෙන ලදී. අවබෝධතා ගිවිසුම ප්‍රකාරව, විගණනය කරන ලද ගිණුම්වලට අනුව, වසර අටක (8) කාලයක් සඳහා ශ්‍රී ලංකා රාජ්‍යයය වැවිලි සංස්ථාව මගින් ආයෝජන මණ්ඩලය වෙත ලැබිය යුතු මුදල් රු. මි. 16.4 කි. මෙම මුදල් ප්‍රමාණය අයකර ගැනීම සැක සහිත බැවින් එය ආදායමක් ලෙස ගිණුම් කර නැත.

5. ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය

   ඉහත යෝජනාක්‍රමය යටතේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 41 දෙනෙකු විශ්‍රාම ගිය අතර විශ්‍රාම පිරිවැය වූ රු. මි. 58.08 ක් වැටුප් සහ වේතන යටතේ දක්වා ඇත.

6. ව්‍යාතිරේක අයිතමය

   2011 මාර්තු 03 දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට විරුද්ධව දෙන ලද බේරුම්කරණ තීන්දුව අනුව රු. 32,719,096.90 ක වන්දියක්, එම දින සිට වන්දිය සම්පූර්ණයෙන් ගෙවන දිනය දක්වා නීත්‍යානුකුල පොලිය ද සමග ඩව් ලංකා ඇක්සසරීස් පුද්, සමාගම වෙත ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබුණි. එම ගෙවීම 2011 ජූනි 10 දින ගෙවන ලදී. මෙම ගෙවීම ව්‍යාතිරේක අයිතමයන් යටතේ පෙන්වා ඇත.

   අල්-එයින් ඉන්ටර්නැෂනල් පෙට්‍රෝලියම් ඩේරිවේටිව්ස් ට්‍රේඩර්ස් සමාගම විසින් ගිවිසුම් සැකසුම් ගාස්තු වශයෙන් ගෙවා තිබූ රු. 17,808,402.17ක මුදල ආපසු ගෙවන ලදී. එය පෙර වර්ෂයේ ගිණුම්වල පෙන්වා ඇත.

### විලම්භිත වියදම්

(අ) 2008 වර්ෂයේදී, ආයෝජන මණ්ඩලය විසින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් නවයක් (9) අත්පත්කර ගත් බැවින් 2008 වර්ෂයේ සිට වසර දහයක කාලයක් පුරා අභ්‍යන්තර අලංකරණය, බුමුතුරුණු ඇතිරීම සහ කාර්යාල කාමර වෙන්කිරීමේ පිරිවැය කපාහරිනු ඇත.

(ආ) කලාප සංවර්ධනය සඳහා වැය කරන ලද පිරිවැය වසර 20 කට වැඩි කාල පරිච්ඡේදයක් පුරා කපා හරිනු ලබයි.

**සේවක ප්‍රතිලාභ**

(අ) නියම කරන ලද ප්‍රතිලාභ සැලසුම්

ශ්‍රී ලංකාවේ ගිණුම් ප්‍රමිති (SLAS -16) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය නියමයන් යටතේ සියළු සේවකයන් සඳහා සේවයෙහි පළමු අවුරුද්දේ පටන් විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත. එසේ වුව ද 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව සේවා නියුක්තිකයකුට පාරිතෝෂික හිමිකම ලැබෙන්නේ ඔහු වසර (5) පහක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවය.

පාරිතෝෂික ලෙස ගෙවිය යුතු මුදල නියත වශයෙන් අගය කර නැත. සම්පූර්ණ කරන ලද සෑම සේවා වර්ෂයක් සඳහාම අඩමසක වැටුප ගෙවීමේ පදනම මත මෙම පාරිතෝෂිකය ගණන් බලනු ලැබේ.

පාරිතෝෂික ගෙවීම් සඳහා වන මුදල්, මුදල් අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන තාවකාලික අතිරික්ත භාරකාර අරමුදල හරහා භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර වල ආයෝජනය කර ඇත.

(ආ) නියම කරන ලද දායක සැලසුම්

සියලු සේවකවන් වෙනුවෙන් අර්ථසාධක අරමුදලට සහ භාරකාර අරමුදලට දායක වීමට ඇති බැඳීම ආදායම් ප්‍රකාශයෙහි වියදම් හැටියට දක්වා ඇත.

**අසම්භාව්‍ය වගකීම**

(අ) හොරණ අපනයන සැකසුම් කලාපයේ නිෂ්පාදනාගාරයක් ස්ථාපිත කර ඇති මර්බොක් එම්. ඩී. එෆ්. ලංකා (පුද්) සමාගම සමග ආයෝජන මණ්ඩලය ගිවිසුමකට අත්සන් තබා ඇත. එකී ගිවිසුම ප්‍රකාරව ලංකා විදුලි බල මණ්ඩලය මගින් අයකරන ගාස්තුවල සංයුක්ත වාර්ෂික අගය 6.9%ට වඩා ඉහළ යාම සඳහා එම සමාගම වෙත වන්දි ගෙවීමට ආයෝජන මණ්ඩලය බැඳී සිටියි.

බේරුම්කරණ තීන්දුව පරිදි 2007 සැප්තැම්බර් දක්වා ගෙවියයුතු රුපියල් 356,693,568.21. ක මුදල සමග අදාල පොලිය ගෙවීමට නියමකර අණකර ඇත.

ජාත්‍යන්තර බේරුම්කරණ තීන්දුව ඉවතලන ලෙස ආයෝජන මණ්ඩලය මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

(ආ) අන්තර් ජාතික මට්ටමේ ගොල්ෆ් පිටියක්, ධාවන පථයක් (Drive range) සමාජ ශාලාවක් ක්‍රීඩා සහ ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ බද්ධ නිවාස පංතියක් ආදිය තැනීමට සහ සේවයෙහි යෙදවීමට ඒෂියා පැසිෆික් ගොල්ෆ් කෝස් සමාගම සමග ආයෝජන මණ්ඩලය 2001 ජූනි 21 දින ගිවිසුමකට අත්සන් තබා ඇත.

2008 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය ලබාදී ඇති තීන්දුවක් අනුව, සිංගප්පූරුවේ නීති සමාගමක් වන Acquitas Law L.L.P සමාගම ඉහත සඳහන් ඒෂියා පැසිෆික් ගොල්ෆ් කෝස් සමාගම වෙනුවෙන් පෙනී සිටිමින් ආයෝජන මණ්ඩලයෙන් රු. 19,191,380,000 ක් අයවිය යුතු බව දන්වා ඇත. මේ සම්බන්ධයෙන් බේරුම්කරණ ක්‍රියාවලියක් සිංගප්පූරුවෙහි ආරම්භ වී ඇත.

**ආයෝජන**

තාවකාලික අතිරික්ත අරමුදල් ආයෝජන දිගු කාලීන ආයෝජන යටතේ දක්වා ඇත.

**පවත්නා නඩු කටයුතු**

අ. දැනට පවත්නා නඩු ලැයිස්තුවක් අමුණා ඇත. අදාළ සැබෑ වගකීම් නිවැරදිව නිශ්චය කළ නොහැක.

ආ. බියගම අපනයන සැකසුම් කලාපයේ මූල්‍ය හිඟයක් වශයෙන් අනෙකුත් ණය හිමියන් යටතේ රු. 507,650/= ක සමස්තයක් පෙන්නුම් කෙරේ. අදාල උසාවි නඩු කටයුතු මෙතෙක් අවසන් වී නැත.

**අදාළ පාර්ශ්ව පිළිබඳ හෙළි කිරීම්**

(1) ආයෝජන මණ්ඩලයේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් ජයම්පති බණ්ඩාරනායක මහතා පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි පාලක මණ්ඩලවල සේවය කළේය.

1. සීමාසහිත හේලීස් (පුද්) සමාගම
2. සීමාසහිත ෆින්ලේස් (පුද්) සමාගම

(2) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වන සංජීව වික්‍රමනායක මහතා හට ඇති පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායන් සම්බන්ධ පාලනය සහ / හෝ සුවිශේෂී බලපෑම් ඇති කිරීමේ හැකියාවක් පැවතුණි.

1. ඊ-ඩබ් ඉන්ෆොමේෂන් සිස්ටම්ස් සමාගම
2. ඒවිස් පෙරිෆරල්ස් (පුද්.) සමාගම
3. ඕපන් සිස්ටම් ඉන්ටග්‍රේටඩ් (පුද්) සමාගම - 2011 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා
4. ඕපන් සිස්ටම් ටෙක්නොලොජිස් (පුද්) සමාගම
5. ටොපෑන් පෝර්ම්ස් (කලම්බු) සමාගම

(3) ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික ඒශන ද සිල්වා මහතාට පහත සඳහන් ආයෝජන මණ්ඩල ව්‍යවසායන් සම්බන්ධ පාලනය සහ / හෝ සුවිශේෂී බලපෑම් ඇති කිරීමේ හැකියාවක් පැවතුණි.

1. මෙලන්කා පවර මොරකැටිය (පුද්) සමාගම)
2. විදුල් මඩුගෙට (පුද්) සමාගම

(4) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු වන අනුර ජයසිංහ මහතාට ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායන් සමග පාර්ශවීය ගනුදෙනු නොමැත.

# විගණන වාර්තාව

2011.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ
14(2)(සී) වගන්තිය ප්‍රකාර
විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No } ටීසී/ජී/බීඔඅයි/එෆ්ඒ/2011 ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2013 මාර්තු 19 දින

සභාපති ,
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය .

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට, ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1992 අංක 49 දරන පනතින් සංශෝධිත 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂම නීතියේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල . ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Dattaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone } 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

------------------

2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රී.ල.ගි.ප්‍ර) අනුකූල නොවීම

------------------------------------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන අනුව සේවකයින් 1091 ට අදාල පාරිතෝෂික වියදම හා පාරිතෝෂික ප්‍රතිපාදනය සමාලෝචිත වර්ෂය අවසානයට පිළිවෙලින් රු.49,402,310 ක් සහ රු.300,446,413 ක් විය. කෙසේ වෙතත් ශේෂ පත්‍ර දිනට ආදායම් ප්‍රකාශයේදී හඳුනාගත් ප්‍රතිලාභ බැඳීමේ වර්තමාන අගය සහ මුළු වියදමේ සම්බන්ධිත විස්තර ශ්‍රී .ල.ගි.ප්‍ර.16 අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

ආයෝජන මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශවල සටහන් මගින් අනාවරණය කර ඇති පරිදි ආදායම උපචිත පදනම මත ගිණුම් ගතකර තිබුණත් , බලපත්‍ර ගාස්තු සහ ගිවිසුම් ක්‍රියාවලි ගාස්තු මුදල් පදනම මත ගිණුම් ගත කර තිබුණි.

## 2.2.3 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) ලැබිය යුතු ගිණුම් හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය

ආයෝජන මණ්ඩලය අනුමත කරන ලද ව්‍යාපෘතිවල දීර්ඝ කාලීන ලැබිය යුතු හිඟ ශේෂවල විස්තර සහ 2011 දෙසැම්බර් 31 දිනට ලියා හල බොල්ණය විස්තර ඉකුත් වර්ෂ 5 සමඟ සසදා පහත දැක්වේ.

| විස්තරය | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| ව්‍යවසාය වලින් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු මුදල් | 623,861,381 | 631,911,594 | 593,483,063 | 539,768,967 | 489,179,378 | 572,994,819 |
| අඩමාණ ණය ප්‍රතිපාදනය | 270,141,090 | 249,452,238 | 227,775,883 | 199,355,398 | 140,704,693 | 94,017,637 |
| මුළු ලැබිය යුතු මුදල් වලින් අඩමාණ ණය ප්‍රතිපාදනයේ ප්‍රතිශතය | 43 % | 39 % | 38 % | 37 % | 29 % | 16 % |
| කපාහළ බොල්ණය | 73,113,266 | 8,306,417 | 9,279,995 | 8,994,408 | 45,234,172 | 26,465,290 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයෝජන මණ්ඩලයට ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් සඳහා වූ අඩමාණ ණය ප්‍රතිපාදනය 2006 දී 16 % සිට 2011 දී 43 % දක්වා පසුගිය වසර හය තුල සීග්‍රයෙන් ඉහළ ගොස් තිබුණි. දුර්වල අයකර ගැනීමක් පෙන්නුම් කරමින් වසන ලද සහ අවලංගු කරන ලද ව්‍යාපෘති ණයගැතියන් සඳහා 100 % ක් ප්‍රතිපාදන සැලසීම මීට හේතු වී තිබුණි.

(ii) වසන ලද සහ අවලංගු කරන ලද ව්‍යාපෘති හැරුණු විට එකතුව රු.41,042,493 ක් වූ බිම් කුලිය, වාර්ෂික ගාස්තු , ජල බිල්පත් සහ කාර්යාල කුලීවලට අදාල වසර 4 ට වඩා පැරණි හිඟ ණය සඳහා නිශ්චිත ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලස්වා නොතිබුණි.

(iii) වසර කීපයක් තිස්සේ ව්‍යාපාර තුනකින් මූල්‍ය සහාය වැඩසටහන් යටතේ හිඟව පවතින රු.27,423,101 ක් වූ ගාස්තු අයකර ගැනීමට මණ්ඩලය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iv) රු.623,861,381 ක් වූ ලැබිය යුතු මුළු මුදල් වලින් රු.197,445,217 ක් හෙවත් 32 % ක් වසර 4 කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවතුණි.

(v) 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.229,294,809 ක හිඟ වාර්ෂික ගාස්තු වලින් 70 % ක් හෙවත් රු.160,470,388 ක් බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණි.

(ආ) වෙනත් ණයගැතියන්

--------------------------

ආයෝජන මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට දිගු කලක් හිඟව පැවැති ණය ශේෂ, ඒ මත අඩමාණ ණය ප්‍රතිපාදනය හා කපා හල බොල් ණය පිළිබඳ විස්තර, ඉකුත් වසර 4 සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් ණයගැතියන් | 61,204,152 | 103,810,214 | 102,967,791 | 103,349,904 | 106,259,198 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන | 7,688,630 | 48,234,339 | 48,171,157 | 48,199,816 | 48,418,013 |
| අඩමාණ ණය සඳහා ප්‍රතිපාදනය, මුළු අයවීම්වල ප්‍රතිශතයක් ලෙස | 13 % | 46 % | 47 % | 47 % | 46% |
| කපාහල බොල් ණය | 40,378,653 | නැත. | නැත. | නැත. | නැත. |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අනෙකුත් ණයගැතියන් සඳහා වූ අඩමාණ ණය ප්‍රතිපාදනය 45 % කට වඩා වැඩි ප්‍රමාණයක් පසුගිය වසර 4 නියෝජනය කෙරුණි. 2010 වර්ෂය අවසානයට මුළු අනෙකුත් ණයගැතියන්ගෙන් රු. 40,378,653 ක් හෙවත් 39 % ක් රාජ්‍ය ආයතනවලින් ලැබිය යුතු වූ අතර එය වසර 4 ඉක්මවා හිඟව තිබුණි. එය සමාලෝචිත වර්ෂය තුළදී මුදල් රෙගුලාසි 108 ට පටහැනිව කපා හැර තිබුණි.

(ii) අනෙකුත් ණයගැතියන් පිළිබඳ කාල විශ්ලේෂණය අනුව වසර 4 ඉක්ම වූ හිඟය රු. 59,206,839 ක් හෙවත් මුළු අනෙකුත් ණයගැතියන්ගෙන් 97 % ක් විය.

### 2.2.4 නීති, රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | විස්තර |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 10 (3) වගන්තිය | ආයෝජන මණ්ඩලය අදාල ඇමතිවරයාගේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය රහිතව කාර්ය මණ්ඩල යහසාධන අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2000 ජනවාරි 31 දිනැති අංක පීඑෆ්/පීඊ 6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව ආයෝජන මණ්ඩලය එහි සේවකයන් වෙනුවෙන් තම අරමුදලෙන් උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. 1997 සිට 2011 දක්වා එසේ ගෙවන ලද මුදල රු.147,190,308 ක් විය. |
| (ඇ) | 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය , 2007 ජනවාරි 2 දිනැති අංක ඩීඑම්එස්/ඒ2/බීඑඅයි දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපිය (2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය පදනම්ව ) සහ 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | විධිමත් අනුමැතියකින් තොරව ආයෝජන මණ්ඩලයේ සේවකයන්ට පහත සඳහන් දීමනා භුක්ති විඳින්නට අවස්ථාව සලස්වා දී තිබුණි. එනම් මාණ්ඩලික නිලධාරීන්ට තම කැමැත්ත පරිදි රාජකාරි රියැදුරකු වෙනුවට පුද්ගලික රියැදුරකු සේවයේ යොදවා මාසිකව රු. 15,000 ක දීමනාවක්, පැමිණීමේ දිරි දීමනාවක්, වෘත්තීය දීමනාවක් ආදී වශයෙන් 2011 වර්ෂය තුල ගෙවන ලද මුළු මුදල රු. 80,966,370 ක් විය. |

3. මූල්‍ය සමාලෝචනය

-------------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 83,596,097 ක ශුද්ධ අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.142,668,020 ක ශුද්ධ අතිරික්තයක් විය. ඒ අනුව ශුද්ධ අතිරික්තයේ රු. 59,071,923 ක අඩුවීමක් දැක්වුණු අතර ඊට බලපෑ තිබුණේ ගිවිසුම් ක්‍රියාවලි ගාස්තු ආදායම අඩුවීම සහ මුද්‍රිත නිවේදන වියදම් සහ පරිගණක සහ කාර්යාල උපකරණ නඩත්තු වියදම් වැඩිවීමයි.

4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

4.1 කාර්ය සාධනය

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අපනයන සැකසුම් කලාප , අපනයන සැකසුම් අංගන, කාර්මික අංගන, ප්‍රාදේශීය කාර්යාල සහ නව ආර්ථික කලාපවල කාර්ය සාධනය ඉකුත් වර්ෂ 4 ක් සමඟ සසඳා පහත දැක්වේ.

| සංරචකය | වර්ෂය සඳහා බදුවලට පෙර මෙහෙයුම් කටයුතු වලින් අතිරික්තය / (පාඩුව ) | | | | |
|---|---|---|---|---|---|
| | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| ප්‍රධාන කාර්යාලය | 12,735 | 45,582 | 55,205 | 3,181 | 85,555 |
| අපනයන සැකසුම් කලාප : | | | | | |
| කටුනායක | 45,528 | 47,687 | 14,016 | 50,120 | 45,271 |
| බියගම | (51,989) | (36,989) | (39,927) | (11,078) | (14,627) |
| සීතාවක | 121,715 | 108,245 | 87,203 | - | - |
| මීරිගම | (11,418) | (11,584) | (18,720) | (22,978) | (16,624) |
| වතුපිටිවල | (15,743) | (13,703) | (12,787) | (11,872) | (18,214) |
| හොරණ | 30,578 | 27,430 | (1,439) | 4,252 | 4,665 |
| මාවතගම | (7,418) | 8,412 | (20,021) | (6,986) | (4,869) |
| පොල්ගහවෙල | (2,170) | (4,167) | (5,308) | (4,689) | (4,977) |
| කොග්ගල | (26,980) | (17,503) | (23,149) | (23,412) | (42,364) |
| ආනයන සැකසුම් අංගනය : | | | | | |
| මල්වත්ත | (3,226) | (3,458) | (3,639) | (2,576) | (6,237) |
| කාර්මික අංගන : | | | | | |
| මහනුවර | 29,388 | 16,491 | (3,082) | (2,236) | (4,929) |
| මිරිජ්ජවිල | 238 | 341 | 643 | (2,561) | (19,214) |
| සීතාවක | නැත. | නැත. | නැත. | 100,158 | 149,401 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රාදේශීය කාර්යාල : | | | | | |
| වයඹ | 22,256 | 12,112 | 14,001 | 9,285 | 3,587 |
| නැගෙනහිර | 6,493 | 3,780 | 648 | 1,123 | (339) |
| මධ්‍යම | නැත. | නැත. | 18,698 | 13,285 | 11,971 |
| දකුණ | නැත. | නැත. | (3,546) | (1,416 ) | (5,310) |
| එකතුව | 149,987 | 182,676 | 58,796 | 91,600 | 162,746 |

ආයෝජන මණ්ඩලය එහි කාර්යයන් අපනයන සැකසුම් කලාප 9 ක් , එක් අපනයන සැකසුම් අංගනයක්, කර්මාන්ත අංගන 2 ක් සහ ප්‍රාදේශීය කාර්යාල 2 ක් මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. ඉහත කී තොරතුරු අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අපනයන සැකසුම් කලාප 8 කින් (සීතාවක අපනයන සැකසුම් කලාපය ආරම්භ කර තිබුණේ 2009 වර්ෂයේදීය.) 2007 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුල අඛණ්ඩව ලාභ උපයා තිබුණේ එක් කලාපයකින් පමණි.

(ii) එකී කාල පරිච්ඡේදය තුල කලාප 5 ක් අඛණ්ඩව පාඩු ලබා තිබුණි. එසේම එකම අපනයන සැකසුම් අංගනය එකී කාල පරිච්ඡේදය තුලදී පාඩු ලබා තිබුණි.

(iii) ඊට අමතරව, ප්‍රධාන කාර්යාලයේ බදු වලට පෙර මෙහෙයුම් කටයුතුවලින් ජනිත වූ අතිරික්තය 2009 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුල රු.මිලියන 55.2 සිට රු. මිලියන 12.7 දක්වා 77 % කින් දැඩි ලෙස පහත වැටී තිබුණි.

(iv) තවද, ඉකුත් වර්ෂය හා සැදීමේදී බියගම අපනයන පිරිසැකසුම් කලාපයේ අඛණ්ඩ පාඩුව රු.මිලියන 15 කින් හෙවත් 41 % කින් වැඩි වී තිබුණි.

(v) ප්‍රාදේශීය කාර්යාල 2 ක ලාභදායීත්වයේ වර්ධනයක් පෙන්නුම් කළත් , සමාලෝචිත වර්ෂයේ බද්දට පෙර මෙහෙයුම් කටයුතු වලින් ජනිත මුළු ලාභය ඉකුත් වසර හා සැසඳීමේදී රු.මිලියන 32.7 කින් හෙවත් 17.9 % කින් අඩු වී තිබුණි.

කෙසේ වෙතත් , කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම අනුව අපනයන පිරිසැකසුම් කලාප ඇති කර ඇත්තේ ලාභ ලැබීමට පමණක් නොව රැකියා උත්පාදනය වර්ධනය කිරීම සඳහා සහ ප්‍රාදේශීය සංවර්ධනය සැලසීම සඳහා වේ.

(ආ) ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල ප්‍රගතිය

---------------------------------------------

(i) ආයෝජන මණ්ඩල නීතියේ අංක 17 දරන වගන්තිය ප්‍රකාර ගිවිසුම් අත්සන් කළ අනුමත ව්‍යාපෘති , 2011 වර්ෂය තුලදී අවලංගු කළ, වසා දැමූ හා අත්හිටවූ ව්‍යාපෘති, පසුගිය වසර 10 සමඟ සසඳා පහත දැක්වේ.

| වර්ෂය | ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති ✓1 | අවලංගු කළ ව්‍යාපෘති ✓2 | වසා දැමූ හෝ අත්හිටවූ ව්‍යාපෘති ✓3 | අවලංගු කළ වසා දැමූ හෝ අත්හිටවූ ව්‍යාපෘතිවල එකතුව |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| 2001 | 185 | 78 | 1 | 79 |
| 2002 | 202 | 68 | 3 | 71 |
| 2003 | 272 | 55 | 3 | 58 |
| 2004 | 274 | 75 | 7 | 82 |
| 2005 | 208 | 121 | 8 | 129 |
| 2006 | 258 | 113 | 14 | 127 |
| 2007 | 310 | 119 | 18 | 137 |
| 2008 | 252 | 107 | 22 | 129 |
| 2009 | 182 | 93 | 33 | 126 |
| 2010 | 269 | 124 | 61 | 185 |
| 2011 | 161 | 46 | 30 | 76 |
| එකතුව | 2,573 | 999 | 200 | 1,199 |

සටහන: ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය අනුව තොරතුරු දැක්වේ.

✓ 1 ගිවිසුම් අවලංගු කළ/වසාදැමූ / මෙහෙයුම් අත්හිටවූ ව්‍යාපෘති සහ පුළුල් කිරීම ඇතුලත්ව

✓ 2 වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසුව ගිවිසුම් අවලංගු කළ ව්‍යාපෘති (පුළුල් කිරීම් අවලංගු කිරීම් ඇතුළත් නැත .)

✓ 3 වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමෙන් පසු වසා දැමූ /අත්හිට වූ (වසා දැමූ / පුළුල් කිරීම් අත්හිටවූ ඒවා නොමැතිව )

2001 සිට 2011 අතර කාල පරිච්ඡේදය තුලදී ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා ගිවිසුම් 2,573 ක් අත්සන් කර තිබුණි. එහෙත් 2007 වර්ෂයෙන් පසු අත්සන් කරන ලද ගිවිසුම් සංඛ්‍යාව 310 සිට 161 දක්වා සීඝ්‍ර ලෙස අඩු වී තිබුණි. 2001 සිට 2011 අතර කාල පරිච්ඡේදය තුල අවලංගු කළ සහ වසා දැමුණු හෝ අත්හිට වූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 1,199 කි. තවද 2001 සිට 2011 දක්වා ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති වලින් අවලංගු කළ සහ වසා දැමුණු හෝ අත්හිටවූ ව්‍යාපෘති සංඛ්‍යාව 322 ක් වූ අතර එය අත්සන් කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් 12. 5 % ක් විය.

(ii) ආයෝජන මණ්ඩලයේ කළමනාකරණ තොරතුරු පද්ධතිය තුල ඇතුලත් වර්තමාන මෙහෙයුම් තත්ත්වයේ පවතින ව්‍යාපෘති අනුව ආරම්භ කළ 1978 සිට 2011 දෙසැම්බර් 31 දක්වා ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය යටතේ ලැබී තිබූ අයදුම්පත් සංඛ්‍යාව (පුළුල් කිරීම් හැර ) අනුමැතිය ලබාදුන් , ගිවිසුම් අත්සන් කළ සහ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දැක්වේ .

| වර්ෂය | ලද අයදුම්පත් සංඛ්‍යාව | | අනුමැතිය දුන් | | ගිවිසුම් අත්සන් කළ | | වාණිජ මෙහෙයුම් ආරම්භ කළ | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | වසර තුළ | සමුච්චිත | වසර තුළ | සමුච්චිත | වසර තුළ | සමුච්චිත | වසර තුළ | සමුච්චිත | ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘතිවල ප්‍රතිශතයක් ලෙස |
| 2005 දක්වා | | 6151 | | 5554 | | 3623 | | 2529 | 70 |
| 2006 | 512 | 6663 | 350 | 5904 | 258 | 3881 | 129 | 2658 | 68 |
| 2007 | 609 | 7272 | 652 | 6556 | 310 | 4191 | 149 | 2807 | 67 |
| 2008 | 472 | 7744 | 460 | 7016 | 252 | 4443 | 189 | 2996 | 67 |
| 2009 | 448 | 8192 | 384 | 7400 | 182 | 4625 | 126 | 3122 | 67 |
| 2010 | 456 | 8648 | 364 | 7764 | 269 | 4894 | 140 | 3262 | 67 |
| 2011 | 218 | 8866 | 160 | 7924 | 161 | 5055 | 86 | 3348 | 66 |

ඉහත සඳහන් සමුච්චිත තොරතුරු අනුව මණ්ඩලය ආරම්භ වූ 1978 සිට 2011 දෙසැම්බර් 31 දක්වා , ආයෝජන මණ්ඩල නීතියේ 17 වැනි වගන්තිය යටතේ ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව 8866 ක් වූ අතර (පුළුල් කිරීම් හැර) ව්‍යාපෘති 7924 ක් එකී කාල පරිච්ඡේදය තුළදී අනුමත කර තිබුණි. කෙසේ වෙතත් ගිවිසුම් අත්සන් කර තිබුණේ ව්‍යාපෘති 5055 ක් සඳහා පමණි. ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති අතුරින්, ව්‍යාපෘති 3348 ක් හෙවත් 66 % ක් පමණක් වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කර තිබුණි.

තවද, ආයෝජන මණ්ඩලයේ වර්තමාන මෙහෙයුම් තත්ත්වය අනුව, ඉහත දැක්වූ සියලුම වර්ගයේ ව්‍යාපෘති, එනම්, අයදුම්පත් ලද, අනුමැතිය ලද , ගිවිසුම් අත්සන් කළ සහ වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති 2008 වසරේ සිට ක්‍රමක්‍රමයෙන් අඩුවෙමින් පැවතුණි.

(iii) 2005 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුල ආයෝජන මණ්ඩලය හරහා කරන ලද විදේශ සෘජු ආයෝජන සහ උපලබ්ධි වූ දේශීය ආයෝජන විස්තර පහත දැක්වේ.

| වර්ෂය | විදේශ සෘජු ආයෝජන | දේශීය උපලබ්ධි ආයෝජන |
|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | එ.ජ.ඩො. මිලියන |
| 2005 | 287.2 | 350 |
| 2006 | 603.7 | 400 |
| 2007 | 734.4 | 490 |
| 2008 | 888.9 | 226 |
| 2009 | 601.3 | 151 |
| 2010 | 516.3 | 433.4 |
| 2011 | 1,066.1 | 426.6 |

සමාලෝචිත වර්ෂයේදී සෘජු විදේශ ආයෝජන 106 % කින් ඉහළ ගියද, දේශීය ආයෝජනවල වර්ධනයක් පෙන්නුම් කර නොතිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------------

2010 වර්ෂයේ ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් පෙන්වා දුන් පහත සඳහන් කරුණු 2011 දෙසැම්බර් 31 දින වනතුරුත් නිරවුල් කර නොතිබුණි.

(අ) 2000 වර්ෂයේ දෙසැම්බර් මස 29 දිනට පැවති විදුලි ගාස්තු රේටය වසරකට සියයට 6.9 ට වඩා වැඩි වුවහොත් එකී විදුලි ගාස්තු ප්‍රතිපූර්ණය කළ යුතු බවට හොරණ අපනයන සැකසුම් කලාපයේ පිහිටි රබර් නිෂ්පාදන සමාගමක් සමඟ ආයෝජන මණ්ඩලය ගිවිසුමකට එළඹ තිබුණි. මෙම වැඩ පිළිවෙල සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර එකී සමාගම 2002 ජූනි සිට 2007 සැප්තැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ඉහත කී වැඩිවුණ විදුලි ගාස්තු වන රු.356,793,568 ක් ඉල්ලා තිබුණි. තවද, ජාත්‍යන්තර වාණිජ මණ්ඩලයේ ජාත්‍යන්තර බේරුම්කරණ උසාවිය දෙන ලද අවසාන තීරණය අනුව එම සමාගම වන්දි ගෙවීමේ ප්‍රමාදයට අදාල පොළිය සහ බේරුම්කරණ පිරිවැය ලෙස එකතුව රු.388,161,877 ක්ද නැවත ඉල්ලා තිබුණි. බේරුම්කරණ උසාවිය සමාගමේ වාසියට තීන්දුව ප්‍රකාශයට පත් කළ අතර එය තවම නඩු කටයුත්තක්ව පැවතුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආයෝජන මණ්ඩලය මේ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියට අනුමැතිය ලබාදීමට පෙර පරිභෝජනය සඳහා එම ප්‍රදේශයේ රබර් දැව තිබේද යන්න පිළිබඳව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් සහ රබර් පර්යේෂණ ආයතනයෙන් ආයෝජන මණ්ඩලය තක්සේරු වාර්තාවක් ලබාගෙන නොතිබුණි.

(iii) ආයෝජන මණ්ඩලය එයට අවාසි සහගත ලෙස ගිවිසුමකට එළඹ තිබුණි. ඊට අමතරව ආයෝජන මණ්ඩලයේ අයිතීන් ආරක්ෂා නොවන පරිදි විශේෂ අනුග්‍රහයන් සමාගමට ලබාදී තිබුණි. ආයෝජන මණ්ඩලය අතිරේක ඉඩම් සමාගමට බද්ද දී ඇතත් සැලකිය යුතු ඉඩම් ප්‍රමාණයක් ඌන උපයෝජිතව පැවතුණි.

(iv) ඒ අනුව බිම් කුලී ,ජල බිල්පත් ,බංගලා කුලී ආදී මෙම සමාගමෙන් ලැබිය යුතු මුදල් ආයෝජන මණ්ඩලය විසින් අයකර ගෙන නොතිබුණි.

(ආ) ආයෝජන මණ්ඩලය පර්ත් වතුයාය මිලදී ගෙන තිබුණු අතර එම වතුයායේ කොටසක් කළමනාකරණය සඳහා වසර 5 කට රාජ්‍ය වැවිලි සංස්ථාවට භාර දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මිලදී ගැනීමෙන් පසු වතුයායේ තිබූ ගොඩනැගිලි, වටිනා ගස් වැනි වත්කම් පවා සත්‍යාපනය කර වාර්තාගත කර නොතිබුණි.

(ii) ගිවිසුම් කාලය නිම වීමෙන් පසුව ගිවිසුම සමාලෝචනයට ලක් කර නොතිබූ අතර වසර 5 අවසානයේ කොන්ත්‍රාත්තුව අලුත් කිරීමට හෝ අවසාන කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) 2006 වර්ෂයේ සිට ආයතනයේ ගිණුම් ආයෝජන මණ්ඩලයට ලැබී නොතිබුණි.

(iv) 2005 වසරේදී ගෙවා තිබූ රු. මිලියන 10 හැර සංස්ථාව විසින් ආයෝජන මණ්ඩලයට ලාභ අඛණ්ඩව ප්‍රේෂණය කර නොතිබුණි.

(v) පර්ත් වතුයායෙන් ලද ලාභයෙන් කරන ලද ස්ථාවර තැන්පතු උකස් තබා සංස්ථාව ආයෝජන මණ්ඩලයෙන් ණය ලබාගෙන තිබුණි.

(vi) දුර්වල මූල්‍ය කළමනාකරණ අධීක්ෂණය හේතුකොට ගෙන රු.මිලියන 40.4 ක් වූ ලාභ කොටසින් රු.මිලියන 30 ක් එකතු කර ගැනීමට ආයෝජන මණ්ඩලයට නොහැකි වී තිබුණි.

(vii) රාජ්‍ය වැවිලි සංස්ථාවේ පැවැති තොරතුරු වලට අනුව, "පර්ත් වතුයාය ජංගම ගිණුමේ" පැවැති ශේෂයෙන් රු.22,232,590 ක් ස්ථාවර තැන්පත් ගිණුමකට මාරු කර තිබූ අතර ඉතිරි ශේෂය වූ රු.16,321,251 ක මුදල ඉහත කී ජංගම ගිණුමේ රැඳී තිබුණි. කෙසේ වෙතත් 2011නොවැම්බර් 15 දින හා 2012 නොවැම්බර් 14 දින පැවැති රාජ්‍ය ව්‍යාපාර කාරක සභා රැස්වීම්වලදී දුන් නියෝග පරිදි ආයෝජන මණ්ඩලය මෙම කරුණ 2013 පෙබරවාරි අවසානය වන විටත් නිරාකරණය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. ඒ වෙනුවට සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශවල රු.මිලියන 16.4 ක් වසර 8 ක කාල පරිච්ඡේදයක් සඳහා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ආයෝජන මණ්ඩලයට ලැබිය යුතු මුදලක් ලෙස සටහන් මගින් හෙලිදරව් කර තිබුණි.

(viii) කොන්ත්‍රාත්කරු ඒක පාර්ශ්විකව කළමනාකරණ ගාස්තුව 15 % කින් වැඩි කර තිබුණි.

(ix) පර්ත් වතුයාය කළමනාකරණය සඳහා වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යා යුතු බවට වූ ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව පර්ත් වතුයාය ආදායම ඒක පාර්ශවීය උපයෝජනය වැලැක්වීමට අපොහොසත් වීම.

(x) පර්ත් වතුයායෙන් ජනිත වූ ආදායමෙන් රු. මිලියන 20 ක් කොන්ත්‍රාත්කරු නමින් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර බැංකු අයිරා ලබා ගැනීම සඳහා එකී තැන්පතු ඇපකර ලෙස භාවිතා කර තිබුණි.

(xi) රු.මිලියන 12.42 ක මෝටර් රථ කුලිය සහ බංගලා කුලිය ජංගම ගිණුම හරහා අනවසරයෙන් කොන්ත්‍රාත්කරුට මාරු කිරීම.

(xii) පර්ත් වතුයාය මගින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ජංගම ගිණුමෙහි රු.මිලියන 16 ක ආයෝජනයක් සංස්ථාව නමින් ස්ථාවර තැන්පතුවල දැක්වෙන අතර ඒ මත පොළිය වන රු.1,576,978 ක් එහි කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

(xiii) 1999 දෙසැම්බර් 09 දිනැති අංක 278 දරන පැවරුම් ඔප්පුවේ ඇති උපලේඛනයේ දැක්වෙන ඉඩම් ප්‍රමාණය, 1997 ජූනි 17 දිනැති අංක 980/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සඳහන් ඉඩම් ප්‍රමාණය සහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වාර්තා ගත වී ඇති ඉඩම් ප්‍රමාණය අතර සැලකිය යුතු විෂමතාවන් නිරීක්ෂණය විය. මීට හේතු ලබා ගැනීමට සහ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම සඳහා මෙම විෂමතාවන් ගැන විමර්ශනය කර නොතිබුණි. ඉඩම් අක්කර 241 ක් අඩුවෙන් අගය කිරීම විධිමත්ව විමර්ශනය කර නොතිබූ අතර එබැවින් එම ඉඩම් ඵලදායී ලෙස භාවිතා කළ හැකිද යන්න දැනගැනීමටද නොහැකි විය.

(ඇ) පර්ත් වතුයායේ ඉඩම් ප්‍රමාණය (රු.මිලියන 120 ක ගැනුම් ප්‍රතිශ්ඨාවකට ඉඩම් හෙක්ටයාර් 700 ක් (අක්කර 1,729 ) 1999 දෙසැම්බර් 09 දින අංක 278 දරන පැවරුම් ඔප්පුව මගින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් පවරාගෙන තිබුණි.) 2009 වර්ෂයේදී කරන ලද සමීක්ෂණය අනුව සැලකිය යුතු ලෙස අඩු වී තිබුණි.
තවද ඉඩම් ලේඛනයේ ඉඩමේ සමහර කොටස්වල ප්‍රමාණය හා වටිනාකම් සටහන් කොට ඇතත් එම ඉඩම් කොටස්වලට අයත් සැලැසුම් දක්නට නොවීය.

| විස්තරය | ඔප්පුව අනුව ඉඩමේ මුළු වපසරිය | වෙනස | | නිරීක්ෂණ |
|---|---|---|---|---|
| | | පැවරුම් ඔප්පුව අනුව | පැවරුම් ඔප්පුවේ උපලේඛනය අනුව | |
| | (හෙක්ටයාර්) | (හෙක්ටයාර්) | (හෙක්ටයාර්) | |
| ඉඩම් පවරාගත් වහාම ආයෝජන මණ්ඩලය කළ පළමු මැණුම (2000 අප්‍රේල් 03 දින සැලැස්ම අංක 1786 | 692.52 (1,711A – 1R – OP) | 7.48 (18A – 1R – 37P) | 123.45 (305A – 0R – 8P) | පවරාගත් ඉඩමේ තථ්‍ය වපසරියට වඩා වැඩි ප්‍රමාණයකට ආයෝජන මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි. |
| ආයෝජන මණ්ඩලයේ කාර්මික සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කළ අනුක්‍රමික මැණුම | 645.08 (1,544A – 0R – 4P) | 54.92 (135A – 2R – 34P) | 170.89 (422A – 1R – 4P) | විශාල ඉඩම් හිඟයක් පැවතුණි. |
| 2009 වර්ෂයේදී සුදුසුකම් ලත් තක්සේරුකරුවකු විසින් කරන ලද සතොයක්ෂණ හා ප්‍රත්‍යාගණනය පදනම් කරගෙන පිළියෙල කරන ලද ආයෝජන මණ්ඩලයේ ඉඩම් ලේඛනය | 593.54 (1,466-A – 2R – 27P) | 106.46 (263-A –0R – 11P) | 222.43 (549-A – 2R – 22P) | ආයෝජන මණ්ඩලයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය තවදුරටත් අඩු විය. |

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---------------------------------

ආයෝජන මණ්ඩලය 2011 වර්ෂය සඳහා රු. 22,295,456 ක මුදලක් ආයෝජන ප්‍රවර්ධන වියදම් වශයෙන් දරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයෝජන ප්‍රවර්ධන සැලසුම්කරණය

--------------------------------------------

රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශ ඇතුළත් 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.2 වගන්තිය පරිදි එක් එක් ව්‍යාපාරයක ආයෝජන ප්‍රවර්ධන සැලැස්මක් හා ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලත් ක්‍රියාකාරී සැලැස්මක් තිබිය යුතුය . මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී ආයෝජන ප්‍රවර්ධන සැලැස්මක් හෝ ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර විධිමත්ව ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) 2011 වර්ෂය සඳහා ආයෝජන ප්‍රවර්ධන වියදම් විධිමත්ව අයවැයගත කර නොතිබුණි. ඒ අනුව ප්‍රවර්ධන හා මාධ්‍ය දෙපාර්තමේන්තුව මගින් අයවැයෙන් ඉල්ලා සිටින ලද රු.මිලියන 72 කින් ඒ කාර්යය සඳහා වෙන්කරන ලද්දේ රු. මිලියන 27.5 ක් පමණක් වන අතර සමාලෝචිත වර්ෂයේදී වැයකොට තිබුණේ රු.මිලියන 22.3 ක් පමණි.

(ආ) ආයෝජන ප්‍රවර්ධන කටයුතු පාලනය

--------------------------------------------

සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේ පැවැති "ජාත්‍යන්තර කාන්තා දිනය සැමරුම් උත්සවය" සංවිධානය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය 2011 වර්ෂයේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධනය කාර්යාංශයට රු.මිලියන 3 ක් ගෙවා තිබුණි. කෙසේ වෙතත් මෙම වැඩසටහන ආයෝජන ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවද ආයෝජන ප්‍රවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ආයෝජන මණ්ඩලය විසින් ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් , ප්‍රතිපත්ති හා පරිපාටි විධිමත්ව සැලසුම් කර පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 16 වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද ආයෝජන මන්ඩල ව්‍යවසායන් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර එම ව්‍යවසායන්හි කාර්ය සාධනය මණ්ඩලය විසින් ඵලදායීව අධීක්ෂණය කර නොතිබුණි.

4.4 වත්කම් කළමනාකරණය

------------------------------

ආයෝජන මණ්ඩලය 2007 දෙසැම්බර් 31 දින ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුණෙන් සභාධිපත්‍ය ඒකක 4ක් රු.මිලියන 530 කට මිලදී ගෙන තිබුණි. ආයෝජන මණ්ඩලය 2000 සැප්තැම්බර් සිට කල්බදු පදනම මත භාවිතා කරමින් තිබූ එම කුළුණේ තවත් ඒකක 5 ක් රු.මිලියන 625 කට 2008 මාර්තු 05 දින මිලදී ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. මිලියන 128 කට මිලදී ගත් හයවැනි මහල 2011 ජූලි 01 දින සිට කුලියට දීම සඳහා සම්පූර්ණයෙන්ම හිස්කර තිබුණි. කෙසේ වෙතත් 2013 පෙබරවාරි මාසය දක්වා එම බිම් කොටස කිසිදු ආර්ථික කාර්යයකට නොයොදවා නිශ්කාර්යව පැවතුණි. ඒ අනුව ආයෝජන මණ්ඩලයට අයත් දේපල ඵලදායී ලෙස කළමනාකරණය නොකිරීම හේතුකොටගෙන 2011 ජූලි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලය තුල ආයෝජන මණ්ඩලයට දළ වශයෙන් රු.මිලියන 11.4 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බටහිර කුළුනේ මහල් 9 අතුරෙන්, වර්ග අඩි 2,781 ක බිම් ප්‍රදේශයක් රේඛීය අමාත්‍යාංශයටද, වර්ග අඩි 6,318 ක බිම් ප්‍රදේශයක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයටද කිසිදු ගිවිසුමකට එළඹීමෙන් තොරව හා බිම් ප්‍රදේශය භාවිතා කිරීම වෙනුවෙන් කුලී ගෙවීමක් රහිතව වෙන්කර දී තිබුණි. එවැනි පහසුකමක් සැකසීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ඇ) ආයෝජන මණ්ඩලය 2011 දෙසැම්බර් 31 දින වන විට ඉහත සඳහන් අමාත්‍යාංශ වෙනුවෙන් කාර්යාල කුලී ලෙස රු.18,141,499 ක්ද, විදුලි ගාස්තු ලෙස රු.832,882 ක්ද වැය කර තිබුණි.

4.5 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල කළමනාකරණය පිළිබඳ පාලනය

-----------------------------------------------------

වෙනස්වන අවශ්‍යතාවලට මුහුණදිය හැකිවන පරිදි පද්ධති හා පරිපාටි සහිත කාර්ය මණ්ඩල කළමනාකරණය සම්බන්ධයෙන් ඵලදායී පාලන ක්‍රම භාවිතා කළ යුතු වුවත්, 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්රලේඛයේ 9.3 වගන්තිය ප්‍රකාරව, එකී අවශ්‍යතා ඉටුකිරීමට ආයෝජන මණ්ඩලය විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ඒ අනුව කාලීන සමාලෝචන සහිතව කාර්ය මණ්ඩල මට්ටම් අතාත්විකව කළමනාකරණය හේතු කොට ගෙන සමාලෝචිත වර්ෂය තුලදී කාර්ය මණ්ඩලයේ විවිධ තනතුරු වර්ග වල පුරප්පාඩු 122 ක් පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට විධායක තනතුරු 70 ක් (අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ තනතුර ඇතුළත්ව) ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි තනතුරු 34 ක් සහ සාමාන්‍ය සේවා තනතුරු 18 ක් වශයෙන් විවිධ තනතුරු වර්ග වල තනතුරු 122 ක් පුරප්පාඩුව පැවතුණි.

(ii) විශේෂයෙන් කළමනාකරණ මට්ටමේ තනතුරක පුරප්පාඩුවක් ඇති වූ විට එය භාරගැනීමට නම් කළ අනුප්‍රාප්තිකයකු සහිතව විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් ආයෝජන මණ්ඩලය විසින් ස්ථාපනය කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තිය පරිදි රාජ්‍ය ව්‍යාපාර විසින් කුමන තත්ත්වයක් යටතේවත් එහි සම්පත් (මානව සම්පත් ඇතුළත්ව) හෝ වියදම් රේඛීය අමාත්‍යාංශය වෙනුවෙන් දැරිය නොහැකි අතර චක්‍රලේඛයේ 9.4 වගන්තිය අනුව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය රහිතව සේවකයකු අමාත්‍යාංශය වෙත මුදා නොහළ යුතු අතර එසේ මුදාහල කාල සීමාව තුල එම සේවකයින්ගේ පඩිනඩි ව්‍යවසාය විසින් නොගෙවිය යුතුය . තවද 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි රාජ්‍ය ව්‍යාපාර සතු සම්පත් අමාත්‍යාංශයේ කටයුතු වලට යොදා නොගත යුතු බව සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත උපදෙස් දී තිබුණි. කෙසේ වෙතත්

විධිමත් අනුමැතිය ලබාගැනීමකින් තොරව ආයෝජන මණ්ඩලයේ සේවකයන් 10 දෙනෙකු එවකට පැවැති අමාත්‍යාංශයටද ආයෝජන මණ්ඩලයේ සේවකයින් 5 දෙනෙකු නව අමාත්‍යාංශයට ද  අනුයුක්ත කර තිබුණි. 2009 වර්ෂයේ සිට ආයෝජන මණ්ඩලය එම සේවකයින්ට රු. 10,615,864 ක් වැටුප් සහ වෙනත් දීමනා ලෙස ගෙවා තිබුණි.

(ආ) ස්වෙච්ඡාවෙන් විශ්‍රාමගැන්වීමේ යෝජනා ක්‍රමය (VRS)

------------------------------------------------------------

පුරප්පාඩු පිරවීමක් අවශ්‍ය නොවන හෝ වෙනත් පුද්ගලයකුගෙන් එකී තනතුර පුරවනවා නම් එම කාර්යයට මුදා හැරීමට හැකිය යන කොන්දේසි වලට යටත් ව ආයෝජන මණ්ඩලය නියමිත කාලයට පෙර විශ්‍රාම ගැනීමට එවැනි සේවකයින්ට ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයක් ඉදිරිපත් කර තිබුණි. 2011 වර්ෂයේදී මෙසේ විශ්‍රාම ගිය සේවකයින්ට වන්දි වශයෙන් රු.58,836,386 ක් ගෙවා තිබුණි. 2003 මැයි මස 28 දිනැති අංක පීඊඩී/10 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි වන්දි මුදල් ගණනය කිරීමෙ කාර්යය සඳහා විශ්‍රාම ගැනීමේ වයස වසර 55 හෝ 60 යන දෙකෙන් අදාල නිලධාරියකුගේ පත්වීමේ ලිපියේ සඳහන් වසර ප්‍රමාණය ගණන් ගත යුතුය. පත්වීමේ ලිපිය පරිදි විශ්‍රාම ගැනීමේ වයස àùÚ<$Ì]µ×ùß´ රාජ්‍ය සංස්ථාවල සේවකයින් විශ්‍රාම ගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල විය යුතුය. තවද 2011 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/60 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි පාර්ලිමේන්තුවේ සම්මත වූ පනතකින් රාජ්‍ය ව්‍යාපාර වල විශ්‍රාම ගැන්වීමේ වයස නිශ්චිතව සඳහන් කර ඇති අවස්ථාවලදී හැර වෙනත් රාජ්ය ව්‍යාපාරවල සේවකයින් සේවා දිගුවක් සඳහා ඉල්ලීමක් නොමැතිව ඔහුට/ඇයට තම කැමැත්ත පරිදි වයස 57 වනතුරු සේවයේ නියැලිය හැකිය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත සඳහන් චක්‍රලේඛ උපදෙස් අනුව ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යාමට කැමැත්ත පළ කල ආයෝජන මණ්ඩල සේවකයින්ට වන්දි ගෙවීමේ කාර්ය සඳහා විශ්‍රාම යා යුතු වයස ලෙස සැලකිය යුත්තේ වසය අවුරුදු 57 කි. කෙසේ වෙතත් ඊට පටහැනිව වයස අවුරුදු 57 ට වැඩි නිලධාරීන් 10 දෙනෙකුට ඉහත කී ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයට ඇතුළත් කර වන්දි වශයෙන් රු.10,466,523 ක් ගෙවා තිබුණි.

(ii) ඉහත සඳහන් නිලධාරීන් වයස අවුරුදු 57 න් ඔබ්බට වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබා දී විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ඔවුන් ලබාගත් මූලික ඒකාබද්ධ වැටුප පදනම් කරගෙන ගෙවිය යුතු මුදල ගණනය කළේ නම් ගෙවීමට සිදු වන්නේ රු.8,127,805 ක් පමණි. ඒ අනුව වසර 57 ඉක්ම වූ නිලධාරීන්ට ස්වෙච්ඡා විශ්‍රාම ගැනීම් ප්‍රදානය කිරීමෙන් ආයෝජන මණ්ඩලය කිසිදු සේවාවක් ලබා නොගෙන රු.2,338,718 ක අතිරේක පිරිවැයක් ගෙවා තිබුණි.

(iii) අනෙකුත් අතුරු දීමනා හැර සේවකයකු අවසන් වරට ලැබූ මාසික ඒකාබද්ධ වැටුප මත වන්දි ගණනය කළ යුතු නමුත් ආයෝජන මණ්ඩලය වන්දි ගණනය කොට ඇත්තේ ජීවන වියදම් දීමනාව හා මූලික වැටුපෙන් 5 % ක විශේෂ දීමනාවද ඇතුළත් මාසික ඒකාබද්ධ වැටුප පදනම් කරගෙනය.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණ පරිපාටි සංග්‍රහය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

4.6 මෝටර් වාහන උපයෝජනය

---------------------------------

රේඛීය අමාත්‍යාංශයට මෝටර් වාහන මුදාහැරීම

-----------------------------------------------------

ගරු ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද 2006 ජනවාරි 04 දිනැති අංක සීඑස්ඒ/පී1 /40 දරන ලිපියේ විධිවිධාන සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ විධිවිධාන වලට පටහැනිව 2011 වර්ෂයේදී මෝටර් රථ 2 ක් රේඛීය අමාත්‍යාංශයට මුදා හැර තිබුණි. රේඛීය අමාත්‍යාංශයට මුදාහැර තිබූ මෝටර් රථ අලුත්වැඩියාව හා නඩත්තුව සඳහා 2005 සිට 2011 දක්වා කාල පරිච්ඡේදය තුල ආයෝජන මණ්ඩලය රු.7,847,130 ක් වැයකර තිබුණි. අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කළ යුතු මුදල් අයකරගෙන හෝ ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර හෝ නොතිබුණි.

5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

-------------------------------------------

5.1 සංයුක්ත සැලැස්ම

--------------------

2007-2013 සංයුක්ත සැලැස්ම රටෙහි ආර්ථික ප්‍රතිලාභ සඳහා ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දිශානතියට යොමුකර තිබුණි. කෙසේ වෙතත් 2011 සඳහා නිශ්චය කරන ලද පහත සඳහන් ප්‍රධාන ඉලක්ක සපුරාගෙන නොතිබුණි.

| අංශය | වාර්ෂික ඉලක්ක | තථ්‍ය ප්‍රමාණය | ඉටුකර ගැනීම ඉලක්කවල ප්‍රතිශතයක් වශයෙන් |
|---|---|---|---|
| | | | % |
| විදේශ සෘජු ආයෝජන (එ.ජ.ඩො.මිලියන) | 1,290 | 1,066 | 83 |
| රැකියා උත්පාදනය (සංඛ්‍යාව) | 13,000 | 6,555 | 50 |

5.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

ක්‍රියාකාරී සැලැස්මක් වෙනම හෝ සංයුක්ත සැලැස්ම සමඟ පිළියෙල කර නොතිබුණු අතර එක් එක් කාර්යයට වගකිව යුතු නිලධාරියා හඳුනාගෙන නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

-------------------------

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ මුළු තනතුරු සංඛ්‍යාව වූ 16 න් 2011 දෙසැම්බර් 31 දිනට තනතුරු 6 ක් පුරප්පාඩුව පැවතුණි. 2009 වසරේදී අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විශ්‍රාම ගොස් ඇතත් එම තනතුර පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. තවද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු 2 ක් දිගු කාලයක් තිස්සේ පුරප්පාඩුව පැවතුණි.

5.4 විගණන හා කළමනාකරණ කමිටුව

-----------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව අඛණ්ඩව යටත් පිරිසෙයින් මාස තුනකට වරක්වත් ප්‍රධාන අභ්‍යන්තර විගණක සමඟ රැස් වී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිර්දේශ සමඟ කමිටුවේ නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කල යුතු වුවද සමාලෝචිත වර්ෂය තුලදී එම කමිටුව රැස් වී තිබුණේ වාර 2 ක් පමණි.

5.5 අයවැය පාලනය

--------------------

සමාලෝචිත වර්ෂයේදී අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

---------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල වීම
(ආ) කාර්ය මණ්ඩල ණය අය කරගැනීම
(ඇ) ව්‍යාපෘති නියාමනය
(ඈ) ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් එකතු කිරීම
(ඉ) පුද්ගල පඩිනඩි

එච්.ජී.එස්.සමරවීර
විගණකාධිපති.

2011.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා
ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ
14(2)(සී) වගන්තිය ප්‍රකාර
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

**1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(ඈ) කොටස ප්‍රකාරව 2011 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය වාර්තා පිළිබඳ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු**

## 2.2 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතින් (SLAS)හා සමගාමී නොවීම/ අනුගත නොවීම

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRS) වලට අනුකූලව වර්ෂ 2012 සිට ක්‍රියාත්මක වන පරිදි නිර්වචිත ප්‍රතිලාභ අත්‍යවශ්‍යතාවෙහි වර්තමාන අගය නිරාවරණය කරනු ඇත.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

- 16 කොටස සඳහා බලපත්‍ර ගාස්තුව මුදල් පදනමින් ගණනය කරන ලද අතර එය 2012 වර්ෂයේ සිට අනාවරණය කරනු ඇත.
- ගිවිසුම සැකසුම් ගාස්තුව අයදුම්පත අනුමත වූ පසුවත් ගිවිසුම අත්සන් කිරීමට පෙරාතුවත් රැස්කරනු ඇත. එබැවින්, මෙම ආදායම/මුදල උක්ත කාලය අතරදී උත්පාදනය වනු ඇත.

  තවදුරටත්, ගිවිසුම් අත්සන් නොකළද, ගිවිසුම සැකසීමේ ගාස්තුව නොගෙවනු ලැබේ. එපරිද්දෙන්, මුදල් පදනමින් යුතුව ගිවිසුම් සැකසීමේ ගාස්තු ගණනය නොකෙරේ.

### 2.2.3 ලැබිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම් සහ අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන

(i) 2008 සිට 2011 දක්වා වර්ෂයන් වෙනුවෙන් බිම් කුලී හා වාර්ෂික කුලී අයකිරීම ඉන්වොයිසිගත කරන ලද අගයෙන් 95%ක් වූ අතර ජලය සහ කුලී 98%ක ප්‍රමාණයක් ලෙස (2012/06/30 දිනට) පහත පරිදි විය.

| ආදායම | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|
| බිම් කුලී හා වාර්ෂික අයකිරීම් (VAT රහිතව) | මි. 849 | මි.826 | මි.759 | මි.767 |
| බිම් කුලී හා වාර්ෂික අයකිරීම් (VAT සහිතව) | මි.950 | මි.926 | මි.851 | මි.883 |
| ජලය හා කුලී | මි.883 | මි.850 | මි.774 | මි.755 |

**<u>ණයගැතියෝ – (2011/12/31 දිනට උක්ත ඉන්වොයිසිගත කළ අයවිය යුතු ශේෂය)</u>**

| | 2011 | 2010 | 2009 | 2008 |
|---|---|---|---|---|
| බිම් කුලී හා වාර්ෂික අයකිරීම් | මි.51 | මි.34 | මි.46 | මි.34 |
| ජලය හා කුලී | මි.105 (30/06/2012 දිනට – රු. මි. 22) | මි.21 | මි.12 | මි.19 |
| බිම් කුලී හා වාර්ෂික කුලී ණය අයකිරීම් අනුපාතය (බිම් කුලී හා වාර්ෂික කුලී අගය මත ඉන්වොයිසිගත කළ %) | 95% | 96% | 96% | 95% |
| ජලය හා කුලී ණය අයකිරීම් අනුපාතය (ජලය හා කුලී අගය මත ඉන්වොයිසිගත කළ %) | 88% | 98% (30/06/2012 දිනට – 98%) | 98% | 97% |

එබැවින්, ව්‍යාපාර අවලංගු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස 2006 වසරේ සිට 2011 වසර දක්වා බොල් ණය සඳහා ප්‍රතිපාදන, 16% සිට 43% දක්වා ඉහල ගියද, ණය අයකර ගැනීම් මට්ටම ඉහල තලයක පවතී. ණය ප්‍රතිපාදන ඉහලයාමට, වසාදමන ලද සහ අවලංගු කරන ලද ව්‍යාපෘති වල ජල කුලී හා සම්බන්ධ ණයගැතියන් සඳහා 2007 වසරේ සිට ලබාදුන් 100% ප්‍රතිපාදන ද දායක විය.

තවදුරටත්, පහත දැක්වෙනුයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් බොල් ණය හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන සැළසීමට යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියයි;

විශේෂ ප්‍රතිපාදන - අවලංගු කල හා වසා දමන ලද ව්‍යාපෘති සඳහා 100%

සාමාන්‍ය ප්‍රතිපාදන - ලැබිය යුතු වාර්ෂික මුදල් මත 15%
(අවලංගු කල සහ වසා දමන ලද ව්‍යාපෘති හැරුණු විට)

බිම් කුලී, ජලය සහ අනෙකුත් ලැබිය යුතු ගාස්තු මත 7.5%
(අවලංගු කල සහ වසා දමන ලද ව්‍යාපෘති හැරුණු විට)

කෙසේ නමුදු, පෙර සූදානම් ගෙවීමක් ලෙස නැවත නොගෙවන ඉඩම් පාරිතෝෂිකයක් අයකිරීම කළාප තුල පවත්නා ව්‍යාපාර වලින් සිදුකෙරෙන බව සටහන් කර ගැනීම උචිත වනවා මෙන්ම එබඳු ව්‍යාපාර කල්බදු කාලය තුල බිම් කුලිය ගෙවීම පැහැර හරින විට, ගෙවිය යුතු මුදල පියවා දැමීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතුව ඉඩම් පාරිතෝෂික ශේෂයන් පවත්නා අතර එයට අමතරව ව්‍යාපාරය විසින් ස්ථාපිත කරන ලද ව්‍යුහයන් / ගොඩනැගිලි ද පවතී.

බිම් කුලී සහ වාර්ෂික මුදල සඳහා සෑම වර්ෂයකම ජනවාරි 1වන දින වන විට සියළු ව්‍යාපාර සඳහා මණ්ඩලය විසින් ඉන්වොයිසි නිකුත් කරයි. ගිවිසුම් වලට අනුව, සෑම වර්ෂයකම ජනවාරි මස 10 වන දිනට ප්‍රථම වාර්ෂික මුදල් සහ බිම් කුලී ගෙවිය යුතු වේ.

පහත සඳහන් පරිදි නිරන්තර අවස්ථාවන්හිදී සිහිකැඳවීම් ලබාදෙමින් ව්‍යාපාරයන්ගෙන් අයවිය යුතු මුදල් එකතු කර ගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ.

1. පෙබරවාරි 28 වන දින වන විට ගෙවා අවසන් නොකළේ නම්, පෙබරවාරි 28 සිට සේවාවන් නවතා දමනු ලබන බව දන්වමින් පෙබරවාරි මුල් සතිය තුල පළමු සිහිකැඳවීම යවනු ලැබේ.

2. බිම් කුලී සහ වාර්ෂික ගාස්තු ගෙවීමේ අවසන් දිනය ලෙස පෙබරවාරි 28 වන දින ලබාදෙන බවට කළාප කාර්යාලයන්ද දැනුවත් කෙරේ.

3. මාර්තු 2වන දින වන විට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මුදල් දෙපාර්තමේන්තුව මගින්, ගෙවීම් පැහැරහරින ලද ව්‍යාපාර වෙත සපයන සියළු සේවා නවතන ලෙස අදාල දෙපාර්තමේන්තු වෙත දැනුම් දෙනු ලැබේ.

4. කළාප / ප්‍රාදේශීය කාර්යාලයන්හි අධ්‍යක්ෂ / ගණකාධිකාරී / කළමනාකරුවන් වෙත සෑම මසකම අවසානය වන විට හිඟ ශේෂයන් හි වාර්තාවක් යවන අතර, අයවිය යුතු මුදල් පිළිබඳව කටයුතු කිරීමට ඔවුන්ට උපදෙස් දී ඇත.

5. ජූනි 30 වන දින වන විට දෙවන සිහිකැඳවීම යවනු ලැබේ.

6. 2011 සිට ක්රියාත්මක වන පරිදි, සැප්තැම්බර් පළමුවන සතිය වන විට 3වන සිහිකැඳවීම යවනු ලැබේ.

7. 2007 ඔක්තෝබර් 1වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගෙවිය යුතු මුදල් සඳහා ප්‍රමාද වීම් සම්බන්ධයෙන් පොලී අයකරනු ලැබේ. ඒ අනුව, වසරේ ජනවාරි මස 10 වන දින අවසන් වීමෙන් අනතුරුව පොලිය අයකෙරේ.

8. සෑම වර්ෂයකම ආරම්භයේදී, පෙර වර්ෂයේ වාර්ෂික ගාස්තු / බිම් කුලී නොගෙවන ලද ව්‍යාපාරයන්හි ලැයිස්තුවක් ගිවිසුම අවසන් කිරීම පිණිස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අදාල ආයෝජන අංශ කණ්ඩායම වෙත ඉදිරිපත් කෙරේ.

9. ගෙවිය යුතු මුදල් සහිත ව්‍යාපෘති වෙත, ඒවා අවලංගු කිරීමට පෙර හිඟ මුදල් ගෙවන ලෙස ඉල්ලමින් අදාල ආයෝජන අංශ කණ්ඩායම විසින් අනුකූල නොවීමේ / අවලංගු කිරීමේ ප්‍රකාශයක් යවනු ලැබේ.

10. 2012 සිට ක්‍රියාත්මක වන පරිදි, ව්‍යාපාරයන්හි තත්ත්වය පිළිබඳව නොසලකමින් සියළු ණය පැහැරහරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට නීති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇත. 2012ට පෙර, එන්තරවාසි යවන ලද්දේ අවලංගු කරන ලද ව්‍යාපාර වලට පමණි.

උක්ත කරුණට අමතරව, කළාප අධ්‍යක්ෂවරු වෙත ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඇති ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වය ඇගයීම පිණිස බලතල ලබාදී ඇති අතර, ණය නැවත අයකර ගැනීම වර්ධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීමටද බලතල ලබාදී ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ණය එකතු කිරීමේ වෙනමම ඒකකයක් පිහිටුවා අයවිය යුතු මුදල් අයකරගැනීමට සහය දීමට හා වේගවත් කිරීමට තවදුරටත් සලකා බලමින් සිටී.

අපගේ වාර්තා වලට අනුව, ගිණුම් සඳහා ලැබිය යුතු වන නමුත් බොල් ණය ලෙස කපාහරින ලද මුදල රු. 32,734,612/47/- වන අතර එය විගණන වාර්තාවෙහි රු. 73,113,266.00/- ක් ලෙස දක්වා ඇත. එකී රු. 73,113,266.00/- තුල වෙනත් ණයගැතියන්ගේ යටතේ වූ රු. 40,378,653/-ක බොල් ණය මුදලක් ද අන්තර්ගත වී ඇත.

(ii) බොල් ණය සහ අඩමාණ ණය ප්‍රතිපාදන සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සකස් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති තුලින් අවලංගු කරන ලද සහ වසා දමන ලද ව්‍යාපෘති වලින් අයවිය යුතු මුදල් සඳහා පමණක් 100%ක ප්‍රතිපාදනය ලබා දී ඇත.

(iii) 2011 අංක 43 දරණ ඌන කාර්යසාධිත සහ ඌන උපයෝජිත වත්කම් පනත යටතේ අත්පත්කරගත්

- ඩයිනමික් ක්ලෝතින් (පෞද්) සමාගම - රු. 12,249,330/-

  යොබීදා ඇසෝසියේට්ස් - රු. 3,871,625/73

  2011 අංක 43 දරණ ඌන කාර්යසාධිත සහ ඌන උපයෝජිත වත්කම් පනත යටතේ අත්පත් කරගත් උක්ත ව්‍යාපාර වලට අයත් තවමත් ලැබිය යුතුව පවත්නා මුදල් දේපල සඳහා ගෙවනු ඇති වන්දි වලින් අයකරගනු ඇත (ඉඩම් හැර).

- STY ජාත්‍යන්තර ඇඟළුම්හල් (පෞද්) සමාගම -රු. මි 11.3

  කොග්ගල අපනයන ප්‍රවර්ධන කළාපයෙහි ස්ථාපිත STY ජාත්‍යන්තර ඇඟළුම්හල් (පෞද්.) සමාගම බලහත්කාරයෙන් විවෘත කොට වෙනත් ආයෝජකයකුට ලබාදී ඇත. මෙම ප්‍රමාණය දැනටමත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ලබාගෙන ඇති ගොඩනැගිල්ලෙහි වටිනාකමට හිලව් කර ඇත. ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු ඇස්තමේන්තුව ප්‍රකාරව ගොඩනැගිල්ලෙහි වටිනාකම රු. මි 24කි.

උක්ත සඳහන් පරිදි ගෙවිය යුතු මුදල් අයකර ගැනීමට කළමනාකරණය විසින් ගන්නා ලද පියවරට අනුව, දීර්ඝ කාලීනව ගෙවිය යුතු මුදල් අඩු කර ගැනීමට අපේක්ෂිතය.

(iv) සහ (v)

සෑම වසරකම ආරම්භයේදී, මෙහෙයුම් දෙපාර්තමේන්තුව / ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අංශ වෙත අවශ්‍ය පියවර ගැනීමට සහ ගිවිසුම් අවසන් කිරීම සඳහා වාර්ෂික මුදල නොගෙවූ ව්‍යාපාර නාම ලේඛනයක් ලබා දේ.

ජලය සඳහා ගෙවිය යුතු වන රු. මි 79ක මුදලින්, රු. මි 70ක් සහ රු. මි 2.1ක මුදලක් මර්බොක් එම්බීඑෆ් ලංකා (පෞද්) සමාගමෙන් අයවිය යුතු කුලීය.

(ආ) <u>වෙනත් ණය ගැතියෝ</u>

(i) එකී අයවිය යුතු මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් ගිණුම් අවසන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව කපාහරින ලදී. කෙසේ නමුදු, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අමාත්‍යාංශයේ ආවරණ අනුමැතිය ඉල්ලා එය ලැබෙන තෙක් සිටී.

(ii) අවධානයට ලක්විය.

### 2.2.4 <u>නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

(අ) <u>නියාමන ප්‍රතිපාදන වලට පටහැනිව කාර්ය මණ්ඩල යහසාධන අරමුදලක් පවත්වාගෙන යාම</u>

පරමාර්ථය - අරමුදල භාවිතා කරන පොලියෙන් කොටසක් ආවරණය කිරීමෙන් සහනදායී පොලී අනුපාතවලට සංවිධානයේ කාර්ය මණ්ඩලය සඳහා මාස පහක වැටුප් ණය ලබාදෙන අවස්ථාවේදී සංවිධානයෙහි මූල්‍ය තත්ත්වයට සිදුවන බලපෑම අවම කිරීම.

දායකත්වය - අරමුදල, සාමාජික දායකත්වයන් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මූලික දායකත්වය යන දෙකින් සැදුම්ලද්දේය.

අනුමැතිය - 1994.10.10 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.

(ආ) <u>උපයන විට ගෙවීමේ බද්ද</u>

2012.11.12 දිනැති ලිපිය මගින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලබාදුන් උපදෙස් පරිදි, 2012 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි ආයෝජන මණ්ඩලය විසින් සේවකයන්ගේ වැටුපෙන් අයකළ හැකි (වැටුපට ආරෝපිත) උපයන විට ගෙවීමේ බද්ද අඩුකිරීම ආරම්භ කරන ලදී.

(ඇ) <u>සේවකයන්ට ගෙවනු ලැබූ දීමනා</u>

**වෘත්තීය දීමනා**

පරමාර්ථය - වෘත්තීය වශයෙන් සුදුසුකම් ලත් අයවළුන් මණ්ඩලයේ සේවයට ආකර්ශනය කර ගැනීම සහ එක් එක් අදාල වෘත්තීන්හි නියුතු දැනට සේවය කරන සේවකයින් ඉහල වෘත්තීය සුදුසුකම් ලබාගැනීමට දිරිගැන්වීම හා ඒ තුලින් සංවිධානයෙහි ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ඔවුන්ගේ දායකත්වය වැඩිදියුණු කිරීම.

අනුමැතිය - අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 1991.09.13 වන දින ලබාදෙන ලදී.

**රියදුරු දීමනා**

පරමාර්ථය - අධ්‍යක්ෂ මණ්ඩලය මගින් රථවාහන වෙන් කරන ලද නිළධාරීන් සඳහා මාසික ගෙවීමක් සිදු කිරීම සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් රියදුරෙකු ලබානොදීම. මෙම ගෙවීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත මූල්‍යමය වශයෙන් සහ පරිපාලනමය වශයෙන් රියදුරකු සේවයෙහි යෙදවීමට වඩා නිළධාරීන්ට දීමනාවක් ගෙවීම පිරිවැය ප්‍රතිලාභී වන බැවින් එය නිර්දේශ කරන ලදී.

අනුමැතිය - අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2003.01.14 වන දින ලබාදෙන ලදී.

**පැමිණීමේ දිරි දීමනාව**

පරමාර්ථය - පැමිණීමේ දිරි දීමනාව පදනම් වී ඇත්තේ සේවකයා කලට වේලාවට රාජකාරියට පැමිණීම සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත හැකිවීම පිණිස නිවාඩු ලබාගැනීමෙන් වැලකී සිටීම මතය.

අනුමැතිය - අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 1990.11.06 වන දින ලබාදෙන ලදී.

මණ්ඩලයේ සේවකයන්ගේ ප්‍රතිලාභ පිණිස සුභසාධන යෝජනා ක්‍රමයක් පවත්වාගෙන යාම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත අවශ්‍යතාවක් නොමැත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13වන කොටස යටතේ පැවරී ඇති විශේෂ බලතල භාවිතා කිරීමෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය වලක්වනු ලබන කිසිදු ජනතා / රාජ්‍ය ව්‍යාපාර, රාජ්‍ය මූල්‍ය හෝ අන් කිසිදු චක්‍රලේඛයක් නොමැත්තේය.

එබැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිය බලතල භාවිතා කිරීමේදී එය වාරණය කරනු ලබන රජයේ කිසිදු භාණ්ඩාගාර උපදෙසක්, උපදෙස් මාලාවක්, පනතක් හෝ වෙනත් චක්‍රලේඛයක් හෝ නොමැති අවස්ථාවක මණ්ඩලය වෙත සුභසාධන යෝජනා ක්‍රමයක් සහ යහසාධන අරමුදලක් පවත්වාගෙන යාමටත්, වෘත්තීය දීමනාවක්, පැමිණීමේ දිරි දීමනාවක් සහ රියදුරු දීමනාවක් ගෙවීමටත් තීරණ ගැනීමේ බලතල පවතී.

## 3. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

අදහස් නොමැත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

(අ) අපනයන සැකසුම් කලාප, අපනයන සැකසුම් උද්‍යාන, කාර්මික උද්‍යාන, කලාප කාර්යාල සහ නව ආර්ථික කළාප වල කාර්යසාධනය

බොහෝමයක් අපනයන සැකසුම් කලාප ස්ථාපිත කරනු ලැබ ඇත්තේ රැකියා උත්පාදනය සහ කලාපීය වර්ධනය ඉලක්ක කර ගනිමින් ම රටේ අඩු සංවර්ධනයක් ඇති ප්‍රදේශවල මිස ප්‍රතිලාභී මධ්‍යස්ථාන වශයෙන් පවත්වාගෙන යාමේ පරම අභිලාශයෙන් නොවේ.

(i) අවධානයට ලක්විය.
වාර්තාව සඳහන් කරනුයේ 2009 වර්ෂයේදී සීතාවක අපනයන සැකසුම් කලාපය ආරම්භ වූ බවයි. කෙසේ නමුදු, සීතාවක කාර්මික උද්‍යානය 1999දී කර්මාන්ත අමාත්‍යංශය යටතේ ස්ථාපිත කරන ලද අතර අනතුරුව වර්ෂ 2001දී එය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතට ගැණින. වර්ෂ 2009දී කලාපයෙහි නම සීතාවක අපනයන සැකසුම් කලාපය ලෙස වෙනස් කරන ලදී.

(ii) අවධානයට ලක්විය.

(iii) අවධානයට ලක්විය.

(iv) අවධානයට ලක්විය.
අලාභය ඉහල යාමට ප්‍රධාන හේතුවක් වන්නේ ක්ෂය ප්‍රමාණය ඉහල යාම, වැටුප් ප්‍රමාණය හා පාලනය කළ හැකි වෙනත් වියදම් අයිතමයන් හි කැපී පෙනෙන වෙනසක් නොමැතිව පැවතීමයි.

(v) අවධානයට ලක්විය.
අපනයන සැකසුම් කලාප, කාර්මික උද්‍යාන සහ අපනයන සැකසුම් උද්‍යාන ස්ථාපිත කොට ඇත්තේ රටෙහි ආර්ථික සංවර්ධනයට දායකත්වය ලබාදීමේ ප්‍රධාන අරමුණ ඇතිවය. අපනයන සැකසුම් කලාප, පිහිටි ස්ථාන, ඉඩම් පරිහරණය, මත පදනම් වෙමින් සපයනු ලබන යටිතල පහසුකම් වල ස්වභාවය සහ ක්ෂය විවිධ වේ. ආයෝජකයන් සහ ඔවුන්ගේ සේවකයන් වෙත හොඳම පුරුදු ක්‍රියාත්මක කිරීමටත්, පාඩු අවම කිරීමටත් ගුණත්වයෙන් යුත් සේවාවක් සහතික කිරීමටත් වගකීම් දරනු ලබන නිළධාරීන් කණ්ඩායමක් විසින් සියළු කලාප කළමනාකරණය කෙරෙන බව සටහන් කළ මැනවි. ඇතැම් කලාපයන්හි තත්ත්වය අලාභ ලබන කළාප ලෙස ක්‍රියා කිරීම වුවද, ඔවුන්ට හැකි උපරිමයෙන් අලාභ අවම මට්ටමක පවත්වා ගනිමින්, මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සිය රාජකාරි පවත්වාගෙන යනු ලබන කලාප කාර්යමණ්ඩලය සම්බන්ධයෙන් කලාප කළමනාකාරීත්වය තෘප්තිමත්ව සිටී.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති ප්‍රගතිය

(i) 2007 සිට 2011 දක්වා කාලය ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය පැවති කාලය අභ්‍යන්තර ආයෝජන ප්‍රවර්ධනයට දැඩි බාධාවන් එල්ල වූ වකවානුවක් විය. කෙසේ නමුදු, බොහෝ අසීරුතා මැද, 2008 වර්ෂයේදී, 2011 වර්ෂයට පෙර ලබාගත් වැඩිම ඍජු විදේශ ආයෝජන (FDI) ප්‍රමාණය වූ ඇ. ඩො. මිලියන 889ක ඉහලම අගයක් ලබාගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට හැකි විය. මෙම කාලය තුල, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රයත්න දරන ලද්දේ වැඩි අගයක ආයෝජන ආකර්ශනය කර ගැනීමට මිස ආයෝජන ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් ආකර්ශනය කරගැනීමට නොවේ. තවද, 2011 අයවැයට පෙර, වසර 3 -5ක් කාලයක් සඳහා පමණක් ව්‍යාපෘතින් සඳහා වූ බදු වාරණය කාලය සීමා කිරීම, ආයෝජකයින් උදාසීන කිරීමට හේතුවක්වූ බව සඳහන් කිරීම මැනවි. කෙසේ නමුදු, උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ, භූමිය, පරිසරය සහ අනෙකුත් කරුණු පිළිබඳ ගැටළු මධ්‍යයේ වුව, 2011දී ඇමරිකානු ඩොලර් බිලියන 1කට වැඩි මෙතෙක් ලබාගත් වැඩිම ඍජු විදේශ ආයෝජන (FDI) අගයක් සාක්ෂාත් කර ගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමත් විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි කළමණාකරන තොරතුරු පද්ධති (MIS) වාර්තාවන්ට අනුව, 2001-2011 අතර කාලයේදී ගිවිසුම් 2573ක් (වර්තමාන යාවත්කාල කරන ලද අගය වන්නේ 2,578කි) අත්සන් කරන ලද අතර, එම කාලය තුලදීම ව්‍යාපෘති 1,199ක් අවලංගු කර, වසා දමා හෝ නවතා දමා ඇත.

- කෙසේ නමුදු, මෙම ව්‍යාපෘතීන් 1,199ට, 2001ට පෙර ගිවිසුම් අත්සන් කරන ලද (එනම්, 1978 සිට), සහ වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘතිද අයත් වේ. එබැවින් විගණකාධිපති ජනරාල් ගේ ප්‍රකාශයෙහි සඳහන් වන ගිවිසුම් අත්සන් කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාවෙන් අවලංගු කරන ලද, වසන ලද හෝ නවතා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව 47%ක් බවට කරුණු දැක්වීම නිවැරදි නොවේ.
- 2001-2011 කාලය තුල ව්‍යාපෘති 2,578න්, ව්‍යාපෘති 322ක් පමණක් අවලංගු කර, වසා දමා, හෝ නවතා දමා ඇත.
- ඒ අනුව, අවලංගු කර, වසා දමා, හෝ නවතා දමා ඇති ව්‍යාපෘති වල ප්‍රතිශතය 12.5%ක් මිස (එනම් 322*100 /2578) 47%ක් නොවේ.
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් “2010.12.31න් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශය සම්බන්ධ විගණකාධිපති වාර්තාව”නම් සිය පිළිතුරෙහි, 3.2.1 (ආ) (ii) කොටසෙහි මෙම කරුණ සඳහන් කර ඇතත්, ඒ පිළිබඳව අවධානය යොමු නොකර ඇති බව හැෙඟේ.
- ව්‍යාපෘති අවලංගු කිරීම, වැසීම හෝ තාවකාලිකව නවතා දැමීම සම්බන්ධයෙන් ගත්විට 12.5%ක් යනු පිළිගත හැකි මට්ටමකි.

(ii) සහ (iii)

- MIS වෙතින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සපයන ලද දිනය ප්‍රකාරව අයිතම අංක 4.1 (ආ) (ii) මගින් යොමු කරන ලද සංඛ්‍යා නිවැරදි වේ.

- කලාපයේ අනෙකුත් රටවල් සමඟ සැසඳීමේදී ව්‍යාපෘති උපලබ්ධි වීමේ ප්‍රතිශතය, සාමාන්‍ය අගයක් වන 67% පිළිගත හැකි මට්ටමක පවතී.

- කිසිදු රටක වසරක කාලයක් තුල අත්සන් කරන ලද ව්‍යාපෘති වලින්, ව්‍යාපෘති 100%ක්ම ආරම්භ කරන්නේ නැත.

- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට ගිය තත්ත්වයන් හේතුවෙන් ව්‍යාපෘති වල වාණිජ ක්‍රියාකාරීත්වය අපොහොසත් කිරීමට බලපානු ලබන හේතූන් මොනවාදැයි සොයාගැනීම වැදගත් වේ. උදා - ඉඩම් ප්‍රශ්න, පාරිසරික ප්‍රශ්න ආදීන්.

- විවේචන, ව්‍යාපෘතීන් සංඛ්‍යාව මත පවතින නමුදු, වඩාත් වැදගත් වනුයේ අයදුම්පත් ගණන, අනුමැතිය ලබාදීම් හෝ අත්සන් කරන ලද ගිවිසුම් ගණනට නොව ලද ආයෝජන වල වටිනාකමයි.

- දේශීය ආයෝජනවලටද පහසුකම් සපයනු ලැබුවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මූලික පරමාර්ථය වනුයේ විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමයි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) හොරණ අපනයන සැකසුම් කළාපයෙහි පිහිටි නිෂ්පාදන සමාගම

2012.05.14 දින කොළඹ වාණිජ මහාධිකරණය මගින්, ශ්‍රී ලංකාවේ දැනට බලපවත්නා නීතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ගිවිසුමෙහි 20වන උප වගන්තිය බල රහිත බවට තීන්දු කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට වාසිදායකවූ නියෝගයක් ලබාදෙන ලදී. මහාධිකරණ තීන්දුවට විරුද්ධව, 2012 ශ්‍රේෂ්ඨාධිකරණට SC/HC/LA අංක 55 යටතේ, එකී නිෂ්පාදන සමාගම විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇත.

(i) ගිණුම් වලට සටහනක් ලෙස අසම්භාව්‍ය බැරකම් ලබාදෙන ලදී.

(ii) රබර් සංවර්ධන අධිකාරිය මගින් ඇගයීම් වාර්තාවක් ලබාගැනීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්ගේ මට්ටමින් මෙම ව්‍යාපෘති යෝජනාව සලකා බලා අනුමත කළ බව නිරීක්ෂිතය.

(iii) තවමත් පවත්නා අධිකරණ නඩු හේතුවෙන් කල්බදු ගිවිසුම නොතකා, අක්කර 80ක් හැර, ඉතිරි අක්කර 457 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් තවමත් ආයෝජකයා වෙත භාරදී නොමැත. එබැවින් පවත්නා නඩුව අවසන් වන තුරු ඉතිරි අක්කර 457 භාවිතයට ගෙන නොමැත.

(iv) දැනට පවත්නා අධිකරණ නඩු හේතුවෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල් තවමත් අයකර ගෙන නොමැත.

(ආ) පර්ත් වතුයාය

(i) පර්ත් වතුයායේ හා සම්බන්ධ ගැටළුව පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස 2006.09.08 දින පවත්වන ලද රැස්වීමේදී ලබාදෙන ලද නියෝගය ප්‍රකාරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2006 වර්ෂයේදී හොරණ, පර්ත් වතුයායේ ස්ථාවර වත්කම් ගණන් ගැනීමක් (සත්‍යායනය) කර ඇත.

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත තවදුරටත් කාලයක් ගිවිසුම අළුත්කිරීමේ අපේක්ෂාවක් නොතිබූ හෙයින් ගිවිසුම සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවක් නොවීය.

(iii) 2007 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය සඳහා පර්ත් වතුයායේ ගිණුම් විගණන ලබාදෙන මෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) වෙත ලිඛිතව දන්වා ඇත.

2012/03/02 දිනැති ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහි සභාපති ගේ ලිපියෙන්, උක්ත කාලය සඳහා මූල්‍ය ප්‍රකාශය ඔවුන්ගේ විගණකයින් වෙත ඉදිරිපත් කර ඇති බවත් ඉදිරියේදී එය ලබාදෙනු ඇති බවත් දන්වා සිටින ලදී.

(iv) – (xii)

2011/11/15 පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව (COPE) රැස්වීමේදී ලබාදෙන ලද උපදෙස් මත, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් විසින් සිය සභාපතීත්වයෙන් යුතුව 2011/12/22 වන දින රැස්වීමක් පවත්වා කළමනාකරණ ගිවිසුමට අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ගෙවිය යුතු ලාභය පිළිබඳ යෝජනාවක් නිකුත් කරන ලදී.

ඉහත රැස්වීමේදී, දැනටමත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත ලබාදෙන ලද 1999-2006 කාලය සඳහා වන පර්ත් වතුයායේ විගණනය කරන ලද ගිණුම් සාවද්‍ය බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දැනුම් දෙන ලදී. උක්ත විගණනය කරන ලද ගිණුම් පදනම් කර ගනිමින් රු. මිලියන 30.68ක ප්‍රමාණය නිර්ණය කරගන්නා ලදී.

ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉල්ලා සිටින රු.මිලියන 30.68ක ප්‍රමාණය පිළිබඳව විතර්ක කරන ලදී. පර්ත් වතුයායේ (1999 – 2006) ගිණුම් විගණන වලට අනුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත අයවිය යුතු වන්දිය රු. මිලියන 23.16ක් ලෙස නිරීක්ෂිතය. සේවකයන් වෙත වන්දි ගෙවා ඇති බව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත දන්වන ලදී.

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව, සේවකයන් වෙත වන්දි ගෙවීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වගකීමෙන් බැඳේ. එපරිද්දෙන්, 2006/12/31 දිනට පර්ත් වතුයායේ ගිණුම් විගණන අනුව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් රු. මිලියන 16.4ක මුදලක් තිරණය විය.

ඒ අනුව, පර්ත් වතුයායට සම්බන්ධ නිරාකරණ කටයුතු සිදුවෙමින් පවතී.

(xiii) කරුණාකර පහත 4.2 (ඇ) පිළිතුරට අවධානය යොමු කරන්න. ඒ අනුව නිවැරදි කිරීමේ ක්‍රියාවන් වලටද ප්‍රවිශ්ඨ වී ඇත.

(ඇ) පර්ත් වතුයායේ භූමි ප්‍රමාණය

1999.07.21 දින අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන ලද අනුමැතිය ප්‍රකාරව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත මිලදී ගැනීමට නියමිත ඉඩමේ ප්‍රමාණය ආසන්න වශයෙන් අක්කර 1500ක් ලෙස සඳහන් කොට ඇත.

අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් හොරණ පිහිටි පර්ත් වතුයාය මිලදි ගැනීම සඳහා රු. මිලියන 120ක ගෙවීමක් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත උපදෙස් ලබාදී ඇත. අදාල රු. මිලියන 120ක ප්‍රමාණය තීරණය කර ඇත්තේ බලයලත් මානක, එම්. ටී. රත්නායක මහතා විසින් පිළියෙල කරන ලද 1997.04.01 දිනැති මිනින්දෝරු පිඹුරුපත් අංක1660 මත පදනම් වී අක්කර 1563.15ක ප්‍රමාණයෙන් යුතු ඉඩම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් සලකා බැලීමෙනි.

එපරිද්දෙන්ම ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව වෙතින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් මිලදී ගත් ඉඩමෙහි ප්‍රමාණය අක්කර 1563.15කි.

කෙසේ නමුදු, අංක 278 දරණ විකුණුම්කරයෙහි සහ අංක 301 දරණ නිවරද කිරීමේ ඔප්පුවෙහි දැක්වෙන සම්පූර්ණ ඉඩම් ප්‍රමාණය එකිනෙකට වෙනස්ය. එබැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙහිද කැමැත්ත පරිදි මිනුම් දෙපාර්තමේන්තුව මගින් මෑතකදී නව මැනුමක් සිදුකර ඇති අතර මිනුම් සැළැස්ම ප්‍රකාරව ශ්‍රී ලංකා වැවිලි සංස්ථාව විසින් අඩු ඉඩම් ප්‍රමාණය ලබාදීමට එකඟවී ඇති අතර විකුණුම්කරය අවශ්‍ය පරිදි සංශෝධනය කිරීමටද එකඟවී ඇත. මේ වන විට එය ක්‍රියාත්මක වෙමින් පවතී.

## 4.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ) <u>ආයෝජන ප්‍රවර්ධන සැලසුම</u>

(i) ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පැවති නිසා සමාලෝචිත වර්ෂයේ අදාල කාලය පුරාවටම විශේෂිත ආයෝජන ප්‍රවර්ධන සැළැස්මක් සකසනු නොලැබූ අතර, ප්‍රවර්ධන ක්‍රියා සඳහා පැන නැගුණු අවශ්‍යතා පදනම් කර ගනිමින් හදිසි පදනමින් සැලසුම් සකස් විය.

(ii) අවධානයට ලක්විය.

(ආ) <u>ආයෝජන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් වල පාලනය</u>

මෙම කරුණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අදහස වූයේද පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව (COPE) මගින් 2012.11.14 දිනැතිව පවත්වන ලද එහි අවසන් සමාලෝචනයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි සභාපති/

අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබාදෙන ලද පිළිතුරමය. එම පිළිතුර පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුව (COPE) විසින් පිළිගන්නා ලදී.

(ඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියෙහි 16 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපාර වලට අනුයුක්ත විදේශීය ප්‍රවාසිකයන්ගේ වාර්තා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 'වීසා නිර්දේශ පද්ධතිය' නම් පද්ධතියක පවත්වාගෙන යනු ලැබේ.

එම පද්ධතිය මගින් සකස් කළ හැකි වාර්තා වලට නිදසුන් පහත දැක්වේ;

- සමාගම් වලට අනුබද්ධ ප්‍රවාසිකයන්ගේ ලැයිස්තුව (සමාගම් නාමය, ප්‍රවාසිකයාගේ නම, විදේශ ගමන් බලපත් අංකය ඇතුළුව)
- ප්‍රවාසිකයන්ගේ ලැයිස්තුව – රැකියාව-අනුව
- ප්‍රවාසිකයන්ගේ ලැයිස්තුව – රට-අනුව
- ප්‍රවාසිකයන්ගේ ලැයිස්තුව – උප-නිෂ්පාදන ගණය

එබඳු වාර්තා වලට නිදසුන් **ඇමුණුම 1**හි අමුණා ඇත.

## 4.4 <u>වත්කම් අවකළමනාකරණය</u>

(අ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමත් සමඟ බිම් අවකාශය සම්පූර්ණයෙන්ම කල්බදු/කුලියට දීම සඳහා අවස්ථාව ලබා දෙමින් 06වන මහලේ ස්ථානගත කර තිබූ දෙපාර්තමේන්තු දෙක වෙනත් මහල් වලට ගෙනයන ලදී. වර්ෂ 2011දී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් එකී මහල කල්බදු ගැනීමේ කැමැත්තක් දක්වන ලද නමුදු, එය තවදුරටත් ඉදිරියට නොයන ලදී.

එකී මහල වසර 03ක් සඳහා කල්බදු දීමට අධිකරණ අමාත්‍යාංශය සමඟ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් කල්බදු ගිවිසුමක් අත්සන් කර ඇත. අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ අමාත්‍යාංශය වෙත ජාත්‍යන්තර මැදහත්කරණ මධ්‍යස්ථානයක් ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි, බටහිර කුළුණේ, 6වන මහලේ ස්ථාපිත කිරීමට අනුමැතිය දී ඇත.

(ආ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පවතිනුයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන අතර රේඛීය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යවරු දෙදෙනාගේ කාර්යාල ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 25 සහ 27 මහල් වල පිහිටා ඇත.

අමාත්‍යාංශය වෙත මහල් දෙක කල්බදු දීම සඳහා ආයෝජන මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ගිවිසුම අත්සන් කිරීම සඳහා කෙටුම්පත් කරන ලද කල්බදු ගිවිසුම අමාත්‍යාංශය වෙත යවා ඇත.

27වන මහලෙහි ඉතිරි බිම් ප්‍රදේශය දැනට සර් බාරොන් ජයතිලක මාවතේ පිහිටි ආයෝජන සේවා දෙපාර්තමේන්තුව මගින් පරිහරණය කරනු ඇත. එපරිද්දෙන් ලෝක වෙළඳ මධ්‍යස්ථානයෙහි මහල් උපරිම පරිහරණයක් සිදුකිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සහතික කරනු ඇති අතර සර් බාරොන් ජයතිලක මාවතෙහි ගොඩනැගිල්ල කුලියට දීමෙන් ආදයම් උපදවාගනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිහිකැඳවීම් ගණනාවක් යවා තිබුණද අමාත්‍යංශ විසින් ගෙවිය යුතු විදුලි බිල් හා කුලී සඳහා ගෙවීම් කර නොමැත.

## 4.5 මානව සම්පත් කළමනාකරණය

### (අ) සේවක සංඛ්‍යා කළමනාකරණය පාලනය කිරීම

(i) 2011.12.31 දින වන විට විධායක කාර්ය මණ්ඩලයේ තනතුරු 84ක්, ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 40ක් සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 35ක් ලෙස සම්පූර්ණ තනතුරු පුරප්පපාඩු සංඛ්‍යාව 159ක් වන බව කියැවේ. කෙසේ නමුදු, 2011.12.31 දිනට ඇතිවූ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ පදනම යටතේ පුරප්පාඩු වූ තනතුරු 38 සම්පූර්ණ කරනු නොලැබෙන බව සඳහන් කෙරේ. තවදුරටත්, විගණන විමර්ශනයේදී සාමාන්‍ය සේවා කාර්ය මණ්ඩලයේ අනියම් කම්කරුවන් 05ක් සැලකිල්ලට ගෙන නොමැත. තවද, සේවක සංඛ්‍යා තනතුරු නොමැති විධායක කාර්ය මණ්ඩලයේ 06ක් සිටින අතර එම තනතුරු ඔවුන් වෙනුවෙන්ම පවත්වාගෙන යමින් අදාල නිළධාරියා විශ්‍රාම යාමෙන් අනතුරුව යලි පත්කිරීම් නොකරනු ලැබේ. ඒ අනුව, 2011.12.31 දිනට පවත්නා සත්‍ය ඇබෑර්තු සංඛ්‍යාව 122කි. කෙසේ නනමුදු උක්ත 122න් 96ක් 2012 වන විට පුරවා ඇති අතර ඉතිරි ඇබෑර්තු අවශ්‍යතාවෙහි පිළිවෙලට ඉදිරියට පිරවීමට කටයුතු කෙරේ.

(ii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉදිරි සැළැස්ම මේ වන විටත් සකස් කොට ප්‍රගතිශීලීව ක්‍රියාත්මක කෙරේ.

(iii) කලින් කලට පැන නැගි අවශ්‍යතාවන් හේතුවෙන් රේඛීය අමාත්‍යංශ වෙත සේවකයන් කිහිප දෙනෙකු නිදහස් කිරීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සිදුවිය. විශේෂයෙන්ම මෙම සේවකයන් නිදහස් කරන ලද්දේ ගරු අමාත්‍යවරුන්ගේ උපදෙස් මත ඔවුන්ගේ රාජකාරි ස්වරූපය සැළකිල්ලට ගනිමිනි. මෙම නිදහස් කිරීම් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී.

ඒ අනුව, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යවරයාගේ කාර්යාලයට සේවකයන් දෙදෙනෙකුද (02) ගරු ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලයට සේවකයන් තිදෙනෙකුද (03) 2011දී නිදහස් කරන ලදී.

### (ආ) ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය (VRS)

(i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය - 2011 යනු 2003 දී රජය මගින් හඳුන්වා දුන් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමයෙහි පූර්වාදර්ශයකින් ලැබූ නීති හා රෙගුලාසි කැටිකරගත්තකි. ඒ අනුව, වන්දි ගෙවීමේ කටයුත්ත සඳහා විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60 වශයෙන් සැලකිල්ලට

ගන්නා ලදී. තවදුරටත්, 2011.04.29 දිනැති අංක 60 දරණ PED චක්‍රලේඛය ප්‍රකාරව අදාල රාජය ව්‍යවසායන්හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය සේවකයන් වෙත සේවා දිගු ලබාදෙමින් වයස අවුරුදු 60 දක්වා සේවයෙහි තබා ගැනීමේ බලතල හිමිය.

(ii) සහ (iii)

2012.11.14 දින පැවති COPE රැස්වීමේදී එකඟ වූ පරිදි ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා ගෙවීම් කිරීම පිණිස සවිස්තරාත්මක වාර්තාවක් COPE හි ලේකම්වරයා වෙත 2012.11.20 දින ඉදිරිපත් කරන ලදී.

(ඈ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සකසන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ දැනගැනීමට සහ අනුමැතියට ඉදිරිපත් කරන ලදී. මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත අනුගත කරගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදෙන ලදී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මානව සම්පත් ප්‍රතිපත්ති අත්පොත සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ සම්මුතිය ලබාගැනීමට කටයුතු කරනු ඇත.

4.6 **<u>මෝටර් වාහන පරිහරණය</u>**

<u>රේඛීය අමාත්‍යාංශය වෙත වාහන මුදාහැරීම</u>

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සම්බන්ධ ආයෝජන සහ ප්‍රවර්ධන කටයුතු සඳහා විවිධ අවස්ථාවන්හිදී, අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි වාහන මුදාහරිනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නිළධාරීන්ද අමාත්‍යාංශයීය නිළධාරීන් සමඟ ආයෝජන ප්‍රවර්ධන කටයුතු සඳහා විවිධ ස්ථාන වලට ගමන් කරයි. මෙම කටයුතු ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සම්බන්ධ බැවින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වාහන වල අළුත්වැඩියා කටයුතු වල වියදම් ප්‍රතිපූරණය කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට හැකියාවක් නොමැත.

**5. <u>විශ්වාසනීයත්වය සහ යහපාලනය</u>**

**5.1 <u>සංයුක්ත සැළැස්ම සහ</u>**

**5.2 <u>ක්‍රියාකාරී සැළැස්ම</u>**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් 2011 සිට 2015 දක්වා අවබෝධාත්මක සංයුක්ත සැළැස්මක් නිර්මාණය කරන ලද අතර, අනතුරුව එය සෑම වර්ෂයකම සමාලෝචනය කෙරෙනු ඇත.

2011-2015 සඳහා වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි සංයුක්ත සැළැස්ම සකසනු ලැබුයේ රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහාය වීමේ කාර්යයට, කාර්ය මණ්ඩලය වෙත මගපෙන්වීමක් සිදු කිරීම සඳහාය.

කෙසේ නමුදු, 2011 සඳහා අයවැය යෝජනාවන්හි ප්‍රතිපත්ති වෙනස්කම් බලාපොරොත්තු වෙමින් 2010 අවසානයේදී ප්‍රධාන ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් සිදුකරන ලදී.

සංයුක්ත සැළැස්ම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි මෙහෙවර සහ සංවිධානයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේදී එහි සේවකයන්ගේ භූමිකාව දක්වයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ප්‍රමුඛතාව වනුයේ ආයෝජකයන් වෙත කාර්යක්ෂම සේවා සැපයීම සහ ඉලක්කගත ආයෝජන සාක්ෂාත් කරගන්නා බවට තහවුරු කිරීමයි. නාමිකව, පහත සඳහන් පරිදි ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ක්‍රියාකාරීත්වය ප්‍රධාන අංශ දක්වමින්, ප්‍රධාන අංශ තුනක් මත අවධාරණය කරමින් සංයුක්ත සැළැස්ම මගින් උපායමාර්ගය සැකසේ.

- හුවමාරු අංශ
- කඩිනමින් සකස් කොට ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යුහුසුළුව සොයා ගැනීම.
- උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති සහ මහා පරිමාණ ව්‍යාපෘති

ආයෝජන වටිනාකම, අපනයන ඉපැයුම් / විදේශ විනිමය සුරකුම් වටිනාකම සහ රැකියා උත්පාදන සංඛ්‍යාව මත ඉදිරි වසර 05 සඳහා (2011-2015) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ඉලක්ක ස්ථාපිත කොට ඇත. මෙය වාර්ෂිකව දළ දේශීය නිශ්පාදිතයේ වර්ධනය 8% - 10% අනුපාතයේ තබා ගැනීම සඳහා වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි දායකත්වය වනු ඇත.

කෙසේ නමුදු, සංයුක්ත ඉලක්ක 2013-2017 කාලය සඳහා සාක්ෂාත් කරගැනීමට උපායමාර්ග සහ ක්‍රියාකාරී සැළැස්ම ඇතුළුව සංවර්ධනය කිරීමට පවත්නා සංයුක්ත සැළැස්ම සමාලෝචනය කොට, පවත්නා මාස 03ක් තුල සම්පූර්ණ කොට රේඛීය අමාත්‍යාංශයට සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ඇත.

## 5.3 අභ්‍යන්තර විගණනය

ප්‍රධාන කාර්යාලයෙහි අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවෙහි සම්පූර්ණ සේවක සංඛ්‍යාව තනතුරු 16ක් වන අතර එය විගණන විමර්ශනයේදී සටහන් වූ පරිදි තනතුරු 17ක් නොවේ. තනතුරු 16ක් වූ මුළු සංඛ්‍යාවෙන්, තනතුරු 02ක් (එනම්, අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ) 2012.12.31 දිනට පුරප්පාඩුව පැවතිණ. ඉහත තනතුරු සංඛ්‍යාවෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ එක් තනතුරක් (විගණන විමර්ශනයෙහි දක්වන ලද පරිදි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු දෙකක් නොවේ), පවත්නා අතර එකී තනතුරෙහි රාජකාරි දැනට ආවරණය කරනු ලබන්නේ වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකි. එම ඇබෑර්තුව පවත්නා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා වන ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

## 5.4 විගණන සහ කළමනාකරණ කමිටුව

‘යහපාලනය සඳහා පොදු ව්‍යාපාර උපදෙස් මාලාව’ (චක්‍රලේඛ අංක. PED/12) යන්නෙහි දක්වන ලද උපදෙස් මාලා සැලකිල්ලට ගනු ලබන අතර එහි දක්වන ලද බොහෝ මූලධර්ම වලට අනුගත වූ බවත්, එසේ අනුගත නොවූ ක්‍රියාවට නංවනු නොලැබූ අංශ වෙතොත් ඒවා අනාගතයේදී අනුගත කරගන්නා බවත් සටහන් කෙරේ.

## 5.5 අයවැය පාලනය

කළමනාකරණ පාලනයේ සාර්ථක මෙවලමක් ලෙස අයවැය සැකසීම භාවිතා නොකරන බව කීම සාවද්‍ය වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අනිවාර්යයෙන්ම වියදම් පාලනයට සහ ආදායම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට අයවැය මිනුම් දණ්ඩක් ලෙස භාවිතා කරයි.

## 6. පද්ධති සහ පාලන

(අ) නීති, නීති හා රෙගුලාසි සමඟ අනුගත වීම/ අනුකූල වීම

කරුණාකර උක්ත 2.2.4 ට ලබාදුන් පිළිතුර බලන්න.

(ආ) කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම

කාර්ය මණ්ඩල ණය පාලනය සහ අයකර ගැනීම සඳහා සියළු ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඇ) ව්‍යාපෘති මෙහෙයවීම

2011 ජූලි මසට පෙර සහ 2011 ජූලි මසට පසු තත්ත්වය පිළිබඳ සංසන්දනය කරන විට, සනාථ කිරීම්, අවලංගු කිරීම්, අවසන් කිරීම්, පරිපූර්ය / පරිපූරක කිරීම් සඳහා ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් සාක්ෂි දැරිය හැකි අනුමත කිරීමේ අදියරෙහි සිට ඇවරකිරීම දක්වා වන අදියර වලින් ව්‍යාපෘති මෙහෙයවීමේ සුවිශේෂී වර්ධනයක් පෙන්නුම් කෙරේ.

කෙසේ නමුදු, ව්‍යාපෘතීන්හි විවිධ ක්‍රියාවන් වලට සම්බන්ධ ආයෝජන අංශ කණ්ඩායම් වල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිළධාරීන් වෙත පවරන ලද වගකීම් හා රාජකාරි යථාවත් කිරීමට ආංශික උපදෙස්මාලා දැනටමත් නිකුත් කර ඇති අතර අංශ කණ්ඩායම් වල විධායක අධ්‍යක්ෂවරු සහ අධ්‍යක්ෂ ජනරාල් විසින් සතිපතා රැස්වීම් සහ කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ප්‍රගතිය සමීපව මෙහෙයවනු ලැබේ.

(ඇ) ආයතන මගින් ලැබිය යුතු මුදල් රැස් කිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම වර්ෂයකම ජනවාරි 1වන දින වන විට සියළු ආයතන සඳහා බිම් කුලී සහ වාර්ෂික මුදල් සඳහා ඉන්වොයිසි සකසයි. ගිවිසුම් අනුව, සෑම වර්ෂයකම ජනවාරි 10වන දිනට ප්‍රථම වාර්ෂික මුදල් සහ බිම් කුලී ගෙවිය යුතු වේ.

පහත සඳහන් පරිදි නිරන්තරයෙන් සිහිකැඳවීම් ලබාදෙමින් ආයතන මගින් ගෙවිය යුතු මුදල් රැස්කර ගැනීම සඳහා සෑම පරිශ්‍රමයක්ම දරනු ලැබේ.

1. පෙබරවාරි 28 වන දින වන විට ගෙවිය යුතු මුදල් ගෙවා නොතිබුණේ නම්, පෙබරවාරි 28 වන දින සිට සේවාවන් නැවැත්වීම දැනුම් දෙමින් පළමු සිහිකැඳවීම පෙබරවාරි පළමු සතියේ යවනු ලැබේ.

2. පෙබරවාරි 28 බිම් බදු සහ වාර්ෂික මුදල් සඳහා ගෙවීම් කළ යුතු අවසන් දිනය ලෙස ලබාදෙමින් කළාප කාර්යාලද දැනුවත් කෙරේ.

3. මාර්තු 2වන දින වන විට, ගෙවීම් සිදු නොකරන ලද ආයතනයන් වෙත ලබාදෙන සියළු සේවා නැවැත්වීමට අදාල දෙපාර්තමේන්තු වෙත ආයෝජන මණ්ඩලයේ මුදල් දෙපාර්තමේන්තුව විසින් දැනුම් දෙනු ලැබේ.

4. පවත්නා ශේෂයන් පිළිබඳ ප්‍රකාශයක් සෑම මසකම අවසානයේ කළාප / ප්‍රාදේශීය කාර්යාල වල අධ්‍යක්ෂවරු / ගණකාධිකාරීවරු / කළමනාකරුවන් වෙත යවනු ලබන අතර ලැබිය යුතු මුදල් පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ඔවුන්ට උපදෙස් දෙනු ලැබේ.

5. ජූනි මස 30වනදා වන විට දෙවන සිහිකැඳවීම යවනු ලැබේ.

6. 2011 සිට ක්‍රියාත්මක වන පරිදි, සැප්තැම්බර් මස 1වන සතියේදී 3වන සිහිකැඳවීම යවනු ලැබේ.

7. 2007 ඔක්තෝබර් 1වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ගෙවිය යුතු මුදල් ප්‍රමාද වී ගෙවීමේදී පොලියක් අය කෙරේ. ඒ අනුව, වර්ෂයේ ජනවාරි 10වන දිනෙන් අනතුරුව පොලිය අයකෙරේ.

8. සෑම වර්ෂයකම ආරම්භයේදී, ගිවිසුම අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි අදාල ආයෝජන අංශ කණ්ඩායමට පෙර වර්ෂයේ වාර්ෂික මුදල / බිම් කුලිය නොගෙවූ ව්‍යාපාර වල ලැයිස්තුවක් ලබාදෙනු ලැබේ.

9. අයවිය යුතු ගෙවීම් ගෙවන ලෙස ඉල්ලමින් ව්‍යාපෘති අවලංගු කිරීමට ප්‍රථම අදාල ආයෝජන අංශ කණ්ඩායම විසින් අනුකූල නොවීමේ / අවලංගු කිරීමේ ප්‍රකාශයක් යවනු ලැබේ.

10. 2012 සිට ක්‍රියාත්මක වන පරිදි, ව්‍යාපාරයන්හි තත්ත්වය පිළිබඳව නොසලකමින් සියළු ණය පැහැරහරින්නන් සම්බන්ධයෙන් නීත්‍යානුකූල පියවර ගැනීමට නීති දෙපාර්තමෙන්තුව වෙත දැනුම් දී ඇත. 2012ට පෙර, එන්තරාවාසි යවන ලද්දේ අවලංගු කරන ලද ව්‍යාපාර වලට පමණි.

උක්ත කරුණට අමතරව, කළාප අධ්‍යක්ෂවරු වෙත ඔවුන්ගේ අධීක්ෂණය යටතේ ඇති ව්‍යාපාර වල ක්‍රියාකාරීත්වය ඇගයීම පිණිස බලතල ලබාදී ඇති අතර, ණය නැවත අයකර ගැනීම වර්ධනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගැනීමටද බලතල ලබාදී ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ණය එකතු කිරීමේ වෙනමම ඒකකයක් පිහිටුවා අයවිය යුතු මුදල් අයකරගැනීමට තවදුරටත් සලකා බලමින් සිටී.

(ඉ) <u>පුද්ගලික පඩිනඩි</u>

සියලු පඩිනඩි ආයතන සංග්‍රහයෙහි 1වන වෙළුමෙහි 1 පරිච්ඡේදයේ ප්‍රතිපාදන ප්‍රකාරව අනුගමනය කරන ලද අතර මේ සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන පද්ධති ක්‍රමවත්ව පවතී.

# විගණන කමිටු වාර්තාව

1999 නොවැම්බර් 19 දිනැති රා.මු./රා.ව්‍ය. 03 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පත් කරන ලද විගණන කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | ජ්ශන ද සිල්වා මහතා<br>(ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 2. | සමාජික | - | සංජීව වික්‍රමනායක මහතා<br>(ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 3. | සාමාජික | - | අනුර ජයසිංහ මහතා<br>(ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජික) |
| 4. | සාමාජික | - | එස්. ආර්. ආටිගල මහතා<br>(භාණ්ඩාගාර නියෝජිත) |
| 5. | නිරීක්ෂක | - | ජී. එල්. ආර්. වසන්ත මහතා<br>(අභ්‍යන්තර විගණක / ගණකාධිකාරී - ආර්ථික සංවර්ධන අමාත්‍යංශය) |

වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) විගණන කමිටුවේ ලේකම් / කැඳවුම්කරු ලෙස සේවය කළේය.

අභ්‍යන්තර විගණන කාර්යයන්හි ඇති ඵලදායීතාවය විගණන කමිටුව විසින් අධීක්ෂණය කොට, එහිදී හමුවූ වැදගත් කරුණු, අභ්‍යන්තරික විගණක, ස්වාධීන විගණක වරයෙක් ලෙස සහභාගී වූ රජයේ විගණකාධිකාරිවරයා සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංයේ නියෝජිතයකු ද සහභාගී වූ රැස්වීම් වලදී සමාලෝචනයට ලක් කරන ලදී.

රජයේ විගණකාධිකාරිවරයා විසින් පෙන්වා දෙනු ලැබූ ගැටළු පිළිබඳව සැලකිල්ල යොමු කරමින්, ඔහු විසින් නියම කරනු ලැබූ කාලසීමාවන් හා අවශ්‍යතා සමග ගැලපෙන අයුරින් කටයුතු කිරීමට අදාළ දෙපාර්තමේන්තු වලට විගණන කමිටුව විසින් නියම කරන ලදී. එම කටයුතු අධීක්ෂණය කිරීම අභ්‍යන්තර විගණකට නියම කළ අතර, එම අධීක්ෂණයේ දී හමුවන අඩුපාඩු ඇතොත් ඒවා විගණන කමිටුව වෙත වාර්තා කරන ලෙස ඔහුට නියම කරන ලදී.

විගණන කමිටුව වෙත යොමු කරන ලද නියමයන් සහ නිර්දේශයන්, සැලකිය හැකි සෑම ආකාරයකින්ම ඉටුකර ඇති බව විගණන කමිටුවේ අදහස විය.

# පරිශිෂ්ඨයන්

# කාර්ය සාධනයේ සුවිශේෂී අවස්ථා

## සංඛ්‍යා සාරාංශය - 2010 සහ 2011

| ප්‍රධාන දර්ශක - ව්‍යාපෘති තත්ත්වය අනුව | 2010 | 2011* | 2010/2011 වෙනස% |
|---|---|---|---|
| *ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති* | | | |
| (අ) ලැබුණු ඉල්ලුම්පත් | | | |
| ඉල්ලුම්පත් සංඛ්‍යාව | | | |
| නව | 401 | 175 | -56.4 |
| ව්‍යාප්ත කිරීම් | 54 | 36 | -33.3 |
| මුළු ගණන | 455 | 211 | -53.6 |
| | | | |
| (ආ) අනුමත කිරීම් | | | |
| අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව | | | |
| නව | 324 | 121 | -62.7 |
| ව්‍යාප්ති කිරීම් | 40 | 36 | -10.0 |
| මුළු ගණන | 364 | 157 | -56.9 |
| ඇස්තමේන්තු ගත ආයෝජනය | | | |
| - විදේශීය (රු. මිලියන) | 82,866 | 353,189 | 326.2 |
| - දේශීය (රු. මිලියන) | 142,734 | 144,677 | 1.4 |
| - මුළු ගණන (රු. මිලියන) | 225,600 | 497,866 | 120.7 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 55,237 | 47,149 | -14.6 |
| | | | |
| (ඇ) අත්සන් තබන ලද ගිවිසුම් | | | |
| ගිවිසුම් සංඛ්‍යාව | | | |
| නව | 237 | 127 | -46.4 |
| ව්‍යාප්ත කිරීම් | 32 | 34 | 6.3 |
| මුළු ගණන | 269 | 161 | -40.1 |
| ඇස්තමේන්තුගත ආයෝජනය | | | |
| - විදේශය (රු. මිලියන) | 55,318 | 238,489 | 331.1 |
| - දේශීය (රු. මිලියන) | 82,494 | 132,894 | 61.1 |
| - මුළු ගණන (රු. මිලියන) | 137,812 | 371,383 | 169.5 |
| සේවා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 34,827 | 42,715 | 22.6 |
| | | | |
| (ඈ) ක්‍රියාත්මක කිරීම ආරම්භ වීම | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | |
| නව | 125 | 66 | -47.2 |
| ව්‍යාප්ත කිරීම් | 8 | 0 | 0.0 |
| මුළු ගණන | 133 | 66 | -50.4 |
| ඇස්තමේන්තුගත ආයෝජන | | | |
| - විදේශීය (රු. මිලියන) | 9,827 | 76,564 | 679.1 |
| - දේශීය (රු. මිලියන) | 37,315 | 34,190 | -8.4 |
| - මුළු ගණන (රු. මිලියන) | 47,142 | 110,755 | 134.9 |
| සේවා නියුක්ති සංඛ්‍යාව | 17,846 | 12,855 | -28.0 |

# කාර්ය සාධනයේ සුවිශේෂී අවස්ථා
# සංඛ්‍යා සාරංශය - 2010 සහ 2011

| ප්‍රධාන දර්ශක - ව්‍යාපෘති තත්ත්වය අනුව | 2010 | 2011* | 2010/2011 වෙනස% |
|---|---|---|---|
| (ඉ) වාණිජමය මෙහෙයුම් ආරම්භ වීම | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | |
| නව | 121 | 70 | -42.1 |
| ව්‍යාප්ත කිරීම් | 14 | 3 | -78.6 |
| මුළු ගණන | 135 | 73 | -45.9 |
| | | | |
| උපලබ්ධි ආයෝජන | | | |
| - විදේශීය (රු. මිලියන) | 29,589 | 8,106 | -72.6 |
| - දේශීය (රු. මිලියන) | 31,929 | 6,799 | -78.8 |
| - මුළු ගණන (රු. මිලියන) | 61,518 | 14,905 | -75.8 |
| රැකියා නියුක්තිය (සත්‍යය සංඛ්‍යාව) | 9,790 | 6,555 | -33.0 |
| | | | |
| (ඊ) වාණිජමය මෙහෙයුම් තත්ත්වයේ පවතින - වසර අවසානයේ ** | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | | | |
| මව් ව්‍යාපෘති | - | 1,577 | |
| ව්‍යාප්ත කිරීම් | - | 163 | |
| ඇඟළුම් කම්හල් 200 | - | 115 | |
| එකතුව | - | 1,855 | |
| | | | |
| (උ) විදේශීය සෘජු ආයෝජන (ජනවාරි - දෙසැම්බර්) | | | |
| (ඇ.ඩො. මිලියන) | 516 | 1,066 | 106.6 |
| (මුළු එකතුව (රු. මිලියන) | 58,339 | 117,868 | 102.0 |
| | | | |
| (ඌ) අපනයන (ජනවාරි සිට දෙසැම්බර්) | | | |
| මුළු එකතුව (ඇ.ඩො. මිලියන) | 5,175 | 6,571 | 27.0 |
| මුළු එකතුව (රු. මිලියන) | 585,041 | 726,594 | 24.2 |
| | | | |
| (එ) ආනයන (ජනවාරි සිට දෙසැම්බර්) | | | |
| මුළු එකතුව (ඇ. ඩො. මිලියන) | 3,360 | 4,399 | 30.9 |
| මුළු එකතුව (රු. මිලියන) | 379,874 | 486,414 | 28.0 |
| **කාණ්ඩ අනුව (රු. මිලියන)** | | | |
| ප්‍රාග්ධන භාණ් | 59,956 | 98,128 | 63.7 |
| අමුද්‍රව්‍ය | 314,991 | 382,663 | 21.5 |
| වෙනත් ද්‍රව්‍ය | 4,927 | 5,623 | 14.1 |
| | | | |
| (ඒ) ව්‍යාපෘති සංඛ්‍යාව *** | | | |
| වසා දමන ලද ව්‍යාපෘති | 52 | 30 | -42.3 |
| අත් හිටවූ ව්‍යාපෘති | 16 | 5 | -68.8 |
| ගිවිසුම් අවලංගු කළ ව්‍යාපෘති | 125 | 44 | -64.8 |
| මුළු ගණන | 193 | 79 | -59.1 |

# කාර්ය සාධනයේ සුවිශේෂී අවස්ථා
# සංඛ්‍යා සාරාංශය - 2010 සහ 2011

| ප්‍රධාන දර්ශක - ව්‍යාපෘති තත්ත්වය අනුව | 2010 | 2011* | 2010/2011 වෙනස% |
|---|---|---|---|
| ආයෝජන මණ්ඩල පනතේ 16වන වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති | | | |
| (අ) අනුමත කිරීම් | | | |
| අනුමත කළ ව්‍යාපෘති සංඛ්‍යාව | 74 | 22 | -70.3 |
| ඇස්තමේන්තුගත ආයෝජනය | | | |
| - විදේශීය (රු. මිලියන) | 4,551 | 2,517 | -44.7 |
| - දේශීය (රු. මිලියන) | 316 | 1,136 | 259.2 |
| - මුළු ගණන (රු. මිලියන) | 4,867 | 3,652 | -25.0 |
| රැකියා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 1,741 | 559 | -67.9 |
| (ආ) වාණිජමය මෙහෙයුමෙහි නියුතු ව්‍යාපෘති (සමුච්චිත) ** | | | |
| ව්‍යාපෘති සංඛ්‍යාව | 802 | 771 | -3.9 |
| ඇස්තමේන්තුගත ආයෝජනය | | | |
| - විදේශීය (රු. මිලියන) | 20,159 | 19,421 | -3.7 |
| - දේශීය (රු. මිලියන) | 10,517 | 10,087 | -4.1 |
| - මුළු ගණන (රු. මිලියන) | 30,676 | 29,508 | -3.8 |
| රැකියා නියුක්ති ධාරිතාව (සංඛ්‍යාව) | 38,723 | 37,029 | -4.4 |

| | 2010 | 2011 |
|---|---|---|
| සාමාන්‍ය විනිමය අනුපාතය (ඇ.ඩොලරකට රුපියල්) | 113.06 | 110.57 |

* තත්කාලීනව ගණනය කරගෙන යනු ලැබේ
ඉල්ලුම්පත් : ලැබුණු මුළු ඉල්ලුම්පත් සංඛ්‍යාව (ප්‍රතික්ෂේප කළ ව්‍යාපෘති හා ඉල්ලා අස්කරගත් ව්‍යාපෘති ඇතුළුව)
තක්සේරු කරන ලද ආයෝජන ප්‍රමාණය / සේවා නියුක්තිය ව්‍යාප්ත කිරීම් වල වටිනාකම් සහිතව
මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (MIS 2012 පෙබරවාරි 09, 2012 මාර්තු 22)

** වාණිජ මෙහෙයුම් ඇරඹීමෙන් පසු අවලංගු කරන ලද / වසා දමන ලද අත්හිටවූ ව්‍යාපෘති හැර

*** වාණිජ මෙහෙයුම් ඇරඹීමෙන් පසු අවලංගු කරන ලද / වසා දමන ලද / අත්හිටවන ලද ව්‍යාපෘති හැර (ව්‍යාප්ත කිරීම් හැර) (ව්‍යාපෘති වල දැනට පවතින තත්ත්වයන් අනුව)

**සම්පාදනය කළේ සංඛ්‍යාන ඒකකය / පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුවල ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

# 2011 වර්ෂය තුළ අනුමත කරන ලද ව්‍යාපෘති සාරාංශය - අංශ වශයෙන් *

**(ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කරන ලදී)**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත ආයෝජන (රු මිලියන) | | | ආයෝජන ප්‍රතිශතය % | රැකියා නියුක්ති ධාරිතාව | රැකියා නියුක්ති ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| **නිෂ්පාදන - නව ව්‍යාපෘති** | 47 | 85,101 | 13,427 | 98,528 | 19.79 | 20,104 | 42.64 |
| බීම වර්ග සහ දුම්කොළ | 1 | - | 192 | 192 | 0.04 | 185 | 0.39 |
| විද්‍යුත් සහ විදුලි උපකරණ | 2 | 64 | 806 | 870 | 0.17 | 594 | 1.26 |
| එකලස් කළ ලෝහ නිෂ්පාදන | 2 | 333 | 146 | 479 | 0.10 | 226 | 0.48 |
| ආහාර නිෂ්පාදන (පිරිසැකසුම) | 6 | 27,527 | 819 | 28,346 | 5.69 | 1,516 | 3.22 |
| කාර්මික රසායන ද්‍රව්‍ය, ඛණිජ තෙල්, ගල් අඟුරු සහ ප්ලාස්ටික් | 3 | 52,427 | 176 | 52,603 | 10.57 | 305 | 0.65 |
| ලෝහ නොවන ඛණිජ නිෂ්පාදන | 1 | 286 | 121 | 407 | 0.08 | 515 | 1.09 |
| වෙනත් නිෂ්පාදිතයන් (N.E.S) | 3 | 329 | 443 | 772 | 0.16 | 274 | 0.58 |
| කඩදාසි සහ කඩදාසි නිෂ්පාදන | 1 | - | 381 | 381 | 0.08 | 150 | 0.32 |
| පී. වී.සී. නිෂ්පාදන | 1 | 100 | 100 | 200 | 0.04 | 114 | 0.24 |
| රබර් නිෂ්පාදන | 3 | 594 | 773 | 1,367 | 0.27 | 630 | 1.34 |
| රෙදිපිළි හා පේෂකර්ම | 2 | 450.45 | 1,436.25 | 1,887 | 0.38 | 907 | 1.92 |
| ප්‍රවාහන උපකරණ | 1 | 316 | 17 | 333 | 0.07 | 151 | 0.32 |
| ඇඟළුම් | 19 | 2,494 | 7,173 | 9,667 | 1.94 | 13,809 | 29.29 |
| දැව භාණ්ඩ | 2 | 181 | 843 | 1,024 | 0.21 | 728 | 1.54 |
| **සේවා / යටිතල පහසුකම් - නව ව්‍යාපෘති** | 74 | 252,503 | 71,795 | 324,297 | 65.14 | 14,251 | 30.23 |
| ඇමතුම් මධ්‍යස්ථාන, ව්‍යාපාර ක්‍රියාවලි පිටතින් ලබා ගැනීම සහ සත්කාර මධ්‍යස්ථාන | 1 | 0 | 545 | 545 | 0.11 | 700 | 1.48 |
| පරිගණක මෘදුකාංග සංවර්ධනය හා දත්ත ඇතුළත් කිරීම | 1 | 414 | 0 | 414 | 0.08 | 143 | 0.30 |
| බහාලුම් සේවා, ගුදම් සහ නැව් බඩු සැපයුම් සේවා | 3 | 0 | 1,273 | 1,273 | 0.26 | 123 | 0.26 |
| අධ්‍යාපනික හා පුහුණු ආයතන හා පර්යේෂණ සංවිධාන | 2 | 4,389 | 1,518 | 5,907 | 1.19 | 440 | 0.93 |
| ආනයන/අපනයන වෙළෙඳ ආයතන, මිලදී ගැනුම් කාර්යාල | 1 | 0 | 224 | 224 | 0.04 | 520 | 1.10 |
| ආරෝග්‍ය ශාලා සේවය සහ වෛද්‍ය මධ්‍යස්ථාන | 5 | 2,775 | 3,441 | 6,216 | 1.25 | 1,764 | 3.74 |
| හෝටල් ආපනශාලා සේවා සහ විනෝදාංශ සංකීර්ණ | 26 | 99,911 | 21,620 | 121,530 | 24.41 | 4,308 | 9.14 |
| නිවාස සහ දේපළ සංවර්ධනය | 8 | 20,418 | 9,240 | 29,658 | 5.96 | 828 | 1.76 |
| විවේක සහ විනෝද ව්‍යාපෘති හා ගොල්ෆ් පිටි | 1 | 935 | 486 | 1,421 | 0.29 | 81 | 0.17 |
| නාවික සේවා | 1 | 0 | 363 | 363 | 0.07 | 15 | 0.03 |
| වෙනත් සේවා (N.E.S) | 1 | 770 | 0 | 770 | 0.15 | 36 | 0.08 |
| වරාය සංවර්ධනය | 1 | 47,575 | 7,425 | 55,000 | 11.05 | 962 | 2.04 |
| බලශක්ති ජනක යන්ත්‍රාගාර | 10 | 1,169 | 11,727 | 12,896 | 2.59 | 502 | 1.06 |
| වෙළඳසල් සහ කාර්යාල සංකීර්ණ | 11 | 73,557 | 13,835 | 87,392 | 17.55 | 3,811 | 8.08 |
| නැව් බඩු සේවා | 1 | 359 | 0 | 359 | 0.07 | 8 | 0.02 |
| ගමනා ගමන ආයතන | 1 | 231 | 99 | 330 | 0.07 | 10 | 0.02 |
| නව ව්‍යාපෘති උප එකතුව | 121 | 337,604 | 85,221 | 422,825 | 85 | 34,355 | 73 |
| **පවත්නා ව්‍යාපෘති පුළුල් කිරීම - උප එකතුව** | 36 | 15,585 | 59,455 | 75,040 | 15.07 | 12,794 | 27.14 |
| **මුළු එකතුව** | 157 | 353,189 | 144,677 | 497,866 | 100.00 | 47,149 | 100.00 |

* තාවකාලික

සටහන - අවලංගු කිරීම් ඇතුළත්ය

මූලාශ්‍රය - කළමනාකරණ තොරතුරු පද්ධතිය, ආයෝජන මණ්ඩලය (2012 මාර්තු 22)

# 2011 වර්ෂය තුළ අනුමත කරන ලද ව්‍යාපෘති සංරාංශය -අංශ අනුව *

**(ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය අනුව අනුමත කරන ලදී)**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | ආයෝජන ප්‍රතිශතය % | රැකියා නියුක්ති ධාරිතාව | රැකියා නියුක්ති ප්‍රතිශතය % |
|---|---|---|---|---|---|---|---|
| | | විදේශීය | දේශීය | එකතුව | | | |
| **නිෂ්පාදන නව ව්‍යාපෘති** | 2 | 139 | - | 139 | 3.79 | 26 | 4.65 |
| ආහාර නිෂ්පාදන (පිරි සැකසුම) | 1 | 28 | - | 28 | 0.75 | 10 | 1.79 |
| වෙනත් නිෂ්පාදනයන් (N.E.S) | 1 | 111.00 | 0.00 | 111 | 3.04 | 16 | 2.86 |
| **කෘෂිකර්මය - නව ව්‍යාපෘති** | 1 | 15 | 0 | 15 | 0.41 | 43 | 7.69 |
| කෘෂිකර්මය | 1 | 15 | 0 | 15 | 0.41 | 43 | 7.69 |
| **සේවා/යටිතල පහසුකම් - නව ව්‍යාපෘති** | 19 | 2,363 | 1,136 | 3,499 | 95.80 | 490 | 87.66 |
| අධ්‍යාපනික, පුහුණු ආයතන සහ පර්යේෂණ සංවිධාන | 1 | 111 | 0 | 111.00 | 3.04 | 24 | 4.29 |
| ආනයන/ අපනයන වෙළඳ මධ්‍යස්ථාන සහ මිලදී ගැනීමේ කාර්යාල | 4 | 665 | 0 | 664.50 | 18.19 | 220 | 39.36 |
| හෝටල්, ආපනශාලා සේවය සහ විනෝදාංශ සංකීර්ණ | 3 | 131 | 35 | 165.25 | 4.52 | 41 | 7.33 |
| නිවාස සහ දේපළ සංවර්ධනය | 1 | 110 | 0 | 110.00 | 3.01 | 50 | 8.94 |
| ආයෝජන රැඳවුම් සමාගම | 7 | 1,277 | 1,100 | 2377.30 | 65.09 | 81 | 14.49 |
| තොරතුරු තාක්ෂණ පහසුකම් සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා | 1 | 9 | 0.00 | 8.88 | 0.24 | 15 | 2.68 |
| කළමනාකරණ උපදේශන ව්‍යාපාර ස්ථාන | 1 | 55 | 0 | 55.00 | 1.51 | 25 | 4.47 |
| ආපනශාලා සහ ආගන්තුක නිවාස | 1 | 6 | 1.14 | 6.84 | 0.19 | 34 | 6.08 |
| **මුළු එකතුව** | 22 | 2,517 | 1,136 | 3,652 | 100.00 | 559 | 100.00 |

* තාවකාලික

සටහන - අවලංගු කිරීම ඇතුළත්ය

මූලාශ්‍රය - කළමනාකරණ තොරතුරු පද්ධතිය, ආයෝජන මණ්ඩලය (2012 මාර්තු 1)

# ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය

**ප්‍රධාන කාර්යාලය (ලෝ.වෙ.ම. කාර්යාලය)**
05, 08, 09, 19, 24, 25 සහ 26 මහල්
බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
තැ.පෙ. 1768, ඇචිලන් චතුරස්‍රය,
කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2434403-5, 2435027, 2447531,
2385972-6, 2346131-3
ෆැක්ස් : (+94 11) 2447995, 2430512, 2329795
වි.තැපැල් : infoboi@boi.lk

**ප්‍රධාන කාර්යාලය (එස්.බී.ජේ.එම්. කාර්යාලය)**
නො. 14, සර් බාරොන් ජයතිලක මාවත,
කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන : (+94 11) 2435407-9, 2445779, 2331909
2331910, 2331913
ෆැක්ස් : (+94 11) 2430625, 2399891
වි.තැපැල් : infoboi@boi.lk

**කටුනායක අපනයන සැකසුම් කලාපය**
කටුනායක, ශ්‍රී ලංකාව.
දුරකථන : (+94 11) 2252364-5, 2252140, 2252038, 4833737,
4833741, 4833774, 4833779, 4833817-19
ෆැක්ස් : (+94 11) 2253207
වි.තැපැල් : kepz@boi.lk

**බියගම අපනයන සැකසුම් කලාපය**
බියගම, ශ්‍රී ලංකාව.
දුරකථන : (+94 11) 2465206-09
ෆැක්ස් : (+94 11) 2465227
වි.තැපැල් : bpz@boi.lk

**හොරණ අපනයන සැකසුම් කලාපය**
පෝරුවදණ්ඩ, හොරණ, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 34) 2269296, 2269752
ෆැක්ස් : (+94 34) 2255687, 2258029
වි.තැපැල් : hepz@boi.lk

**මීරිගම අපනයන සැකසුම් කලාපය**
මහයායවත්ත, ලෝලුවගොඩ, මීරිගම, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2274657
ෆැක්ස් : (+94 33) 2274657
වි.තැපැල් : mepz@boi.lk

**වතුපිටිවල අපනයන සැකසුම් කලාපය**
වතුපිටිවල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2281381, 2281604
ෆැක්ස් : (+94 33) 2282364
වි.තැපැල් : wepz@boi.lk

**මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය**
තිහාරිය, නිට්ටඹුව ශ්‍රී ලංකාව
දුරකථන : (+94 33) 2288826, 2296166
ෆැක්ස් : (+94 33) 2288826
වි.තැපැල් : mepp@boi.lk

**සීතාවක අපනයන සැකසුම් කලාපය**
අවිස්සාවේල්ල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 36) 2233580
ෆැක්ස් : (+94 36) 2231083
වි.තැපැල් : sip@boi.lk

**දකුණු ප්‍රාදේශීය කාර්යාලය**
කොග්ගල අපනයන සැකසුම් කලාපය
කොග්ගල, හබරාදූව, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 91) 2283425
ෆැක්ස් : (+94 91) 2283370
වි.තැපැල් : kgepz@boi.lk

**මධ්‍යම ප්‍රාදේශීය කාර්යාලය**
මහනුවර කර්මාන්ත උද්‍යානය, පල්ලේකැලේ, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 81) 2420019, 2420025, 2423662, 2423994
ෆැක්ස් : (+94 81) 2420091, 2423995
වි.තැපැල් : kip@boi.lk

**වයඹ ප්‍රාදේශීය කාර්යාලය**
MAS ෆැබ්‍රික් උද්‍යානය, කුරුණෑගල පාර, තුල්හිරිය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2277037-38
ෆැක්ස් : (+94 37) 2277036
වි.තැපැල් : nwro@boi.lk

**පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය**
සෙරපිස් වතුයාය, පොල්ගහවෙල, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2244657
ෆැක්ස් : (+94 37) 2244657
වි.තැපැල් : pwepz@boi.lk

**මාවතගම අපනයන සැකසුම් කලාපය**
ඩයින්වර් වතුයාය, මාවතගම, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 37) 2298147
ෆැක්ස් : (+94 37) 2296041
වි.තැපැල් : mwepz@boi.lk

**මධ්‍යම සෝදිසි පර්යන්තය**
සිලෝන් ෂිපිං ලයින්ස් අංගනය
අංක 70, අවිස්සාවේල්ල පාර, ඕරුගොඩවත්ත, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2547485, 4411590, 4978969
ෆැක්ස් : (+94 11) 2547485, 4411592

**ගුවන් භාණ්ඩ සෝදිසි ඒකකය**
බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළ, කටුනායක,
ශ්‍රී ලංකාව
දුරකථන : (+94 11) 2252155, 4833834, 2265183
ෆැක්ස් : (+94 11) 2252155

**ආයෝජන මණ්ඩලයේ විශේෂ ආර්ථික කලාපය - ත්‍රිකුණාමලය**
ප්‍රීමා කම්හල් පාර, චයිනා බේ, ත්‍රිකුණාමලය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 26) 2233003
ෆැක්ස් : (+94 26) 2233002

**ආයෝජන මණ්ඩලයේ මිරිජ්ජවිල කාර්මික උද්‍යානය, මිරිජ්ජවිල**
හම්බන්තොට, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 47) 2221596

**හම්බන්තොට කලාපීය කාර්යාලය**
අංක 90, අළුත් පාර, හම්බන්තොට, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 47) 2222028
ෆැක්ස් : (+94 47) 2222028

**යාපනය කලාපීය කාර්යාලය**
නිවාස ලේකම් කාර්යාලය, මහනුවර පාර, යාපනය, ශ්‍රී ලංකාව
දුරකථන : (+94 21) 2221336, 3207371
ෆැක්ස් : (+94 21) 2221336

BOI
SRI LANKA

Level 26, West Tower, World Trade Centre.
Echelon Square, Colombo 01, Sri Lanka.
Tel : (94) 11 2434403-5, 2435027, 2447531, 2385972-6, 2346131-3,
Fax : (94) 11 2447995, 2329795,
E-mail : infoboi@boi.lk, Website : www.investsrilanka.com